රාජ්‍ය දැව සංස්ථාව



# වාර්ෂික වාර්තාව

2017

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

# රාජ්‍ය දැව සංස්ථාව

## වාර්ෂික වාර්තාව 2017

දැව වෙළෙඳපොළෙහි සැබෑ නායකත්වය

# අපේ හෙට දින

## දැක්ම

ජාතියේ විශ්වාසනීයත්වය දිනූ අනර්ඝතම දැව හා දැවමය භාණ්ඩ සැපයුම්කරුවීම සහ දැව වෙළෙඳ පොළෙහි සැබෑ නායකත්වය ඉසිලීම.

## මෙහෙවර

අප සතු තාක්ෂණික දැනුම, කීර්තිනාමය හා නිපුනතාවය
උපයෝගී කරගනිමින් නීත්‍යානුකූලව,
පරිසර හිතකාමී අන්දමින් ජාතික අවශ්‍යතාවය අනුව
අපගේ ගැනුම්කරුවන්ගේ දැව සහ දැවමය භාණ්ඩ
ඉල්ලීම නිෂ්පාදනය කර ලබාදීම.



දැව හා දැවමය භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ
ප්‍රමුඛස්ථානයේ වැජබෙන රාජ්‍ය දැව සංස්ථාව
ශ්‍රී ලාංකීය උන්නතිය හා අභිවෘර්ධිය වෙනුවෙන්
වසර 49 ක ගමන් මඟ ඔස්සේ
අදටත් එදා මෙන් නොසැලී ඉදිරියට . .

ගෙවීගිය කාලය පුරාවට විවිධ හැලහැප්පීම්,
බාධක හමුවේ අපි ඔබ සමග අත්වැල් බැඳගත්තෙමු.

ඔබේ සිතැඟි පරිදි භාණ්ඩ හා සේවා උසස් ප්‍රමිතියෙන් යුතුව සැපයීම,
ජාතික මෙහෙවරක් සේ සලකා රටේ සංවර්ධනයට උරදීම
අරමුණු පෙරදැරිව සිටින්නෙමු.

# පටුන


| | |
|---|---|
| ආරම්භය සහ අද අපි | 5 |
| මූල්‍ය ප්‍රකාශන උද්ධෘත | 6 - 7 |
| ආයතනික තොරතුරු | 8 |
| කළමනාකරණ මඬුල්ල | 9 - 11 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 14 - 16 |
| සම්මාන හා ගෞරව | 17 |
| සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය | 18 - 19 |
| අපගේ කාර්යභාරයන් හා අපගේ ව්‍යාපාරික වටිනාකම් | 20 - 21 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 22 - 23 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මඬුල්ල | 24 - 25 |
| අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය | 28 - 32 |
| අපගේ ආවරණ කළාප | 33 - 37 |
| විගණන හා කළමණාකරණ කමිටු වාර්තාව | 38 |
| ව්‍යාපාරික සාරාංශය | 39 - 41 |
| දශකයක තොරතුරු | 44 |
| ජාතික ආර්ථිකයට දායකත්වය | 45 |
| ආයතනික සමාජීය වගකීම | 48 - 49 |
| අවදානම් කළමනාකරණය | 50 - 53 |
| විගණකාධිපති වාර්තාව | 56 - 73 |
| වාර්ෂික ගිණුම් | 74 - 97 |
| පාරිභාෂික ශබ්ද මාලාව | 98 |


## ආරම්භය...

රාජ්‍ය දැව සංස්ථාව රජය සතු ව්‍යාපාරයකි. එය 1968 වර්ෂයේ දී ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ගරු අමාත්‍යතුමන් විසින් 1957 අංක 49 දරන රජයේ කාර්මික සංස්ථා පනතේ බලතල ප්‍රකාරව පිහිටුවන ලද අතර, 1969 නොවැම්බර් 7 දිනැති අංක 14,879 දරණ ගැසට් පත්‍රය, 1982 පෙබරවාරි 05 දිනැති අංක:178/10 අති විශේෂ ගැසට් නිවේදනය, 2001 වර්ෂයේ ජුනි 26 දිනැති අංක 1190/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රය සහ 2008 පෙබරවාරි 25 දිනැති අංක 1538/7 දරණ ගැසට් පත්‍ර අනුව අනුව තවදුරටත් සංශෝධනය කොට යාවත්කාලීන කරන ලදී. යෙදවූ මූලික ප්‍රාග්ධනය රු.මිලියන 2.5කි.


## අද අපි...


ප්‍රධාන කාර්යාලය බත්තරමුල්ල "සම්පත්පාය" පරිශ්‍රයෙහි පිහිටුවා ඇති අතර, ප්‍රාදේශීය ඒකක උප කාර්යාල දීප ව්‍යාප්තව ස්ථානගත කර ඇත. රාජ්‍ය දැව සංස්ථාවේ මූලික ආදායම් ප්‍රභවය දැව හා දැවමය නිෂ්පාදන අලෙවිය වන අතර, තිරසාර අස්වැන්නක් උදෙසා රාජ්‍ය දැව සංස්ථාව, වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව තිරසාර වනාන්තර වැඩසටහන් ක්‍රමය ක්‍රියාවට නංවනු ලබයි.


ඉතා උසස් තත්වයේ දැව නිෂ්පාදන හා විශිෂ්ඨ සේවාවක් සැපයීමට අප නිරතුරු උත්සුක වන අතර ඉකුත් වසර 49 ක් මුළුල්ලේ රාජ්‍ය දැව සංස්ථාව දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ ඉහළින් වැජඹීමට මෙය හේතු සාධක වූ අතර, ඉහළ ශ්‍රේණියේ නිෂ්පාදන ඇගයීමේදී අපගේ නිෂ්පාදන පිළිගත් සාධනීය සලකුණක් ලෙස භාවිතයට පත්ව ඇත.


# මූල්‍ය ප්‍රකාශන උද්ධෘත


| දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා | | 2017 | 2016 | වෙනස % |
|---|---|---|---|---|
| **ඉපැයීම් සම්බන්ධ ප්‍රධාන දත්ත සහ අනුපාත** | | | | |
| අයභාරය | රු. '000 | 4,253,774 | 4,213,956 | 1% |
| භාණ්ඩාගාර හා ආදායම් බදුවලට පෙර ලාභය | රු. '000 | 966,804 | 659,732 | 47% |
| භාණ්ඩාගාරයට ගෙවූ බදු | රු. '000 | 100,000 | 175,000 | -43% |
| ආදායම් බදු | රු. '000 | 301,063 | 398,053 | -24% |
| වර්ෂය සඳහා විස්තීරණ ආදායම් | රු. '000 | 242,328 | 35,276 | 587% |
| ස්කන්ධය මත ඉපැයීම් | % | 5.7 | 0.9 | 548% |
| වත්කම් මත ඉපැයීම් | % | 3.8 | 0.7 | 486% |
| | | | | |
| **ශේෂ පත්‍ර සම්බන්ධ ප්‍රධාන දත්ත සහ අනුපාත** | | | | |
| මුළු වත්කම් | රු. '000 | 6,317,702 | 5,384,826 | 17% |
| මුළු ස්කන්ධය | රු. '000 | 4,230,694 | 3,988,297 | 6% |
| මුළු ණයහිමියන් | රු. '000 | 2,087,008 | 1,396,460 | 49% |
| ණය/ස්කන්ධ | % | 49 | 35 | 41% |
| ණය/මුළු වත්කම් | % | 33 | 26 | 27% |
| | | | | |
| **වෙනත් තොරතුරු** | | | | |
| මුළු සේවකයන් | සංඛ්‍යාව | 2,083 | 2,125 | -2% |
| එක් සේවකයකුට අයභාරය | රු. '000 | 2,042 | 1,983 | 3% |
| එක් සේවකයකුට ලාභය | රු. '000 | 464 | 310 | 49% |



# ආයතනික තොරතුරු - 2017

| | |
|---|---|
| අතිගරු මෛත්‍රීපාල සිරිසේන මහතා | - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමා |
| ඩී.එම්.ඒ.එල්.පී.ජයරත්න මහතා | - මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා |
| අනුර දිසානායක මහතා | - ලේකම්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශය |

**අධ්‍යක්ෂ මණ්ඩලය - 2017**

| | |
|---|---|
| පී. දිසානායක මහතා | - සභාපති - රාජ්‍ය දැව සංස්ථාව. |
| එච්.වයි.ටී. පවරකුමාර මහතා | - ක්‍රියාකාරී අධ්‍යක්ෂ - රාජ්‍ය දැව සංස්ථාව. |
| ඩී. විජේසිරිවර්ධන මහතා | - අධ්‍යක්ෂක (භාණ්ඩාගාර නියෝජිත) |
| එස්.ඒ.ඒ. සතුරුසිංහ මහතා | - අධ්‍යක්ෂක (වන සංරක්ෂණ ජනරාල්) |
| එම්.වී. කරුණාරත්න මහතා | - අධ්‍යක්ෂක |
| පී. පන්සලවත්ත මහතා | - අධ්‍යක්ෂක |
| ඒ.එම්.සී. පෙරේරා මහතා | - අධ්‍යක්ෂක |
| එච්.පී.එස්. නවරත්න මහතා | - සාමාන්‍යාධිකාරී, රාජ්‍ය දැව සංස්ථාව |

**විගණන හා කළමනාකරණ කමිටුව**

| | |
|---|---|
| ඩී. විජේසිරිවර්ධන මහතා | - කමිටු සභාපති |
| එස්.ඒ.ඒ. සතුරුසිංහ මහතා | - කමිටු සාමාජික |
| එම්.වී. කරුණාරත්න මහතා | - කමිටු සාමාජික |

**විගණක**

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.

**ප්‍රධාන කාර්යාලය (ලියාපදිංචි ලිපිනය)**

82, ''සම්පත්පාය'', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල. ශ්‍රී ලංකා.

**ප්‍රධාන බැංකුව**

ලංකා බැංකුව

**මුදල් වර්ෂය**

ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 වන දින දක්වා

| | |
|---|---|
| දුරකථන | : +94 11 2 866 600-5 |
| ෆැක්ස් | : +94 11 2 866 623 |
| වෙබ් අඩවිය | : www.timco.lk |



# කළමනාකරණ මඩුල්ල - 2017

| | | |
|---|---|---|
| සාමාන්‍යාධිකාරී (වැ.බ) | එච්.පී.එස්.නවරත්න | M.Sc. (Forestry), PgD in Forestry for Rural Mgt. (Netherland), B.Sc. |
| **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරින්** | | |
| නි.සාමාන්‍යාධිකාරී (පර්යේෂණ, පුහුණු හා සංවර්ධන) | ආචාර්ය එන්.රුවන්පතිරණ | PhD (Forestry) M.Sc. (Forestry), B.Sc. |
| නි.සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) | ඩබ්.ඩබ්.එම්.ජේ.කුරේ | FCA |
| නි.සාමාන්‍යාධිකාරී (මුදල්) | ජී.ඩී.එස්.කුමාරසිංහ | MBA, B.Sc(Acct.Fin.Mgr), ACA, ACMA |
| නි.සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) | එච්.පී.එස්.නවරත්න | M.Sc (Forestry), PgDip in Forestry for Rural Mgt (Netherland), B.Sc. |
| නි.සාමාන්‍යාධිකාරී (අලෙවි) | ජී.ගුණවංශ | BA. (Sp), Dip in Forestry |
| නි.සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) | එම්.ඒ.සී.එන්.සමරසිංහ | MPM, B.Sc (Business studies) Ad.Dip in Mgt. and Admin. |
| **සහකාර සාමාන්‍යාධිකාරී** | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (කලාප) | එම්.සී.දේවේන්ද්‍ර | M.Sc.(Forestry), B.Sc. |
| සහකාර සාමාන්‍යාධිකාරී (වැ.බ) (අලෙවි) | ඩබ්.බී.සමන්ත | M.Sc.(Forestry), B.Sc., National Dip. in Teaching |
| සහකාර සාමාන්‍යාධිකාරී (වැ.බ) (ඉංජිනේරු හා නිෂ්පාදන) | තිසර ගමගේ | B.Sc. |
| **කළමනාකරුවන්** | | |
| කළමනාකාර (පාලන) | ඒ.ජී.එච්.කුලරත්න | M.LRHRM, PgD.LRHRM, PQHRM, Dip.in Mgt, Dip. in Forestry, Dip.in English, AMCIPM, ACPM |
| කළමනාකාර (මුදල්) | පී.ඩී.ඒ.එම්.ඩී.වික්‍රමසිංහ | Dip. (F.A) |
| කළමනාකාර (මුදල්) | පී.ටී.එන්.බෝවත්ත | |
| කළමනාකාර (මුදල්) | කේ.ඩී.කේ.සී. ද සිල්වා | |
| කළමනාකාර (මුදල්) | එච්.ජී.ආර්.විජේනායක | |
| කළමනාකාර (අභ්‍යන්තර විගණන) | එච්.එම්.එස්.මාධව | B.Com (Sp) |
| කළමනාකාර (යාන්ත්‍රික ඉංජිනේරු) | ඒ.කේ.ලසිත එඩ්මන්ඩ් | B.Sc.(Engineering) |
| කළමනාකාර (මිළදීගැනීම් හා නාවුක) | ටී.අරුණ ද සිල්වා | |

| | | |
|---|---|---|
| කළමනාකාර (තොරතුරු තාක්‍ෂණ) | ඒ.ජී.මාදුවගේ | |
| කළමනාකාර (පර්යේෂණ හා පුහුණු) | සි.කේ.මුතුමාල | M.Sc.(Forestry), B.Sc. (Agri) Hons. |
| කළමනාකාර (විශේෂ ව්‍යාපෘති) | ඒ.එන්.ඩබ්.ඒ.ආනන්ද | |
| කළමනාකාර (ආරක්‍ෂක) | චමින්ද වීරමන් | |
| කළමනාකාර (සිල්පර හා විදුලිකණු) | ඩී.එම්.එන්.පුෂ්පකුමාර නිල්මිණි | B.Sc. |

| **ප්‍රාදේශීය කළමනාකරුවන්** | | |
|---|---|---|
| ප්‍රාදේශීය කළමනාකාර (කොළඹ) | එච්.පී.එස්.දිසානායක | BA |
| ප්‍රාදේශීය කළමනාකාර (මොණරාගල) | ආර්.විජේතුංග | B.Sc. (Agri) (Sp) |
| ප්‍රාදේශීය කළමනාකාර (බණ්ඩාරවෙල) | පී.කේ.අජිත් චන්දන | B.Sc. |
| ප්‍රාදේශීය කළමනාකාර (බූස්ස) | එම්.ඩී.සී.සම්පත් | BA |
| ප්‍රාදේශීය කළමනාකාර (ප්‍ර.කා) | ඩබ්.කීර්තිරෝයි | |
| ප්‍රාදේශීය කළමනාකාර (අම්පාර) | එම්.කේ.ජී.වසන්තරාජ් | |
| ප්‍රාදේශීය කළමනාකාර (අනුරාධපුර) | එච්.එල්.නන්දන | B.Sc. |
| ප්‍රාදේශීය කළමනාකාර (කල්දෙමුල්ල) | යූ.එස්.එම්.ප්‍රනාන්දු | BA (Sp) |
| ප්‍රාදේශීය කළමනාකාර (ප්‍ර.කාර්යාලය) | වයි.බී.එම්.අමීර් | Dip. in Forestry |
| ප්‍රාදේශීය කළමනාකාර (රත්නපුර) | ඩී.එච්.රාජපක්ෂ | M.Sc.(Forestry), B.Sc |
| ප්‍රාදේශීය කළමනාකාර (නුවරඑළිය) | එච්.බී.රජවත්ත | B.A |
| ප්‍රාදේශීය කළමනාකාර (ප්‍ර.කාර්යාලය) | යූ.පී.එච්.උළුවඩුගේ | B.Sc. |
| ප්‍රාදේශීය කළමනාකාර (නුවර) | ඊ.එම්.එස්.ඒකනායක | |
| ප්‍රදේශීය කළමනාකාර (යාපනය) | එස්. ස්කන්ධරාජා | |
| ප්‍රාදේශීය කළමනාකාර (කුරුණෑගල) | ඒ.එස්.විජේසුන්දර | |
| ප්‍රාදේශීය කළමනාකාර (මාතර) | ඩබ්.අයි.සාරංග | B.Sc (Hons) |
| ප්‍රාදේශීය කළමනාකාර (කැප්පෙටිපොල) | ඒ.බී.එම්.වීරසිංහ | BA |

| **නියෝජ්‍ය කළමනාකරුවන්** | | |
|---|---|---|
| නියෝජ්‍ය කළමනාකාර (නීති) | කේ.අයි.ඩී.පී.කාරියවසම් | LLB.Attorney at Low |
| නියෝජ්‍ය කළමනාකාර (නිර්මාණ හා තත්ව පාලක) | ඊ.එම්.එම්.ප්‍රනාන්දු | |
| පද්ධති විශ්ලේෂක | ඩබ්.එච්.ඒ.චන්ද්‍රකුමාර | B.Sc. |
| | ජේ.එම්.එම්.බී.ජයසුන්දර | B.Sc.(Sp) Hons. |



| | | |
|---|---|---|
| නියෝජ්‍ය කළමනාකාර(මානව සම්පත්) | කේ.ඒ.ආනන්ද තිලකසිරි | |
| | එච්.පී.පෙරේරා | |
| නියෝජ්‍ය කළමනාකාර(මුදල්) | යූ.එස්.මඩවල | |
| | එච්.එම්.පී.බී. හේරත් | |

| **නියෝජ්‍ය ප්‍රාදේශීය කළමනාකරුවන්** | | |
|---|---|---|
| නි.ප්‍රාදේශීය කළමනාකාර (කල්දෙමුල්ල) | සුනිල් ජයරත්න | |
| නි.ප්‍රාදේශීය කළමනාකාර (මින්නේරිය) | එල්.එස්.ජයසේකර | |
| නි.ප්‍රාදේශීය කළමනාකාර (ප්‍ර.කාර්යාලය) | ඩී.ඒ.හෙන්දාවිතාරණ | |
| නි.ප්‍රාදේශීය කළමනාකාර (නුවර) | ආර්.සී.සමන් කුමාර | |
| නි.ප්‍රාදේශීය කළමනාකාර (මින්නේරිය) | දුමින්ද නවරත්න | BA |
| නි.ප්‍රාදේශීය කළමනාකාර (යාපනය) | ටී.පී.රමේෂ් | |
| නි.ප්‍රාදේශීය කළමනාකාර (රත්නපුර) | එච්.ඒ.ගාමිණි අල්විස් | |
| නි.ප්‍රාදේශීය කළමනාකාර (මාතලේ) | ඩී.එල්.අබේනායක | |
| නි.ප්‍රදේශීය කළමනාකාර (මොණරාගල) | එස්.සී.ජයමාන්න | B.Sc |



# තේක්ක

තේක්ක ගස නිවර්තන කලාපීය දේශගුණයේ ඉතා වටිනා තද දැව ලබාගත හැකි ශාක (Hard wood) අතර ප්‍රමුඛස්ථානයක් ගන්නා ගසකි. තේක්ක ගස දකුණු සහ ගිණිකොණ ආසියාවේ ප්‍රධාන වශයෙන් ඉන්දියාව, පකිස්ථානය, බංගලාදේශය, බුරුමය, තායිලන්තය, ශ්‍රී ලංකාවේ වනාන්තරව. හා ගෙවතුවල දැකගත හැකිය. තේක්ක ශාකය ශ්‍රී ලංකාවට ඉන්දියාවෙන් හඳුන්වාදුන් ශාකයකි. තේක්ක විශේෂ 03 ක් හඳුනා ගත හැකිය. 01. Tectona grandis (සාමාන්‍ය තේක්ක) 02.Tectona hamiltoniana (බුරුමයේ ඒක දේශීය තර්ජිත ශාකයකි) 03. Tectona philippineìis (පිලිපීනයේ ඒක දේශීය තර්ජිත ශාකයකි). ඉන්දියාවේ වසර 2000 කට වඩා පැරණි Salsette පන්සල් ඉදිකිරීම සඳහා භාවිතා කළ තේක්ක දැව අද වන විට ද ඉතා හොඳ තත්වයේ පවතින බව වාර්තා වේ. 1786 - 1825 වර්ෂවල දී යුරෝපයේ නැව් නිෂ්පාදනයට බුරුමයේ රැන්ගුන් ප්‍රදේශයේ තේක්ක යොදාගන්නා ලදී. එබැවින් බුරුම තේක්ක වලට රැන්ගුන් තේක්ක ලෙස නමක් පටබැඳී ඇත. ශ්‍රී ලංකාවේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට යටත්ව තේක්ක වනවගා හෙක්ටයාර් 30000 පමණ ඇති අතර, ශ්‍රී ලංකාවේ වියළි සහ අතරමැදි කලාපයේ ගෙවතුවල ද තේක්ක වගා කරමින් පවතී. රාජ්‍ය දැව සංස්ථාව විසින් වාර්ෂිකව ඝණ මීටර 35000 ක් පමණ තේක්ක දැව නිෂ්පාදනයක් සිදුකරයි.

*උපුටාගැනීම*

**ශ්‍රී ලංකාවේ දැව ශාක**

ආචාර්ය නිමල් රුවන්පතිරණ



# සභාපතිතුමාගේ සමාලෝචනය

> ❝ වන විනාශය අද පවත්නා දැවැන්ත පාරිසරික අර්බුදයකි. දැව හා දැවමය භාණ්ඩ සඳහා ඇති ඉහළ ඉල්ලුම හේතුවෙන් නීත්‍යානුකූල නොවන අයුරින් වනවිනාශය සිදුකිරීමට පෙළඹී ඇති වකවානුවක නියමාකාරයේ වනකළමනාකරණයක් තුළින් පමණක් වන සම්පත අනාගත පරපුරේ පරිභෝජනය සඳහා රැකගත හැකිවේ. තිරසාර දැව අස්වනු හෙලීම තුලින් වන විනාශය අවම කළ හැක.❞

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන එළිදක්වන්නේ හදපිරි සතුටිනි. දශක පහකට ආසන්න සේවා ඉතිහාසය පුරාවට රාජ්‍ය දැව සංස්ථාව ජාතියේ විශ්වාසනීයත්වය දිනූ අනර්ඝතම දැව හා දැවමය භාණ්ඩ සැපයුම්කරු ලෙස පුරෝගාමී නායකත්වයක් උසුලනු ලබයි. පුළුල් කරන ලද මෙහෙයුම් ජාලය හා අප සතුව පවතින ප්‍රාදේශීය කාර්යාල 12ක්, අලෙවි මධ්‍යස්ථාන 51ක් හා 200කට අධික දැව හෙළීම් සිදුකරන ක්‍රියාකාරී වැඩබිම් සහ දැව පදම්කිරීමේ හා පරිරක්ෂණය කිරීමේ යන්ත්‍රාගාර වලින් සමන්විත ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාර 03ක් රාජ්‍ය දැව සංස්ථාව ජාතියේ විශාලතම දැව නිෂ්පාදන ජාලයේ හිමිකරු බවට තහවුරු කර ඇත. පෙර වර්ෂය මෙන්ම 2017 වර්ෂයේදීත්, අභියෝග රැසකට මුහුණපෑමට සිදුවීමත්, රාජ්‍ය ප්‍රතිපත්ති හා තීරණ හමුවේ රාජ්‍ය දැව සංස්ථාවේ ඉදිරි ගමන්මග නවමු අත්දැකීම් රැසක් ඔස්සේ වෙනස් පරිචයක් කරා පියමන් කිරීමටත් හැකි විය. මෙවැනි පසුබිමක් තුළදීත් නිෂ්පාදනය, අලෙවි හා මූල්‍ය යන අංශ ශක්තිමත් කරමින් ඊට සමගාමීව නව තාක්ෂණය හා නව උපාය මාර්ග හඳුන්වාදීම තුලින් ඉතා සාර්ථකව මෙම වර්ෂය අවසන් කිරීමට අපට හැකියාව ලැබුණි.

ශ්‍රී ලංකාව 2016 දී ළඟාකරගත් 4.5% ක ආර්ථික වර්ධනයට සාපේක්ෂව රාජ්‍ය ප්‍රතිපත්ති, කාලගුණික විපර්යාස සහ විදේශීය අභියෝග හමුවේ 2017 වසරේදී ආර්ථික වර්ධනය 3.1% ක් ලෙස පෙන්නුම් කරන ලදී. දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික, කාර්මික සහ සේවා අංශවල දායකත්වය පිළිවෙලින් 6.9% ක්, 26.8% ක්, සහ 56.8% ක් වශයෙන් වාර්තා කළ අතර, කාර්මික සහ සේවා ක්ෂේත්‍රයන්හි පිළිවෙලින් 3.9% සහ 3.2% ක වර්ධනයක් දක්නට වූ අතර, පැවති අයහපත් කාලගුණ තත්වය හමුවේ කෘෂිකාර්මික අංශය 0.8% කින් පසුබෑමකට ලක්විය. රාජ්‍ය අංශය ගත් කළ රාජ්‍ය සේවකයින්ගේ ආදායම ඉහළයෑම හේතුවෙන් දේශීය පරිභෝජනයේ වෙනසක් ඇති කිරීමට සමත් විය. ලෝක ආර්ථිකයේ මන්දගාමී වර්ධනය දේශීය ආර්ථිකය කෙරෙහි ද බලපෑම් එල්ලකිරීමට සමත් විය. උද්ධමනය ස්ථාවර මට්ටමක පවත්වා ගනිමින් ආර්ථික වර්ධනයක් කරා ගමන් කිරීමේ අභියෝගය හමුවේ සාර්ථකව මුහුණදීමට හැකි විය. මෙසේ ශ්‍රී ලංකා ආර්ථිකය පැවති තත්වය තුළ රාජ්‍ය දැවසංස්ථාව 2017 වර්ෂය අභියෝග හමුවේ සාර්ථකව තම ව්‍යාපාරික කටයුතු මෙහෙයවන ලදී.

රාජ්‍ය දැව සංසංථාවේ කාර්ය සාධනයට ප්‍රබලව බලපාන සාධක අතර වන කළමනාකරණය පිළිබඳ ආර්ථික, සමාජීය, දේශපා.නික සහ ජීව විIත්මක පසුබිම තේරුම් ගැනීමත්, එම අංශ සමබර කරගැනීමත් අවදානම් සහිත සහ අභියෝගාත්මක වුවද විධිමත් කළමනාකරණයක් තුලින් අනාගත දැව සැපයීම ස්ථාවර මට්ටමක පවත්වා ගත හැක. වෙනත් භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම මෙන් නොව දැව භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම ආර්ථිකය මෙන් ම පරිසරය සමඟ සංවේදී වේ. එමනිසා අමුද්‍රව්‍යවල හිඟතාව හා අධික පිරිවැය නිසා රාජ්‍ය දැව සංස්ථාව ලාභදායීත්වය පිළිබඳ අභියෝගතාවයන්ට මුහුණ පෑමට සිදුවිය.

වන විනාශය අද පවත්නා දැවැන්ත පාරිසරික අර්බුදයකි. දැව හා දැවමය භාණ්ඩ සඳහා ඇති ඉහළ ඉල්ලුම හේතුවෙන් නීත්‍යානුකූල නොවන අයුරින් වනවිනාශය සිදුකිරීමට පෙළඹී ඇති වකවානුවක නියමාකාරයේ වනකළමනාකරණයක් තුළින් පමණක් වන සම්පත අනාගත පරපුරේ පරිභෝජනය සඳහා රැකගත හැකිවේ. තිරසාර දැව අස්වනු හෙලීම තුලින් වන විනාශය අවම කළ හැක. එනම්, දැව අස්වනු හෙළීමේදී වනවගා භූමියේ නිෂ්පාදන හැකියාව ආරක්ෂා වන පරිදි ඉතා ක්‍රමවත්ව හා විද්‍යානුකූලව කටයුතු කිරීමෙන් සහ වයස්ගත ශාක වෙනුවට නව ශාක රෝපණයකොට, නව වනවගා ඇති කිරීමට කටයුතු කිරීම තුලින් සමාජයට දිගුකාලීන ප්‍රතිලාභ සලසාගත හැකිවේ. කෙසේ නමුත් ශාක යනු සදහටම පවතින ජීවයක් නොවේ. කිසියම් මොහොතක පරිණත ශාක දිරාපත්ව ගොස් ඒ වෙනුවට වේගයෙන් වැඩෙන ළදරු ශාක එම භූමිය අනුක්‍රමණය කිරීම තුලින් ස්වභාවිකවම නව ශාක ප්‍රතිස්ථාපනය සිදුවේ. වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිසි කළමනාකරණ සැලැස්මකට අනුව වාර්ෂිකව අපවෙත නිදහස් කරනු ලබන පරිණත වනවගාවන්, නිවැරදි ක්‍රමවේදයන්ට යටත්ව විද්‍යානුකූලව අපතය අවම වන ආකාරයෙන් දැව වලට පරිවර්ථනය කර, එම භූමි නැවත වනවගා කටයුතු සඳහා නිදහස් කිරීම අප ආයතනය මගින් ඉටුකරනු ලබයි.

රාජ්‍ය දැව සංස්ථාව, එහි ක්‍රියාකාරකම් විධිමත් කළමනාකරණය තුලින් ඉතා විශිෂ්ට ප්‍රතිඵල ලබාගැනීමට හා කර්මාන්තයේ අභිවෘද්ධිය සඳහා ද විශාල ලෙස දායකවීමට හැකිවීම අප ලද භාග්‍යයකි. තවදුරටත් තරඟකාරි වාසි ලබාගැනීම, ගුණාත්මක භාවයෙන් ඉහල භාණ්ඩ නිෂ්පාදනය හා පාරිභෝගික තෝරාගැනීම් පරාසය පුළුල් කිරීම යන අරමුණු ඉටුකරගැනීම සඳහා නව මූල්‍ය වර්ෂය තුලදී නව තාක්ෂණික ක්‍රම හඳුන්වා දීමත්, නව වෙළඳපොල උපාය මාර්ග හඳුන්වා දීමත් සඳහා ප්‍රාග්ධන ආයෝජනයන් පුළුල් කිරීමට බලාපොරොත්තු වන අතර, 2017 වර්ෂය සියලු බාධක අභිබවා සාර්ථකව අවසන් කිරීමට අප සමත් විය.

මෙම තත්වය යටතේ, සමාලෝචනයට භාජනය වන වසර සඳහා වාර්තා වූ ආදායම රු.මිලියන 4,254ක් විය. මෙම ආදායම උපයාගැනීම සඳහා වසර තුල හඳුන්වා දුන් නව තාක්ෂණික ක්‍රම හා නව උපාය මාර්ග පිටුවහල් වී ඇත. පසුගිය වසරේ රු.මිලියන 443 ක් වූ මෙහෙයුම් ලාභය මෙම වසරේදී රු.මිලියන 693 ක් වූ අතර, භාණ්ඩාගාර බදු සහ ආදායම් බදු පෙර ශුද්ධ ලාභය 2017 දී රු. මිලියන 967 ක් වූ අතර, 2016 දී රු. මිලියන 660 ක් විය. එය පසුගිය වසරට සාපේක්ෂව 2017 දී 47% ක වර්ධනයකි. භාණ්ඩාගාර බදු සහ ආදායම් බදු පසු ශුද්ධ ලාභය 2016 වර්ෂයේ දී රු.මිලියන 87ක් වූ අතර, 2017 දී රු.මිලියන 567 ක් දක්වා වර්ධනය විය. එමෙන්ම, 2017 වර්ෂය තුලදී රු.මිලියන 2,055 ක ස්කන්ධභාග, මෙහෙයුම් බදු සහ භාණ්ඩාගාරයට ගෙවූ විශේෂ බදු වශයෙන් රාජ්‍ය දැව සංස්ථාව ජාතික ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් සපයා ඇත. එමෙන්ම 2017 වර්ෂය තුළදී රාජ්‍ය දැව සංස්ථාව විසින් සිල්පර අපනයනය මගින් රු.මිලියන 1.1 ක විදේශ විනිමය උපයා ගන්නා ලදී. තවද, ඉහළ යන දැව ඉල්ලුමට පිළියමක් වශයෙන් ඉරුෑදැව ආනයනය කිරීමටත්, උසස් තත්වයේ ඉරුෑදැව ආනයනය තුළින් වෙළෙඳපොළේ පවතින ගුණත්වයෙන් අඩු දැව වර්ග භාවිතයෙන් පාරිභෝගිකයා ආරක්‍ෂා කිරීමේ හැකියාව ලැබුණි. ඉහළ යන දැව ඉල්ලුම සපුරාලීම සඳහා මෘදු දැව කල්පැවැත්මෙන් වැඩි දැව බවට පත් කිරීමට අවශ්‍ය තාක්‍ෂණික හා ශිල්පීය දැනුම රාජ්‍ය දැව සංස්ථාව තුළට ලබාගෙන දැව පරිරක්‍ෂණය තුළින් රටේ වටිනා දැව සම්පත ආරක්‍ෂා කරමින් එම නිෂ්පාදන සඳහා යෝග්‍ය වෙළෙඳපොලක් ඇති කිරීමට අපට හැකි විය. නව යන්ත්‍රසූත්‍ර හා තාක්‍ෂණික ක්‍රම උපයෝගී කරගනිමින් දැව අපතය අවම කිරීමත්, දැව වලින් උපරිම උපයෝජනය ලබාගැනීමට හැකි ක්‍රමවේද හඳුන්වාදීම මගින් තිරසාර සංවර්ධනය කරා රාජ්‍ය දැව සංස්ථාව මංපෙත් එළිපෙහෙළි කරගන්නා ලදී.

සංස්ථාව සතු වටිනාකම සම්පත වන්නේ මානව සම්පත බව අපගේ විශ්වාසයයි. 2017 කාල පරිච්ඡේදය තුලදී පෙර වර්ෂ මෙන් ම අප සංස්ථාව විසින් මානව සම්පත පුහුණු හා වෘත්තිය සංවර්ධන වැඩසටහන් තුලින් කුසලතා හා දක්‍ෂතා වැඩිදියුණු කොට පාරිභෝගිකයන්ට කාර්යක්‍ෂම හා උපරිම සේවයක් සැපයීම මෙන්ම ආයතනයේ ඉලක්ක මුදුන් පමුණුවා ගැනීමේ අරමුණින් කටයුතු කරන ලදී. 2017 වසරේ කාර්යසාධනය වෙනුවෙන් මෙම වසරේදී ජාතික වාණිජ මණ්ඩලය මගින් සංවිධානය කරන ලද ජාතික ව්‍යාපාර විශිෂ්ඨතා සම්මාන උළෙලේ දී රාජ්‍ය අංශයේ නිෂ්පාදන අංශය වෙනුවෙන් රන් සම්මානය ලබාගැනීමට හැකිවීම අප ලද විශේෂ ජයග්‍රහණයකි.

2017 වර්ෂයේ සාමූහිකව ක්‍රියාකිරීමේ ප්‍රතිඵලයක් ලෙස සෑම පැතිකඩකම පාලන ප්‍රමිතීන් හා ව්‍යාපාර භාවිතයන් වැඩිදියුණු කිරීමට හැකියාව ලැබුණු අතර, අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයකට අනුව අනාගත පරපුර වෙනුවෙන් පරිසරය සුරැකීමට රාජ්‍ය දැව සංස්ථාව යටතේ පිහිටුවා ඇති විශේෂ ඒකකය හරහා ක්‍රියාත්මක වන "තුරුජන සිසු බැංකු" වැඩසටහන යටතේ රුක් රෝපණය ශක්තිමත් කිරීම උදෙසා විවිධ වැඩසටහන් සිදුකර ලදී.

ලෝක පරිසර දිනය සංකේතවත් කිරීම සඳහා මාතර, මොණරාගල, බණ්ඩාරවෙල, රත්නපුර සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කවල තෝරාගත් පාසැල් සඳහා කෘෂිකාර්මික උපකරණ ලබාදෙමින් තරුණ පරපුර අතර රුක්රෝපණය ප්‍රචලිත කිරීමත්, මෙයට සමගාමීව විදේශීය ශාක වෙනුවට දේශීය ශාක වගාකිරීම සඳහා පාසැල් දරුවන් යොමුකිරීම සඳහා උනන්දු කරවීමට අපට හැකි විය. මීට අමතරව මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතිය ආශ්‍රිතව කළුවර, මී සහ කුඹුක් පැල වගාකිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. දැව හා දැව නිෂ්පාදන තිරසාර ලෙස පරිභෝජනය කිරීම පිළිබඳ පාසැල් ගුරුවරු දැනුවත් කිරීම සඳහා වැඩසටහන් කිහිපයක් පවත්වන ලද අතර, විවිධ මාතෘකාවන් යටතේ පිළියෙල කරන ලද අත්පත්‍රිකා ද බෙදාහරින ලදී. "වනරෝපා" ජාතික රුක්රෝපණ වැඩසටහන සඳහා ක්‍රියාශීලි දායකත්වයක් සැපයීමට සංස්ථාව සමත් විය. මෙම වැඩසටහන යටතේ පැල සිටුවීමේ වැඩපිළිවෙලක් ඇති කිරීම සඳහා ජනතාව සහ විවිධ ආයතන අතර, පැල 50,000 කට අධික ප්‍රමාණයක් බෙදාදෙන ලදී. පැල සිටුවීම සඳහා තරුණ පරම්පරාවේ උනන්දුව ඉහළ නංවනු වස් පාරිසරික, වනසංරක්ෂණ හා ජෛව විවිධත්වය පිළිබඳ දේශණ මාලාවක් පවත්වන ලදී. 2017 වර්ෂයේදි පර්යේෂණ කිහිපයක් සම්පූර්ණ කිරීමට සංස්ථාව සමත් වූ අතර, එමගින් නව සොයාගැනීම් සමාජගත කිරීමට හැකියාවක් ලැබුණි. ජාතික මෙහෙවරක් ලෙස සලකා පරිසර සංරක්ෂණය සහ සමාජ සුභසාධනය සඳහා විවිධ වැඩසටහන් සංවිධානය කිරීමට අපට හැකි විය. රාජ්‍ය දැව සංස්ථාව නවීන සංවර්ධන යෝජනාක්‍රමවල සාර්ථකත්වය උදෙසා දැවැන්ත දායකත්වයක් ලබාදෙමින් උමා ඔය සහ මොරගහකන්ද වැනි බහුකාර්ය වාරිමාර්ග යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීමට සහය ලබාදෙන ලදී. ජාතික ආර්ථිකයට විශාල දායකත්වයක් ලබාදෙන වගකිව යුතු පුරවැසියකු වශයෙන් "දරිද්‍රතාව දුරලීම" ජාතික වැඩසටහන යටතේ දරිද්‍රතාව තුරන් කිරීම සඳහා අඩු ආදායම්ලාභී වඩුකාර්මිකයන් පුහුණු කිරීමේ වැඩපිළිවෙලක් ආරම්භ කරන ලද අතර, 2017 දී එහි පළමු කණ්ඩායම සිය පුහුණුව අවසන් කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ගරු මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමන් වන අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ද, නියෝජ්‍ය අමාත්‍ය අනුරාධ ජයරත්න මැතිතුමා ද, අමාත්‍යංශ ලේකම්තුමා හා එම කාර්ය මණ්ඩලයටත්, වනසංරක්ෂණ ජෙනරාල්තුමා ඇතුළු එම දෙපාර්තමේන්තුවට අනුයුක්ත සියලුම කාර්ය මණ්ඩලයටත්, අනෙකුත් සියලුම රජයේ නිලධාරීන්ටත් අපහට ලබාදුන් ඉමහත් සහයෝගය වෙනුවෙන් කෘතවේදීත්වය පුද කරමි. විවිධ දුෂ්කරතා හා අභියෝග හමුවේ අපගේ සාමාන්‍යාධිකාරිතුමා ඇතුළු සේවක මණ්ඩලය ඔවුන්ගේ ශක්තිය කැපවීම හා උපාය කෞශල්‍ය අඛණ්ඩව යොදමින් සංස්ථාවේ කාර්යසාධනය ඉහළ තලයකට නංවාලීමට ගත් ප්‍රසංශනීය කාර්යභාරය වෙනුවෙන් මාගේ විශේෂ ස්තූතිය ඔවුන් හට ද පුදකර සිටිමි.

2018 නව වර්ෂය අභියෝගාත්මක හා තීරණාත්මක සංවර්ධන ඉලක්ක කරා පියනැඟිය හැකි නව වසරක් ලෙස අපි සැලසුම් කර ඇති අතර, කෙටිකාලීන අභියෝග හමුවේ නොසැලී නිරතුරුවම අපේක්ෂිත ඉලක්ක ලඟාකර ගැනීම උදෙසා අපගේ හැකියාවන් උපරිමයෙන් යොදාගනිමින් විශිෂ්ට ප්‍රතිඵල අත්කරගැනීම පිණිස ඇපකැප වී සිටින්නෙමු.

**පී. දිසානායක**
සභාපති
රාජ්‍ය දැව සංස්ථාව



## විශිෂ්ඨ කැපවීම නිසා අප සම්මානයට පාත්‍ර වූ වගයි

ජාතික වාණිජ මණ්ඩලය මඟින් පැවරත් වූ 2017 ජාතික ව්‍යාපාර විශිෂ්ඨත්ව සම්මාන උළලේදී රාජ්‍ය දැව සංස්ථාව රාජ්‍ය අංශයේ නිෂ්පාදන වෙනුවෙන් පිදෙන රන් සම්මානයෙන් පිදුම් ලබන ලදී.





2009


2010


2011


2009 2010 2011

ජාතික වාණිජ මණ්ඩලය පිරිණමන රන් සම්මානයෙන් අඛණ්ඩව 2009, 2010 සහ 2011 වසර තුළදී රාජ්‍ය දැව සංස්ථාව පිදුම් ලබන ලදී.




ජාතික වාණිජ මණ්ඩලය මඟින් පැවරත් වූ 2016 ජාතික ව්‍යාපාර විශිෂ්ඨත්ව සම්මාන උළලේදී රාජ්‍ය දැව සංස්ථාව රාජ්‍ය අංශයේ නිෂ්පාදන වෙනුවෙන් පිදෙන රන් සම්මානයෙන් පිදුම් ලබන ලදී.



ජාතික වාණිජ මණ්ඩලය මඟින් 2014 දී පැවැත්වූ ජාතික ව්‍යාපාර විශිෂ්ඨත්ව සම්මාන උළලේදී රාජ්‍ය අංශයේ නිෂ්පාදන ආයතන අතරින් නිෂ්පාදනය වෙනුවෙන් රිදී සම්මානයෙන් පිදුම් ලබන ලදී.


2012



2013

ජාතික වාණිජ මණ්ඩලය මඟින් 2012 සහ 2013 දී පැවැත්වූ ජාතික ව්‍යාපාර විශිෂ්ඨත්ව සම්මාන උළලේදී රාජ්‍ය අංශයේ නිෂ්පාදන ආයතන අතරින් නිෂ්පාදනය වෙනුවෙන් කුසලතා සම්මාන හිමි කර ගන්නා ලදී.



- හරිත මැකෝ සම්මානය 2008 - ශ්‍රී ලංකා ජනමාධ්‍ය සංගමය
- වන හා පරිසර අධ්‍යාපනයට වූ දායකත්වය වෙනුවෙන් සම්භාවනා හා ඇගයීම් මැකෝ සම්මානය 2010
- 2009 "දැයට කිරුළ" ප්‍රදර්ශනයේ වඩාත් නිර්මාණශීලී ප්‍රදර්ශන කුටිය



# සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය

> *"2017 වර්ෂය තුළදී වාර්ෂික ශුද්ධ පිරිවැටුම රුපියල් මිලියන 4,254 ක් වූ අතර, පෙර වර්ෂයට සාපේක්ෂව වාර්ෂික ශුද්ධ පිරිවැටුම වර්ධනය කිරීමට සංස්ථාව සමත් විය. කෙසේ වෙතත්, පසුගිය වසරට සාපේක්ෂව ආදායම් බදු හා භාණ්ඩාගාර බදු පෙර ලාභය රුපියල් මිලියන 660 සිට රුපියල් මිලියන 967 දක්වා වැඩිවී ඇති අතර, ජාතික ආර්ථිකයට දායක වී ඇති මුදල රුපියල් මිලියන 2,055 කි."*

රාජ්‍ය දැව සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව හා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳ මා ඉමහත් සතුටට පත්වන අතර, වාණිජ මෙහෙයුම් සම්බන්ධයෙන් වසර 49 ක පළපුරුද්ද සමග 2017 වර්ෂය තුළදීත් පෙර වර්ෂවල මෙන් ම අභියෝග හමුවේ නොසැලී ඉතා සාර්ථකව ජයග්‍රහණය රැසක් සමගින් ඉහළ කාර්යසාධනයක් වාර්තා කිරීමට සමත්විය.

අප විසින් ඉතාමත් අනර්ඝ තත්වයේ දැව හා දැව ආශ්‍රිත භාණ්ඩ නිපදවා, එම භාණ්ඩ සාධාරණ මිලකට සපයන අතර, නිත්‍ය පාරිභෝගිකයන් මෙන්ම නව පරිභෝගිකයන් ද, අපගේ සේවය පිළිබඳ අතිශය තෘප්තිමත් බව කිව යුතුමය. වර්තමානයේ දැව නිෂ්පාදනය සඳහා ලොව පවත්නා නව තාක්ෂණය උපයෝගී කර ගනිමින් දැව හා දැව ආශ්‍රිත භාණ්ඩ සැපයීමෙහි පුරෝගාමියෙකු වශයෙන් දැව නිෂ්පාදන කර්මාන්තය ඔසවා තැබීම සඳහා රාජ්‍ය අංශයේ එකම දැව නිෂ්පාදකයා වශයෙන් රාජ්‍ය දැව සංස්ථාව ඉතා වැදගත් කර්තව්‍යයක් අඛණ්ඩව සිදුකරනු ලබයි. දිවයින පුරා පැතිර ගිය ප්‍රාදේශීය කාර්යාල 12 ක්, අලෙවි මධ්‍යස්ථාන 51ක්, 200කට අධික දැව හෙළීම් සිදුකරන ක්‍රියාකාරී වැඩබිම් හා දැව පදම් කිරීමේ හා පරිරක්ෂණය කිරීමේ යන්ත්‍රාගාර වලින් සමන්විත ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාර 03ක් හා ප්‍රදර්ශණාගාර 06ක් රාජ්‍ය දැව සංස්ථාව සතු වේ.

රාජ්‍ය දැව සංස්ථාව, ජාතික ආර්ථික උපාය මාර්ගයන් හා යෝග්‍ය ආර්ථික ප්‍රතිපත්තිවලට අනුකූලව තිරසාර ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම ඉලක්ක කරගනිමින් 2017 දී එහි අරමුණු හා ප්‍රතිපත්ති පෙළගස්වා ඇත. 2017 වර්ෂය තුළදී වාර්ෂික ශුද්ධ පිරිවැටුම රුපියල් මිලියන 4,254 ක් වූ අතර, පෙර වර්ෂයට සාපේක්ෂව වාර්ෂික ශුද්ධ පිරිවැටුම වර්ධනය කිරීමට සංස්ථාව සමත් විය. කෙසේ වෙතත්, පසුගිය වසරට සාපේක්ෂව ආදායම් බදු හා භාණ්ඩාගාර බදු පෙර ලාභය රුපියල් මිලියන 660 සිට රුපියල් මිලියන 967 දක්වා වැඩිවී ඇති අතර, ජාතික ආර්ථිකයට දායක වී ඇති මුදල රුපියල් මිලියන 2,055 කි. භාණ්ඩාගාරයට ගෙවන ලද රු.මිලියන 100 ක විශේෂ බදුවලින් සහ ආදායම් බදු පසු ලාභය රු. මිලියන 566 ක් ලෙස වාර්තා විය. කෙසේ වෙතත්, කළමනාකරණය හා කාර්ය මණ්ඩලය කැපවීම හේතුවෙන් 2017 මූල්‍ය වර්ෂය තුළදී අපගේ නිෂ්පාදන ප්‍රමිති තවදුරටත් ශක්තිමත් කරගනිමින් කැපී පෙනෙන කාර්යසාධනයක් වාර්තා කිරීමට හැකි විය. රාජ්‍ය අංශයේ නිෂ්පාදන අංශය වෙනුවෙන් වසරේ විශිෂ්ටතම කාර්යසාධනය සඳහා වන රන් සම්මානය දිනාගනිමින් ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද ජාතික ව්‍යාපාරික විශිෂ්ඨතා සම්මාන උළෙලේ දී අප ලද සාර්ථකත්වය කළමනාකාරිත්වය හා කාර්ය මණ්ඩලය යන දෙඅංශයේ කැපවීම පිළිබඳව සාක්ෂි දරයි.

ආර්ථිකය හා පරිසරය පිළිබඳව වෙනදාටත් වඩා වගකීමෙන් යුතුව ක්‍රියාකිරීම සඳහා පවත්නා ආකල්පයන් හේතුවෙන් 2017 වර්ෂය පුරාවටම සියලුම මෙහෙයුම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදී. තවද, "තුරුජන සිසු බැංකු" රුක් රෝපණ වැඩසටහන අඛණ්ඩව මෙම වර්ෂයේදී පවත්වා ගෙන යාමෙන් වගකිව යුතු පුරවැසියකු ලෙස අපගේ වගකීම උර දරාගෙන ඉටුකිරීමට සමත් වී ඇත. ශාක වගාව සඳහා පාසැල් සිසුන්ගේ උනන්දුව තවදුරටත් වර්ධනය කිරීම අරමුණු කරගනිමින් 2017 වර්ෂය තුලදී මාතර, මොණරාගල, බණ්ඩාරවෙල, රත්නපුර සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කවල තෝරාගත් පාසැල් අතර කෘෂිකාර්මික උපකරණ බෙදාදෙන ලදී. තවද, ලෝක පරිසර දිනය සැමරීම සඳහා දැව හා දැව නිෂ්පාදනවල තිරසාර භාවිතය පිළිබඳ ගුරුවරුන් දැනුවත් කිරීම සඳහා දේශන මාලාවක් පැවැත්විණි. ඒ පිළිබඳ දැනුවත් කිරීම සඳහා සකසා ඇති ඉතා වටිනා අත්පත්‍රිකාවක් ද බෙදාදෙන ලදී. "වනරෝපා" ජාතික රුක්රෝපණ වැඩසටහන යටතේ පැල සිටුවීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් පාසැල් විශ්වවිද්‍යාල, රාජ්‍ය ආයතන සහ පුද්ගලයින් අතර ඉතා වටිනා පැල 50,000 කට අධික ප්‍රමාණයක් බෙදා දෙන ලදී. පර්යේෂණ හා පුහුණුවීම් සඳහා උපාධි අපේක්ෂකයින් සඳහා අවස්ථා ද ලබා දී ඇත.

"දුප්පත්කම දුරැලීම" ජාතික වැඩසටහනේ සමාජ වගකීම් ඉටුකිරීමක් ලෙස තෝරාගත් අඩු ආදායම්ලාභී වඩුකාර්මිකයන් සඳහා පුහුණුවක් ලබාදුන් අතර, එම පුහුණුවන්නන් සඳහා අපගේ ගෘහභාණ්ඩ කර්මාන්තශාලා තුල ගෘහභාණ්ඩ නිෂ්පාදනය පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් ලබාදෙන ලදී. රාජ්‍ය දැව සංස්ථාව විසින් පාරිභෝගික ඉල්ලුම මත දැව හඳුනාගැනීමේ සහ සහතික කිරීමේ සේවාවක් ස්ථාපිත කර ඇත. වඩාත්ම විශ්වාසවන්ත හා හොඳම තත්වයේ දැව සැපයුම්කරු බවට පත්වීම යන සංස්ථාවේ දැක්ම සමඟ ජාතියේ උන්නතිය වෙනුවෙන් ජාතිය කෙරෙහි ජාතික වගකීමක් ඉටුකිරීමට අපට හැකි විය.

වැඩ හිතකර නම්‍යශීලී වැඩ පරිසරයක් ගොඩනැංවීම කෙරෙහි දැඩි අවධානය මේ වනවිටත් යොමු වී ඇත. මෙමගින් සහෘද සේවකයන්ගේ ජීවන තත්වය උසස් කිරීමත්, ඔවුන්ගේ මානසික හා කායික සංවර්ධනය ඇති කිරීම තුළින් කාර්යක්ෂම හා ඵලදායි සේවයක් ලබාගැනීමේ අදහස් පෙරදැරිව ඉහළ මට්ටමකට ළඟාකරලීම සඳහා වසර පුරා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. දැනුම, කුසලතා හා ආකල්ප දියුණු කිරීමේ අරමුණින් පුහුණු අවස්ථා ලබාදීමත්, විවිධ වැඩමුළු සංවිධානය කිරීමත් මගින් ඉහළ සේවක තෘප්තියක් ලබාදෙමින් සංස්ථාවේ අභිවෘද්ධිය උදෙසා සේවකයන් මෙහෙයවීමට කළමනාකාරිත්වයට හැකිවිය. ශ්‍රී ලංකා රජයේ සංවර්ධන ප්‍රතිපත්ති සාර්ථක කර ගැනීමට උරදෙමින්, ජාතික මෙහෙවරක් ලෙස සලකා සේවකයන් 2,083 සංඛ්‍යාවකට රැකියා අවස්ථා සලසාදීමට අපි වගබලා ගත්තෙමු.

ආයතනයේ ප්‍රතිපත්ති හා අරමුණු ක්‍රියාත්මක කිරීමේදී පැණනඟින ගැටළු හමුවේ නිවැරදි තීන්දු තීරණ නිසිකලට ගැනීම තුලින් විසඳාගත් බොහෝ ගැටළු ආයතනයේ සංවර්ධනයට හේතු සාධක විය. අභියෝග හමුවේ නොසැලී සිටීමේ හැකියාව කියාපාමින් කළමනාකාර මඩුල්ල මෙන්ම සේවකයන් ද අධ්‍යක්ෂ මණ්ඩලයේ තීන්දු තීරණ හා එක්ව මැනවින් කටයුතු කිරීම අගය කළයුතුය.

අවසාන වශයෙන් සංස්ථාවේ උන්නතිය පිණිස අඛණ්ඩව කැපවී කටයුතු කරන සභාපතිතුමා, ක්‍රියාකාරි අධ්‍යක්ෂතුමා ප්‍රමුඛ අධ්‍යක්ෂ මණ්ඩලය මා ඉතා අගයකොට සලකන අතර, දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන සැපයුම්කරු ලෙස අඛණ්ඩව අප කෙරෙහි දැඩි පක්ෂපාතීත්වයක් දක්වමින්, අපගේ සාර්ථකත්වයට අත්තිවාරම සපයන්නාවූ පාරිභෝගික හිතවතුන්ට ද, මාගේ කෘතවේදීත්වය පිරිනමන අතර, අපගේ බැඳීම් තවදුරටත් ශක්තිමත් කරගනුවස් හැකි උපරිම ශක්‍යතාවයෙන් ඔබහට අනර්ඝතම දේ පුද කිරීමට අප සැදී පැහැදී සිටිමු. මීට අමතරව, අපගේ අරමුණු හා පරමාර්ථ ළඟාකර ගැනීම පිණිස පූර්ණ අනුග්‍රහය හා සහයෝගය ලබාදුන් ගරු මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමා වන අතිගරු ජනාධිපතිතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා හා අමාත්‍යංශ ලේකම්තුමාට මාගේ හද පිරි ස්තුතිය පිරිනමමි.

සාර්ථකත්වයේ මාවත ඔස්සේ වේගවත් හා ස්ථිර ගමනක් යෑම පිණිස නිබඳ සහයෝගයක් දක්වන මාගේ කළමනාකරණ මඩුල්ලේ සියලුම සහෘදයන්ට සහ ලැදියාවෙන්, දැඩි පරිශ්‍රමයකින් හා කැපවීමෙන් ක්‍රියාකරනු ලබන සහෘද කාර්ය මණ්ඩලයට මාගේ අතිශය ගෞරවය පිරිනමන අතර, 2017 වසර ඉතා සාර්ථකව අවසන් කිරීමට නන්අයුරින් සහයෝගය ලැබ දුන් සියලු දෙනාටත් මාගේ හෘදයංගම ප්‍රණාමය පුදකර සිටිමි.

**එච්.පී.එස්. නවරත්න**
සාමාන්‍යාධිකාරී
රාජ්‍ය දැව සංස්ථාව

# අපගේ කාර්යභාරයන්

වනාන්තරවලින් දැව කපා ඉවත්කිරීම, එම දැව ඉරූ දැව හා නිමි භාණ්ඩ බවට පරිවර්තනය කිරීම, දැව කඳන්, ඉරූ දැව හා නිමි භාණ්ඩ නිෂ්පාදන අලෙවිය සහ යථෝක්ත කාර්යයන් සඳහා කැලෑ මාර්ග ඉදිකිරීම.

දැව කඳන් කිරීමේ මධ්‍යස්ථාන, ඉරුම් මෝල්, තෙල් කැවීමේ හා පරිරක්ෂණ යන්ත්‍රාගාර, දැව වියළීම හා වියළීමේ උඳුන් හා අවශ්‍ය උපකරණ මිළදීගැනීම, ඉදිකිරීම හා ක්‍රියාකරවීම.

දැව අලෙවි මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.

දැව අතුරු භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය.

දැව ආනයනය කිරීම.

නව වනවගා ව්‍යාපෘති ආරම්භ කිරීම, නැවත වනවගා කිරීම, කැලෑ සහ වනවගාවන් විද්‍යාත්මකව කළමනාකරණය කිරීම.

කෘෂිකාර්මික නිෂ්පාදන.

දැව ආශ්‍රිත නිමි හා අර්ධ නිමි භාණ්ඩ නිෂ්පාදන අපනයනය කිරීම.

පෞද්ගලික ඉඩම් වලින් දැව මිලදීගැනීම.

වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන පිරි සැකසුම.

වේවැල් ආනයනය කිරීම.

නියැදි පරීක්ෂා කිරීම් මගින් දේශීය හා ආනයනය කරන ලද දැව හඳුනා ගැනීම සහ දැව සම්බන්ධ සහතික නිකුත් කිරීම.

දැව කර්මාන්තය ආශ්‍රිත විෂයයන් පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම, සහතික ප්‍රදානය කිරීම සහ පරිසරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.

සංස්ථාවට අයත් ඉඩම් හා ගොඩනැගිලිවල සම්පූර්ණ ප්‍රයෝජනය ලබාගැනීම සඳහා සැලසුම් කිරීම සහ ඒ වෙනුවෙන් ආයෝජනය කිරීම.

# අපගේ ව්‍යාපාරික වටිනාකම්

- ඉතාමත් පරිසර හිතකාමී සහ වාණිජ වශයෙන් ජීවමාන රාජ්‍ය අංශයේ ආයතනයක් ලෙස අපගේ ස්ථාවරත්වය පවත්වාගෙන යෑම අපගේ ප්‍රමුඛ වගකීම ලෙස හඳුනාගනිමු.
- පිවිතුරු සහ හිතකාමී පරිසරයක් සුරක්ෂිත කිරීම සඳහා වනාන්තර සහ දැව ඉවත් කිරීමේ විද්‍යානුකූල කළමණාකරණයට සම්බන්ධ සියළුම ව්‍යවස්ථාපිත රෙගුලාසීන්ට අනුකූලව එය ඉටු කිරීමට අපි කැපවෙමු.
- ගනුදෙනුකරුවන් සමඟ ආචාරශීලි ව්‍යාපාරික සබඳතා ගොඩනඟා ගනිමින්, ඔවුනට සහ සියළුම ශ්‍රී ලාංකිකයන්ට වටිනාකම් නිර්මාණය කිරීම අපගේ පැවැත්මේ මූලික ම කාරණය ලෙස අපි පිළිගන්නෙමු.
- කුසලතා වර්ධනය, වෘත්තීය සංවර්ධනය සහ නිරන්තර අධ්‍යාපනය සහ පුහුණුව තුළින් අපගේ සේවා නියුක්තිකයන්ගේ ඵලදායීතා මට්ටම ඉහළ නැංවීම සඳහා කටයුතු කරන්නෙමු.
- ගනුදෙනුකරුවන්ට කාර්යක්ෂම සහ ආචාරශීලී සේවයක් සැපයීම සඳහා අපගේ සියළු කාර්යයන්හි දී ඔවුන්ව මූලිකව තබා ගනිමින් කටයුතු කරන්නෙමු.
- සියළුම මෙහෙයුම් කටයුතු වලදී සහ සේවා සැපයීමේදී පුද්ගලික අවංකභාවය ඉතා ඉහළින්ම තබා ගන්නා බවට සහතික වන්නෙමු.
- අනාගත පරපුරේ අගනා ජාතික උරුමයන් ලෙස පරිසරය සහ වන සම්පත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් සියළුම ව්‍යවස්ථාපිත රෙගුලාසි සහ සමාජීය ප්‍රතිමාන අනුගමනය කරන්නෙමු.

# අධ්‍යක්ෂ මණ්ඩලය 2017



**පී. දිසානායක**
සභාපති - රාජ්‍ය දැව සංස්ථාව



**එච්.වයි.ටී. පවරකුමාර**
ක්‍රියාකාරී අධ්‍යක්ෂක - රාජ්‍ය දැව සංස්ථාව



**ඩී. විජේසිරිවර්ධන**
අධ්‍යක්ෂක - භාණ්ඩාගාර නියෝජිත



**එස්.ඒ.ඒ. සතුරුසිංහ**
අධ්‍යක්ෂක - වන සංරක්ෂණ ජනරාල්



**එම්.වී. කරුණාරත්න**
අධ්‍යක්ෂක



**පී.පන්සලවත්ත**
අධ්‍යක්ෂක



**ඒ.එම්.සී. පෙරේරා**
අධ්‍යක්ෂක


# ජ්‍යෙෂ්ඨ
## කළමණාකරණ මඬුල්ල 2017



**එච්.පී.එස්. නවරත්න**
සාමාන්‍යාධිකාරී (වැ.බ.)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)



**ආචාර්ය එන්. රුවන්පතිරණ**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(පර්යේෂණ, පුහුණු හා සංවර්ධන)



**ඩබ්.ඩබ්.එම්.ජේ. කුරේ**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(අභ්‍යන්තර විගණන)



**පී.ඩී.එස්. කුමාරසිංහ**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මූල්‍ය)



**පී. ගුණවංශ**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(අලෙවි)



**එම්.ඒ.සී.එන්. සමරසිංහ**
නියෝජ්‍ය සමාන්‍යාධිකාරී
(මානව සම්පත් හා පාලන)



# කළුවර

ශ්‍රී ලංකාව ඇතුළු දකුණු ඉන්දියානු කලාපයේ සීමිත රටවල් ගණනක දක්නට ලැබෙන සහ ශ්‍රී ලංකාවේ වියළි කලාපීය හා අතරමැදි කලාපීය දේශගුණික තත්ත්ව යටතේ මීටර් 20 - 25 ක් පමණ උසට වැඩෙන මධ්‍යම ප්‍රමාණයේ ශාකයකි. මෙම ශාකය ශ්‍රී ලංකාවට දේශීය වූ ශාකයකි. කළුවර ශාකය අයත්වන Diaspyros ඝණයේ තවත් ශාක 22 ක් පමණ ශ්‍රී ලංකාවේ දී හඳුනාගෙන ඇත. කළුවර ශාකය මුලින් ම උද්භිද විද්‍යාත්මකව හඳුනාගෙන ඇත්තේ වර්ෂ 1976 දී Koenig නම් තැනැත්තා විසින් ශ්‍රී ලංකාවේ දීම ය. එය සුවිශේෂී කරුණකි. ශ්‍රී ලංකාව යටත් විජිතයක්ව පැවති සමයේ දී කළුවර දැව විශාල ලෙස අපේ රටේ වනාන්තර වලින් කපා විදේශවලට ගෙන ගිය බව කියැවෙන අතර, වර්ෂ 1910 දී කළුවර ටොන් 2635 ක් විදේශිකයන්ට වෙන්දේසි කළ බවට පොතපතෙහි සඳහන් වේ. අතීතයේ සිට සිදුවූ මෙවන් අනර්ථකාරී ක්‍රියා හේතුවෙන් අද වන විට මේ වටිනා ශාකය විනාශයේ අභිමුවට පැමිණ තිබීම කණගාටුවට කරුණකි. කළුවර ශාකය ද සීමිත/තහනම් දැවයක් ලෙස නම් කර ඇති අතර, ප්‍රවාහන බලපත්‍ර ලබාදීම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් සිදුකරයි. කළුවර කඳන් සහ ඉරුඇදැව අපනයනය ද තහනම් කොට ඇත. රාජ්‍ය දැව සංස්ථා වර්ගීකරණය අනුව අධි සුඛෝපභෝගී දැව වර්ගයකි. කළුවර දැව ඝණ මීටරයක (මැද වට මීටරයක්) රු.123,228. පමණ වේ. 2007 වර්ෂයේ ප්‍රකාශයට පත්කර ඇති රතු දත්ත පොතට (The 2007 Red List of Threatened Faunus and Flora of Sri Lanka) අනුව ශ්‍රී ලංකාවේ වඳවීමේ තර්ජනයට මුහුණ පා ඇති ශාක වර්ගීකරණයේ අන්තරායට ලක්වූ ශාක විශේෂයක් Endangered EN ලෙසට නම් කොට ඇත. මෙම ශාකයේ වැදගත්කම සැලකිල්ලට ගෙන රාජ්‍ය දැව සංස්ථාවේ පර්යේෂණ අංශය සහ පරිසර අමාත්‍යංශයේ ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය හා එක්ව මින්නේරිය රාජ්‍ය දැව සංස්ථා භූමියෙහි කළුවර ශාක සංරක්ෂණය සඳහා ජෛව විවිධත්ව උIනයක් පිහිටුවා තිබේ.

*උපුටාගැනීම*

**ශ්‍රී ලංකාවේ දැව ශාක**

ආචාර්ය නිමල් රුවන්පතිරණ



# අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය

## අධ්‍යක්ෂ මණ්ඩලය

| | |
|---|---|
| පී. දිසානායක | සභාපති - රාජ්‍ය දැව සංස්ථාව |
| එච්.වයි.ටී. පවරකුමාර | ක්‍රියාකාරී අධ්‍යක්ෂක - රාජ්‍ය දැව සංස්ථාව |
| ඩී. විජේසිරිවර්ධන | අධ්‍යක්ෂක - භාණ්ඩාගාර නියෝජිත |
| එස්.ඒ.ඒ. සතුරුසිංහ | අධ්‍යක්ෂක - වන සංරක්ෂණ ජනරාල් |
| එම්.වී. කරුණාරත්න | අධ්‍යක්ෂක |
| පී.පන්සලවත්ත | අධ්‍යක්ෂක |
| ඒ.එම්.සී. පෙරේරා | අධ්‍යක්ෂක |


2017 වසර, රටේ දේශපාලන හා ආර්ථික පරිසරයේ ඇති වූ විචලනයන් නිසා සංස්ථාවට අතිශය අභියෝගාත්මක වසරක් විය. අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නව දැක්මක් සහිතව, පසුගිය වසර කිහිපය මෙන්ම සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුලදී රාජ්‍ය දැව සංස්ථාව සිය ව්‍යාපාර කටයුතු සිදුකරන ලදී. සංස්ථාවේ කළමනාකාරිත්වය විසින් ක්‍රියාත්මක කරන ලද උපාය මාර්ග හමුවේ ආදායම් සහ ලාභදායී දර්ශකයන් ව්‍යාපාරයේ පැවැත්ම හා කාර්යසාධනය තහවුරු කර ඇත.


රාජ්‍ය දැව සංස්ථාව විසින් මුහුණ දෙන ප්‍රධාන අභියෝග අතර ඉහළ යන වෙළඳපොල ක්‍රියාකාරීත්වයත් ස්වභාවික සම්පත් වෙනුවෙන් පවතින ආදේශක සඳහා වෙළෙඳපොල පුළුල්වීම සඳහන් කළ හැක. ශ්‍රී ලංකාව තුළ ගුණාත්මකභාවයෙන් යුතු දැව ආනයනය කිරීම මගින් ඉහළ යන දැව ඉල්ලුමට සැපයීම් කළ හැකි පරිදි රාජ්‍ය දැව සංස්ථාව සිය ව්‍යාපාර කටයුතු පුළුල් කර ඇත. කසේ වෙතත්, අවාසනාවකට මෙන් අනෙකුත් දේශීය ආනයනකරුවන්ගේ මිලගණන් වලට සාපේක්‍ෂව රාජ්‍ය දැව සංස්ථාවේ මිලගණන් තරමක් ඉහළ අගයක් ගනී. රාජ්‍ය ආයතනයක් ලෙස සංස්ථාව විසින් උසස් තත්වයේ ඉරූදැව ආනයනය කිරීමත්, බාල තත්වයේ ඉරූදැව ආනයනය නොකිරීමත් ප්‍රතිඵලයක් ලෙස, තවමත් යහපත් ව්‍යාපාරික ආචාරධර්ම ආරක්‍ෂා කරමින් වගකීමකින් යුතු ආයතනයක් ලෙස සිය මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යයි.

| කාර්යසාධනය | 2017 රු.මි. | 2016 රු.මි. |
|---|---|---|
| පිරිවැටුම | 4,254 | 4,214 |
| දළ ලාභය | 2,076 | 2,045 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 103 | 92 |
| මෙහෙයුම් ලාභය | 693 | 443 |
| මෙහෙයුම් නොවන වෙනත් ආදායම් | 274 | 216 |
| භාණ්ඩාගාරයට ගෙවූ විශේෂ බදු | 100 | 175 |
| භාණ්ඩාගාරයට හා ආදායම් බදු වලට පෙර ශුද්ධ ලාභය | 967 | 660 |





එහි ප්‍රතිඵලයක් ලෙස වසර තුළ සංස්ථාවෙහි පිරිවැටුම රු.මිලියන 4,254 ක් වූ අතර, එය පසුගිය වසරේ දී රු.මිලියන 4,214 ක් විය. පසුගිය වර්ෂයට සාපේක්‍ෂව මුළු පිරිවැටුම සාමාන්‍ය වර්ධනයකින් වැඩි විය. වර්ෂය සඳහා දළ ලාභය පසුගිය වසරේදී රු.මිලියන 2,045 ට පිරිවැටුම වර්ධනයට 2,076 ක් වූ අතර, එය 2% ක වැඩවීමකි. පසුගිය වසර සමඟ සැසඳීමේදී රජයේ ඇතැම් ප්‍රතිපත්ති, ආර්ථික තත්වය සහ දේශගුණික වෙනස්වීම් සංස්ථාවේ පිරිවැය සහ කාර්යසාධනය සඳහා සෘජුව බලපා ඇත.





සමාලෝචන වර්ෂය සඳහා බදු හා බදුවලට පෙර ශුද්ධ ලාභය රු.මිලියන 967 ක් වූ අතර, එය පෙර වසර සමඟ සැසඳීමේ දී රුපියල් මිලියන 307 ක වර්ධනයක් විය. ලාභ ඉපැයීම පමණක් අරමුණු කර නොගෙන වගකිව යුතු ආයතනයක් ලෙස හැමවිටම රාජ්‍ය දැව සංස්ථාව කටයුතු කරයි. ලංකාවේ විරැකියාව අවම මට්ටමකට ගෙනඒම සඳහා රජයට සහාය වෙමින් වැඩි රැකියා අවස්ථාවන් ලබාදීමට හැමවිටම උත්සාහ දරයි. 2,083 ක් වූ සේවක සංඛ්‍යාවකට රැකියා අවස්ථාව ලබාදෙමින් රු.මිලියන 1,580 ක් වූ අලෙවිකරණ පිරිවැයට අමතරව පරිපාලන, විකුණුම් හා බෙදාහැරීම් වියදම් වශයෙන් රු.මිලියන 1,486 ක් දරණ ලදී. 2017 වර්ෂය තුලදී පරිපාලන, විකුණුම් හා බෙදාහැරීම් වියදම් පසුගිය වර්ෂයට සාපේක්‍ෂව 12% කින් පහත වැටුණි. සේවක පිරිවැයක් දරමින් 2017 වර්ෂය තුළ රාජ්‍ය දැව සංස්ථාව තම ව්‍යාපාර කටයුතු සිදුකරන ලදී.




2017 දී භාණ්ඩාගාරයට ගෙවනු ලබන විශේෂ බද්ද, ආදායම් බදු සහ අනෙකුත් විස්තීරණ ආදායම් ගැලපීමෙන් පසු ශුද්ධ ලාභය රුපියල් මිලියන 242 ක් විය. එය පසුගිය වසරට සාපේක්‍ෂව රු.මිලියන 207 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

2017 වර්ෂය සඳහා වත්කම් හා හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය පහත පරිදි වේ.

| | වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය | හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය |
|---|---|---|
| 2017 | 3.8% | 5.7% |
| 2016 | 0.7% | 0.9% |

සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය සඳහා රජයේ ආදායමට සංස්ථාවේ දායකත්වය රු.මිලියන 2,055 ක් වූ අතර, එහිදී භාණ්ඩාගාර බදු වශයෙන් රු.මිලියන 100 ක් සංස්ථාවේ ලාභයෙන් රජයට ලබාදෙන ලදී.

## නිෂ්පාදනය

සමස්ත මෙහෙයුම් ක්‍රියාවලියම පරිසර හිතකාමී ක්‍රමවේදයක් ඔස්සේ පවත්වා ගනිමින් ඉහළ නිෂ්පාදන මට්ටමක් සාක්ෂාත් කරගැනීම ආයතනික පැවැත්ම තහවුරු කිරීමටත්, ලාභදායීත්වය ඉහළ නැංවීමටත්, එමෙන් ම ආයතනයේ අභ්‍යන්තර සහ බාහිර සංරචකවල යහ පැවැත්මටත් ඉතා වැදගත් වන බව අපගේ දැඩි විශ්වාසයයි.

ආයතනික උපාය මාර්ග පාරිසරික අවධානය සමඟ සමෝධානය කරමින් තිරසර සම්පත් භාවිතයක් වෙනුවෙන් අපගේ විභවතාවයන් නිරන්තරයෙන් ඉහළ නංවනු ලැබේ.

තිරසර සංවර්ධනයේ සානුබල සඳහා ප්‍රමුඛත්වය ලබාදෙමින් මෙහෙයුම් අංශයේ ව්‍යුහයන්, පද්ධතීන්, ශ්‍රම බලකාය සහ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය නව තාක්ෂණය නිතරම යොදාගනු ලැබේ. රජය විසින් පනවනු ලබන නීති හා රෙගුලාසි වලට එකඟතාවය දක්වමින් ඒවාට අනුකූලව කටයුතු කිරීම, ක්‍රමවත් වැඩබිම් වර්ගීකරණ ලැයිස්තුවක් සකස් කිරීම, විද්‍යාත්මක දැව නිස්සාරණය, නිවැරදි දැව පරිරක්ෂණ ක්‍රම භාවිතය, විධිමත් අයුරින් යන්ත්‍රෝපකරණ ස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම, සේවකයින් බඳවාගැනීමේ සහ සංවර්ධනය කිරීමේ නිවැරදි ක්‍රමවේදයක් ඇති කිරීම, සංස්ථාවේ කෙටි හා දිගුකාලීන අරමුණු තිරසාර ආකාරයකින් ඉටුකර ගැනීමට ඉවහල් විය. සැබවින් ම රාජ්‍ය දැව සංස්ථාව යනු ශ්‍රී ලංකාවේ තිරසාර වන කළමනාකරණය සඳහා දායකත්වය සපයන ප්‍රධාන ආයතනයයි. විද්‍යාත්මක දැව නිස්සාරණයේ දී ශාකයේ භෞතික හා ජීව විද්‍යාත්මක ස්වභාවය, වනාන්තර යටි වගාව, ස්වභාවික වනාන්තර ප්‍රදේශයේ ජීව විද්‍යාත්මක අන්තර් සම්බන්ධතා, සුළගේ දිසාව, භූමියේ බෑවුම, පසෙහි ස්වභාවය සහ ජල මූලාශ්‍රවල පිහිටීම යනාදි කරුණු රාශියක් ඇගයීමට ලක් කරයි. එය පරිසර හානිය අඩු කරමින් කාබන් විමෝචනය පහළ දැමීමට දායකවේ. ගෘහභාණ්ඩ නිෂ්පාදනයේ දී ඉවත් කරනු ලබන කුඩා දැව කැබලි එකතුකොට (Finger Joint) පුවරු නිෂ්පාදනය කරයි. මෙම පුවරු නැවත ගෘහභාණ්ඩ නිෂ්පාදනයට ද යොදාගනී.

### මෙහෙයුම් ක්‍රියාවලියට බලපාන තර්ජන සහ ව්‍යාපාරික අවස්ථාවන්

සංස්ථාව විවිධ කාලයන්හි දී එහි පැවැත්මට සුළු පරිමාණයේ සිට දැවැන්ත මට්ටමේ බලපෑම් සිදුවන විවිධ අර්බුදකාරී අවස්ථාවන්ට මුහුණ දෙන ලදී. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන මේරූ වන වගා භූමි ප්‍රමාණය පැහැදිලි ලෙස අඩුවීම, මුහුදු මට්ටමේ සිට අඩි 5000 ක උසින් සිදුකරනු ලැබූ දැව හෙලීම් තහනම් කිරීම, රාජ්‍ය වැවිලි සමාගම් ඔවුන්ගේ දැව විවෘත වෙළෙඳපොලේ අලෙවි කිරීමට තීරණය කිරීම, දැව සහ දැව ආශ්‍රිත නිෂ්පාදන සඳහා විවිධ ආදේශක නිෂ්පාදන වෙළෙඳපොළ තුළ බහුලවීම මෙවැනි තර්ජන වලට උදාහරණ ලෙස දැක්විය හැකිය.

ආරක්ෂාකාරී වෙළෙඳපොල උපයා මාර්ග යොදාගනිමින් වෙළෙඳපොල සංවර්ධනය කිරීම, ප්‍රවර්ධන කටයුතු ඉහළ නැංවීම, නිෂ්පාදනයේ වටිනාකම ඉහළ දැමීම, නිෂ්පාදන කළඹ විවිධාංගීකරණය කිරීම සහ නිෂ්පාදන ක්‍රියාවලියේ දී දැව උපරිම අයුරින් ප්‍රයෝජනයට ගැනීම ආදී ක්‍රියාකාරකම් මගින් මුහුණදීමට සිදු වූ තර්ජනවල බලපෑම අවම මට්ටමකට ගෙන ඒමට අපට හැකි විය.

ඊට අමතරව කර්මාන්තයේ ප්‍රතිවාදීන්ට වඩා තරඟකාරී වාසියක් ලබා ගැනීම සඳහා පහත සඳහන් උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමට අපි අදහස් කරමු.

- රාජ්‍ය වැවිලි සංස්ථාව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ඇල්කඩුව වැවිලි සමාගම වෙතින් වාණිජමය වශයෙන් වටිනා ගස් මිලදී ගැනීම.
- ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ ඔවුන්ගේ ඉඩම් වල දැව නිස්සාරණය කිරීමට ගිවිසුමකට එළඹීම සඳහා සාකච්ඡා කිරීම.
- වෙළඳපල සංවර්ධනය සඳහා තෙල් කවන ලද සිල්පර ප්‍රති අපනයන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- රජයේ ඉඩම්වල වාණිජ වැවිලි ස්ථාපිත කිරීම පුළුල් කිරීම
- ඉද්දපොල - පදවලයාය තේක්ක ඉවත් කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීම සහ ඝන මීටර් 64,000 ක අස්වැන්නක් නිෂ්පාදනය කිරීමට කටයුතු කිරීම.
- අස්වැන්න උපරිම කිරීම සඳහා විද්‍යාත්මක දැව නිස්සාරණ ක්‍රමය තවදුරටත් සංවර්ධනය කිරීම

### රජයේ කැලෑවලින් දැව හෙලීම්

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වන කළමනාකරණ සැලැස්මකට අනුව හෙලීම් සඳහා තේක්ක, පයිනස් සහ යුකැලිප්ටස් වැනි වනවගා නිදහස් කරනු ලබන අතර 2016 සහ 2017 වර්ෂ වල හෙලීම් සඳහා නිදහස් කර ඇති හෙක්ටයාර් ප්‍රමාණය පහත පරිදි වේ.

| දැව විශේෂය | පූර්ණ හෙලීම් (හෙක්ටයාර්) | | තුනීකිරීම් (හෙක්ටයාර්) | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 |
| තේක්ක | 569.8 | 665.6 | 375.9 | 145.7 |
| යුකැලිප්ටස් | 210.7 | 81.1 | 515.0 | 441.2 |
| පයිනස් | 160.2 | 175.5 | - | - |
| කාយා | - | - | 20.0 | 3.5 |
| ඇකේෂියා | 30.0 | 16.8 | - | - |

### ඉරූ දැව පරිවර්තනය කිරීම

2016 වර්ෂයේ ඉරූදැව නිෂ්පාදනය ඝන මීටර් 4,637 ට සාපේක්ෂව 2017 වර්ෂය තුළදී ඉරූදැව ඝන මීටර් 4,909 ක් ඉරුම්හල් මගින් නිෂ්පාදනය කර ඇති අතර, ඝන මීටර් 2,997 ක් දිවයින පුරා පිහිටා ඇති දැව අලෙවි ගබඩා මගින් අලෙවි කර ඇත.

### විදුලි කණු සහ සිල්පර පරිරක්ෂණය කිරීම

2017 වර්ෂය තුළදී සිල්පර 7,416 ක්, විදුලිකණු 20,186 ක් හා අලිවැටකණු 33,424 ක් රාජ්‍ය දැව සංස්ථාවේ කල්දෙමුල්ල, කැප්පෙටිපොල හා බූස්ස පරිරක්ෂණාගාර වලින් පරිරක්ෂණය කර ඇත. පසුගිය වසරට සාපේක්ෂව 2017 වසරේ විදුලි සම්ප්‍රේෂණ කණු සහ සිල්පර ඉල්ලුමේ සැලකිය යුතු පහළයෑම හේතුවෙන් නිෂ්පාදනයේද පසුබෑමක් දක්නට ඇත.

### ගෘහභාණ්ඩ නිෂ්පාදනය

රාජ්‍ය දැව සංස්ථාවේ අම්පාර, කල්දෙමුල්ල හා බූස්ස ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාර වලින් රුපියල් මිලියන 351.2 ක් වටිනා ගෘහභාණ්ඩ සලකා බලන වර්ෂය තුලදී නිෂ්පාදනය කර ඇත. ඒ අතර රුපියල් මිලියන 381.3 ක් ශුද්ධ වටිනාකමින් යුත් ගෘහභාණ්ඩ රාජ්‍ය දැව සංස්ථාවේ රත්මලාන, මහනුවර, රත්නපුර, තලල්ල, බූස්ස හා අම්පාර ගෘහභාණ්ඩ ප්‍රදර්ශනාගාර වලින් අලෙවි කර ඇත. පසුගිය වසරට සාපේක්ෂව ගෘහ භාණ්ඩ නිෂ්පාදනය 28% ක ඉහළ යෑමක් වාර්තා විය.

### 2016 - 2017 වර්ෂවල නිෂ්පාදනය, අලෙවිය හා ආදායම

| | නිෂ්පාදන ප්‍රමාණය | | අලෙවි ප්‍රමාණය | | දළ පිරිවැටුම (බදු සහිත) | |
|---|---|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 | 2017 (රු.මි.) | 2016 (රු.මි.) |
| කඳන් ඝ.මී | 146,094 | 156,987 | 131,518 | 134,486 | 3,653.7 | 3,229.9 |
| ඉරූදැව ඝ.මී | 4,909 | 4,637 | 2,997 | 2,854 | 290.2 | 261.8 |
| සිල්පර ඒකක | 7,416 | 26,924 | 14,322 | 38,318 | 153.1 | 320.1 |
| විදුලිකණු ඒකක | 20,186 | 33,026 | 19,484 | 36,512 | 197.8 | 359.6 |
| අලිවැටකණු ඒකක | 33,424 | 34,625 | 25,616 | 46,458 | 88.9 | 146.4 |
| වටකණු ඒකක | 141,790 | 193,610 | 132,863 | 185,797 | 21.3 | 24.5 |
| දර ඝ.මී | 126,861 | 125,225 | 119,669 | 107,621 | 64.5 | 65.9 |
| වැටකණු ඒකක | 114,681 | 103,700 | 103,516 | 96,150 | 13.9 | 14.2 |

## ඉලක්ක හා සපුරාගැනීම් පිළිබඳ සමාලෝචනය සහ අධීක්ෂණය

සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් හා සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගේ සහභාගීත්වයෙන් මාසිකව කළමනාකරණ රැස්වීම් පවත්වනු ලබන අතර, එහිදී සත්‍ය කාර්යසාධනය, නිෂ්පාදනය සහ අලෙවි ඉලක්ක සමග සසඳා බලනු ලැබේ. මෙම රැස්වීම් වලදී සියලුම බාධක හා ගැටළු අදාල ප්‍රාදේශීය කළමනාකරුවන් සමග සාකච්ඡා කර හඳුනාගනු ලබන අතර, ඒ සම්බන්ධ විවිධ තීරණ හා විකල්ප ක්‍රියාමාර්ග යෝජනා කර පසුව එම යෝජනා ඇගයීමට ලක්කර ක්‍රියාත්මක කරනු ලැබේ. තවද සංස්ථාවේ අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීමේ අභිලාෂයෙන් හා අපේක්ෂිත මුදල් ප්‍රවාහය ළඟාකරගෙන මුල්‍යමය අතින් ශක්තිමත් ආයතනයක් බවට තහවුරු කිරීමේ අරමුණින් නව අවස්ථාවන්, නව අදහස් හා කළයුතු වෙනස්කම් සම්බන්ධයෙන් ද සාකච්ඡා කරනු ලැබේ.


අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ,

**පී.දිසානායක**
සභාපති
රාජ්‍ය දැව සංස්ථාව.






## අපගේ ආවරණ කලාප




## අම්පාර ප්‍රාදේශිකය




මඩකලපුව අලෙවි ගබඩාව

පදියතලාව අලෙවි ගබඩාව

අම්පාර ප්‍රාදේශීය කාර්යාලය
අම්පාර අලෙවි ගබඩාව
අම්පාර ලී මෝල
අම්පාර ප්‍රදර්ශනාගාරය



## අනුරාධපුර ප්‍රාදේශීකය




වවුනියාව අලෙවි ගබඩාව


මැදවච්චිය අලෙවි ගබඩාව

අනුරාපුර ප්‍රාදේශීය කාර්යාලය
අනුරාධපර අලෙවි ගබඩාව

තලාව අලෙවි ගබඩාව




## බණ්ඩාරවෙල ප්‍රාදේශිකය




බොරලන්ද අලෙවි ගබඩාව

බණ්ඩාරවෙල ප්‍රාදේශීය කාර්යාලය

බණ්ඩාරවෙල ලී මෝල



## කොළඹ ප්‍රාදේශිකය




මීරිගම අලෙවි ගබඩාව
කඩවත අලෙවි ගබඩාව


පන්නිපිටිය අලෙවි ගබඩාව

කල්දෙමුල්ල අලෙවි ගබඩාව
කොළඹ ප්‍රාදේශීය කාර්යාලය
රත්මලාන අලෙවි ගබඩාව
කල්දෙමුල්ල ලී මෝල
රත්මලාන ප්‍රදර්ශනාගාරය

එගොඩ උයන අලෙවි ගබඩාව
මොරටුමුල්ල අලෙවි ගබඩාව
විල්ලෝරාවත් අලෙවි ගබඩාව




## යාපනය ප්‍රාදේශිකය




යාපනය ප්‍රාදේශීය කාර්යාලය
යාපනය අලෙවි ගබඩාව

නල්ලූර් අලෙවි ගබඩාව
කිලිනොච්චි අලෙවි ගබඩාව



## මහනුවර ප්‍රාදේශිකය




දඹුලුඔය අලෙවි ගබඩාව

මාතලේ අලෙවි ගබඩාව


පල්ලෙකැලේ අලෙවි ගබඩාව
මහනුවර ප්‍රාදේශීය කාර්යාලය
මහනුවර ප්‍රදර්ශනාගාරය

නෙලුන්දෙනිය අලෙවි ගබඩාව

ඇත්ගාල අලෙවි ගබඩාව
ඇත්ගාල ලී මෝල





## කුරුණෑගල ප්‍රාදේශිකය








## මොණරාගල ප්‍රාදේශිකය








## මාතර ප්‍රාදේශිකය








## නුවරඑළිය ප්‍රාදේශිකය








## පොළොන්නරුව ප්‍රාදේශිකය






## රත්නපුර ප්‍රාදේශීකය







# රාජ්‍ය දැව සංස්ථාවේ විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

**කමිටු සාමාජිකයන් - 2017**

ඩී. විජේසිරිවර්ධන මහතා - කමිටු සභාපති
එස්.ඒ.ඒ. සතුරුසිංහ මහතා - කමිටු සාමාජික
එම්.වී.කරුණාරත්න මහතා - කමිටු සාමාජික

**කමිටුවේ කාර්යභාරය**

2017 වර්ෂයට අදාලව පහත සඳහන් කරුණු අදාල රැස්වීම්වලදී සාකච්ඡා කර ඇති අතර, එහිදී ගන්නා ලද තීරණ අධ්‍යක්ෂ මණ්ඩයේ අනුමැතිය සඳහා නිර්දේශ සහිතව ඉදිරිපත් කරන ලදී.


විගණන හා කළමනාකරණ කමිටුව විසින් මාස තුනකට වරක් රැස්ව මූල්‍ය වාර්තාකරණය හා විගණන ක්‍රියාවලියේ අඛණ්ඩතාවය සහතික කිරීම සහ ශක්තිමත් අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණ පද්ධති පවත්වා ගැනීම පිළිබඳ සාකච්ඡා කරන අතර, එහි සොයාගැනීම් වලට අදාල තොරතුරු හා තීරණ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය හා නිර්දේශ සහිතව වාර්තා කරනු ලබයි.

සමාලෝචිත වර්ෂය තුළ පහත දැක්වෙන කාර්යන් පිළිබඳ නිර්දේශ අනුමත කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී.

1. මාසික මූල්‍ය හා භෞතික කාර්යසාධනය
2. වාර්ෂික ගිණුම්
3. වාර්ෂික අයවැය හා සංශෝධිත අයවැය
4. අභ්‍යන්තර විගණන හා විගණකාධිපතිගේ විගණන විමසුම් හා පිළිතුරු
5. පිරිස් හා පාලන කාර්යයන්
6. නීති කටයුතු
7. සේවක ණය, අත්තිකාරම් සහ ටෙන්ඩර් පිරිනැමීම

**ඩී. විජේසිරිවර්ධන**
සභාපති - විගණන හා කළමනාකරණ කමිටුව






# ව්‍යාපාරික


## සාරාංශය

## ආදායම් වර්ධන ප්‍රවනතා විශ්ලේෂණය

**අයභාරය - බදු සහිත (රු. 000)**





**අයභාරය - බදු රහිත (රු. 000)**





## ලාභ වර්ධන ප්‍රවනතා විශ්ලේෂණය


**දල ලාභය (රු. 000)**




**ආදායම් සහ භාණ්ඩාගාර බදු පෙර ශුද්ධ ලාභය (රු. 000)**





**මෙහෙයුම් ලාභය (රු. 000)**





## නිෂ්පාදනය වර්ධනය වීමේ ප්‍රවනතා විශ්ලේෂණය

**කඳන් නිෂ්පාදනය (ඝ.මී.)**





**ඉරූ දැව නිෂ්පාදනය (ඝ.මී.)**








**විදුලි සම්ප්‍රේෂණ කණු නිෂ්පාදනය (ඒකක)**





**සිල්පර නිෂ්පාදනය (ඒකක)**




**අලි වැට කණු නිෂ්පාදනය (ඒකක)**





**ගෘහ භාණ්ඩ නිෂ්පාදනය (රු.මි)**





## අගය එකතු කිරීම


2015




2016




2017





## මහෝගනී (සිහින් පත්‍ර)

බටහිර ඉන්දීය මහෝගනී ලෙස හඳුන්වන සිහින් පත්‍ර සහිත මහෝගනී ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ බහුලව දැකගත හැකිය. ශ්‍රී ලංකාවට නිවර්තන දේශගුණික ඇමරිකානු රටවලින් හඳුන්වා දී ඇත. Swietenia ඝණය යටතේ විශේෂ තුනකි. (S.macrophylla iy S.humilis) සිහින් පත්‍ර මහෝගනී ශාකය දකුණු ජලෝරිඩාව, ඇමෙරිකාව, කියුබාව, ජැමෙයිකාව නිජබිම වූ ශාකයකි. ඩොමිනියන් ජනරජයේ ජාතික පුෂ්පය ද වන්නේ සිහින් පත්‍ර සහිත මහෝගනී ශාකයේ පුෂ්පයයි. අර්ධ සදාහරිත මධ්‍යම ප්‍රමාණයේ මීටර් 30 35 උසැති මෙම මහෝගනී ගසෙහි දැව මීට වසර 400කට ප්‍රථම ද ජාත්‍යන්තර වශයෙන් වෙළඳාම් කර ඇත. වසර 1795 දී ඉන්දියාවට හඳුන්වා දුන් ශාකයකි. දැවයෙහි බාහිර පෙනුව, වැඩ කිරීමේ පහසුව, දැවවල ස්ථායීතාව සහ අනර්ඝ නිමාව ආදිය මෙම දැවව. උසස් ගතිගුණ අතර වේ.

*උපුටාගැනීම*
**ශ්‍රී ලංකාවේ දැව ශාක**
ආචාර්ය නිමල් රුවන්පතිරණ

# දශකයක තොරතුරු

| (නිරපේක්ෂ සංඛ්‍යා) | | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මුළු වාර්ෂික ආදායම | රු. '000 | 2,986,925 | 3,445,141 | 3,616,164 | 3,103,744 | 3,563,390 | 3,213,644 | 3,756,482 | 4,132,052 | 4,522,238 | 4,630,718 |
| වාර්ෂික දල ලාභය | රු. '000 | 1,210,845 | 1,351,695 | 1,365,285 | 1,237,640 | 1,546,107 | 1,197,615 | 1,453,451 | 1,757,115 | 2,045,090 | 2,075,950 |
| භාණ්ඩාගාර සහ ආදායම් බදු පෙර ලාභය | රු. '000 | 647,039 | 810,612 | 877,623 | 603,499 | 801,681 | 382,337 | 427,222 | 768,699 | 659,732 | 966,804 |
| මුළු සේවක පිරිවැය | රු. '000 | 852,879 | 898,652 | 901,910 | 953,498 | 1,065,052 | 1,117,036 | 1,254,516 | 1,449,746 | 1,789,572 | 1,572,775 |
| වාර්ෂික ප්‍රාග්ධන වියදම් | රු. '000 | 141,327 | 112,909 | 237,332 | 180,546 | 162,509 | 332,870 | 115,132 | 244,929 | 113,675 | 94,637 |
| වර්ෂාවසාන ජංගම නොවන වත්කම් | රු. '000 | 1,523,553 | 1,793,467 | 1,801,988 | 1,739,893 | 1,479,880 | 1,658,535 | 1,654,908 | 1,743,580 | 1,732,640 | 1,894,597 |
| වර්ෂාවසාන ජංගම වත්කම් | රු. '000 | 1,407,022 | 2,079,543 | 2,341,020 | 2,177,892 | 2,929,185 | 3,153,777 | 4,004,860 | 4,115,259 | 3,652,116 | 4,423,105 |
| වර්ෂාවසාන ජංගම වගකීම් | රු. '000 | 455,460 | 1,028,979 | 1,034,258 | 497,229 | 804,102 | 1,050,258 | 1,591,991 | 1,480,966 | 897,087 | 1,234,716 |
| වර්ෂාවසාන ජංගම නොවන වගකීම් | රු. '000 | 362,399 | 364,553 | 399,057 | 399,953 | 409,030 | 384,831 | 484,649 | 424,854 | 499,373 | 852,292 |
| වර්ෂාවසාන ස්කන්ධය | රු. '000 | 2,112,716 | 2,479,478 | 2,709,694 | 3,020,602 | 3,195,933 | 3,377,223 | 3,583,129 | 3,953,019 | 3,988,297 | 4,230,694 |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | රු. '000 | 75,000 | 50,000 | 413,490 | 75,000 | 600,000 | 50,000 | 25,000 | 50,000 | 175,000 | 100,000 |
| වර්ෂාවසාන සේවක සංඛ්‍යාව | සංඛ්‍යාව | 2,499 | 2,457 | 2,346 | 2,267 | 2,187 | 2,139 | 2,186 | 2,145 | 2,125 | 2,083 |
| වර්ෂාවසාන අතිරික්ත අරමුදල් ආයෝජන ශේෂය | රු. '000 | 777,101 | 858,717 | 605,235 | 764,328 | 298,546 | 338,010 | 360,227 | 382,550 | 405,727 | 431,404 |

| ප්‍රධාන ක්‍රියාකාරී දර්ශක | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස්කන්ධයට භාණ්ඩාගාර සහ ආදායම් බදු පෙර ශුද්ධ ලාභය | % | 30.63 | 32.69 | 32.39 | 19.98 | 25.08 | 11.32 | 11.92 | 19.45 | 16.54 | 22.85 |
| මුළු වත්කම්වලට භාණ්ඩාගාර සහ ආදායම් බදු පෙර ශුද්ධ ලාභය | % | 22.08 | 20.93 | 21.18 | 15.40 | 18.18 | 7.94 | 7.55 | 13.12 | 12.25 | 15.30 |
| ජංගම අනුපාතය | වාර ගණන | 3.09 | 2.02 | 2.26 | 4.38 | 3.64 | 3.00 | 2.52 | 2.78 | 4.07 | 3.58 |
| එක් සේවකයෙකුට සේවක පිරිවැය | රු. '000 | 341.29 | 365.75 | 384.45 | 420.60 | 486.99 | 522.22 | 573.89 | 675.87 | 842.15 | 755.05 |
| ස්කන්ධයට වත්කම් අනුපාතය | වාර ගණන | 0.72 | 0.64 | 0.65 | 0.77 | 0.72 | 0.70 | 0.63 | 0.67 | 0.74 | 0.67 |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපතය | % | 9.62 | 9.26 | 5.32 | 7.68 | 3.73 | 3.78 | 3.64 | 6.31 | 0.66 | 3.84 |
| මුළු පිරිවැටුම් වර්ධනය | % | 17.99 | 15.34 | 4.96 | (14.17) | 14.81 | (9.81) | 16.89 | 10.00 | 9.44 | 2.40 |





# ජාතික ආර්ථිකයට දායකත්වය

රාජ්‍ය දැව සංස්ථාව දැව කර්මාන්තයේ නායකයෙකු ලෙස ක්‍රියාත්මක වන අතර ආර්ථික සංවර්ධනය කිරීමෙහිලා වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. සංස්ථාව දැව කර්මානතයේ පමණක් නොව වෙනත් කර්මාන්තයන්ගේ ද සංවර්ධනය සඳහා විශාල කාර්යභාරයක් ඉටුකරයි. 2017 වසරේ දී රාජ්‍ය දැව සංස්ථාව ස්කන්ධභාග, මෙහෙයුම් බදු, ආදායම් බදු හා වෙනත් බදු ලෙස රු. මිලියන 2,055 ක දායකත්වයක් ජාතික ආර්ථිකයට ලබාදීමට සමත් වී ඇත.

පසුගිය වසර 5 ක සාරාංශය පහත පරිදිය,

| | 2013 (රු.) | 2014 (රු.) | 2015 (රු.) | 2016 (රු.) | 2017 (රු.) |
|---|---|---|---|---|---|
| ස්කන්ධභාග | 706,779,429 | 743,675,772 | 891,797,062 | 1,660,491,515 | 1,050,000,000 |
| VAT/NBT/ESC/ WHT | 387,928,678 | 424,740,460 | 418,055,273 | 548,197,399 | 687,443,947 |
| ආදායම් බදු | 131,882,763 | 202,347,603 | 234,000,000 | 538,767,780 | 217,089,232 |
| විශේෂ බදු | 50,000,000 | 25,000,000 | 50,000,000 | 175,000,000 | 100,000,000 |
| **එකතුව** | **1,276,590,870** | **1,395,763,835** | **1593,852,335** | **2,922,456,694** | **2,054,533,179** |

ආර්ථික සංවර්ධනයෙහිලා රාජ්‍ය දැව සංස්ථාවේ කාර්යභාරය පහත පරිදි දැක්විය හැක.

රාජ්‍ය දැව සංස්ථාව දුෂ්කර හා අඩු ආදායම් ලාභීන් වෙසෙන ප්‍රදේශවල ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම මගින් සෘජු හා වක්‍ර රැකියා අවස්ථා සපයන අතර, එමගින් කලාපීය සංවර්ධනය ප්‍රවර්ධනය කරයි. උසස් තත්වයේ භාණ්ඩ සාධාරණ මිලට සැපයීම සහ නිෂ්පාදන පෙළට නවීනතම නවෝත්පාදනයන් ඉදිරිපත් කරමින් රාජ්‍ය දැව සංස්ථාව විසින් ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම මූලික අරමුණ කොට ඇත. දැව වෙළඳපොල තුළ ඒකාධිකාරය වර්ධනය අඩු කිරීම හා භූගෝලීය ප්‍රදේශවලට ධනය හා ආදායම් සාධාරණ ලෙස බෙදාහැරීමට කටයුතු කිරීමත්, තිරසාර සංවර්ධනය දිරිමත් කිරීම හා යහපත් පාරිසරික පරිචයන් ප්‍රවර්ධනය කිරීම සඳහා වගකිව යුතු පුද්ගලයෙකු ලෙස කටයුතු කරයි. වර්තමාන පරම්පරාවේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා වනසංරක්ෂණයත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස සම්පත් උපයෝජනය කිරීමේ වගකීමත් රාජ්‍ය දැව සංස්ථාව සතුය.



# කොස්

කොස් ගස (බත් ගස) ශ්‍රී ලාංකීය අපහට කොතරම් සමීප ප්‍රයෝජනවත් ගසක් වුව ද මෙහි නිජබිම ඉන්දියාවේ සහ මැලේසියාවේ වර්ෂා වනාන්තර වේ. ශ්‍රී ලංකාවට ඉන්දියාවෙන් හඳුන්වා දුන් ශාකයකි. වයස අවුරුදු 4 -8 ක් අතර ගසකින් ඵල ලබාගත හැකිය. බංගලිදේශයේ ජාතික පළතුර ලෙස කොස් ඵලය නම් කිරීමෙන් කොස් ගසට නිසි ගෞරවය ලබා දී ඇත. ලෝකයේ ඇති පළතුරු වලින් ගසක උපත ලබන විශාලතම පළතුර ලෙස (සෙන්ටි මීටර් 90 ක් දිග සෙන්ටි මීටර 50 ක විෂ්කම්භය ඇති කිලෝ ග්‍රෑම් 36 බරැති ඵලයක්) වර්ධනය වීමෙන් කොස් ඵලය වාර්තා තබා ඇත. කරුණු එසේ වුවත් බ්‍රසීලයේ වන උයන්වල කොස් ගසෙහි අධික ව්‍යාප්තිය හේතුවෙන් සිදු වී ඇති තර්ජනය නිසා ආක්‍රමණික ශාකයක් ලෙස නම් කර ඇත. ශ්‍රී ලංකාව තුළ ආහාර ආරක්ෂිත පනත මගින් කොස් ගස කැපීම සඳහා බලපත්‍ර ලබාගත යුතුය. වැල සහ වරකා ලෙස කොස් ප්‍රභේද දෙකක් හඳුනාගත හැකිය.

*උපුටාගැනීම*
**ශ්‍රී ලංකාවේ දැව ශාක**
ආචාර්ය නිමල් රුවන්පතිරණ



## ආයතනික සමාජීය වගකීම

පරිසර හිතකාමීව කටයුතු කරන ව්‍යාපාරයන් සමඟ යහපත් සබඳතා වර්ධන කර ගනිමින් ව්‍යාපාර කටයුතු වල නිරතවීම රාජ්‍ය දැව සංස්ථා අරමුණු අතර වේ. ව්‍යාපාරයන් සෑමවිටම ඔවුන්ගේ ව්‍යාපාරයේ ලාභය හා වර්ධනය ගැන සිතා බලන නමුත් වර්තමානයේ බොහෝ ව්‍යාපාර තමන්ගේ මෙහෙයුම් කටයුතු වල සමාජීය සහ පාරිසරික බලපෑම්වල වගකීම භාරගෙන තිබේ. සමාජීය, ආර්ථික හා පාරිසරික ගැටළු වලට මූලිකව සම්බන්ධ වන එකී ක්‍රියාකාරකම් එහි වටිනාකම් සංවිධානාත්මක සංස්කෘතිය හා ක්‍රියාකාරකම් නියෝජනය කරයි. පරිසර හිතකාමී ක්‍රියාකාරකම් නිෂ්පාදන හා සේවා සැපයීම් කෙරෙහි ප්‍රමාණවත් ලෙස අවධානය යොමු කර ඇති අතර, වර්තමාන පාරිසරික ගැටළු පිළිබඳව අවධානය යොමු කරමින් සිය ලාභ පවත්වා ගැනීමට සංස්ථාව කටයුතු කරයි. සියලුම ඇල්මැති පාර්ශවයන් කෙරෙහි ආර්ථික සමාජීය හා පාරිසරික ප්‍රතිලාභයන් ජනිත කිරීම තුලින් සිය සමාජ වගකීම් ඉටු කිරීමෙන් තිරසාර සංවර්ධනය සඳහා සංස්ථාව මෙහෙයවනු ලබයි. පුද්ගල ජීවන තත්වය උසස් කිරීමේ අරමුණින් මෙන් ම අනාගත පරම්පරාවන්ට සාධාරණ හා යුක්ති සහගත වන ආකාරයෙන් ව්‍යාපාර කටයුතු සිදුකිරීමට වගබලා ගන්නා ලදී. සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය දැව සංස්ථාව වගකිව යුතු ආයතනයක් ලෙස පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

### සමාජය හා පරිසරය

රාජ්‍ය දැව සංස්ථාව තිරසාර සමාජයක් සංවර්ධනය කිරීම සඳහා වගකිව යුතු ව්‍යාපාරයක් ලෙස සිය දායකත්වය සපයයි. සමාජයට දායකවීම යනු අපගේ දැව නිෂ්පාදන භාවිතා කර පාරිභෝගිකයන්ට යම් ආකාරයක පාරිසරික ප්‍රතිලාභයක් හෝ වැඩිදියුණු කිරීමක් සහතික කිරීමට අපගේ කැපවීමයි. සමාජ වගකීමත් සමඟ දැව කර්මාන්තයේ තරග කරන විට දෛනික අභියෝගවලට මුහුණදීමේ දී "යහපත් ව්‍යාපාරිකයින්" ලෙස ක්‍රියාකිරීම දැක්විය හැක. පරිසරය ආරක්ෂා කිරීම සහ මහජන යහපත වැඩි කිරීම සඳහා සංස්ථාව විසින් පියවර ගනු ලබන අතර, සමාජයේ තිරසාර සංවර්ධනය සඳහා ක්‍රියාකාරී දායකත්වයක් ලබාදෙයි. ව්‍යාපාරයේ සංවර්ධන ක්‍රියාවලිය තුළ අපගේ ව්‍යාපාරයේ යහපත් පාරිසරික පරිචයන් ප්‍රවර්ධනය කිරීමට අපි කැපවී සිටිමු. තිරසාර හා පරිසර හිතකාමී අයුරින් අපගේ ක්‍රියාකාරිත්වය පවත්වා ගෙනයාම සඳහා අප විසින් ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති හා භාවිතයන් ස්ථාපිත කිරීම තුළින් අප විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සමාජීය වගකීම්වල වැදගත්කම පිළිබඳ පූර්ණ අවබෝධයෙන් යුතුව පරිසර සංරක්ෂණය වැනි තිරසාර පාරිසරික ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.

සමාජය යන්න ප්‍රජාව හෝ කිසියම් ජාතියක් හෝ පුළුල් සාමූහික ක්‍රියාකාරකම් සහිත පුද්ගල කණ්ඩායමක් පොදු සාරධර්ම, සම්ප්‍රදායන්, ආයතනය සහ සාමූහික ක්‍රියාකාරකම් හා රුචිකත්වයන් සහිත දැක්විය හැක. සමාජ සංස්කෘතික වැඩසටහන් තරුණ ක්‍රියාකාරකම් ශිෂ්‍ය හා සමාජ ක්‍රියාකාරකම් සඳහා සැලකිය යුතු සහයෝගයක් සැපයීම මගින් සංස්ථාව කැපීපෙනෙන මෙහෙවරක් ඉටු කළේය. සියලු දෙනා සමඟ මනා සබඳතා ප්‍රවර්ධනය කරමින් ජනතාවගේ සංස්කෘතික ජීවන රටාව හා උරුමය ආරක්ෂා වන අයුරින් ඔවුන්ගේ ජීවන තත්වය හා අවස්ථා වැඩිදියුණු කරලීම තහවුරු කරයි.

### වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්


- "පුනරුදය" වැඩසටහන යටතේ පවත්වන ලද "වනරෝපා" ජාතික රුක්රෝපණ වැඩ සටහනට ක්‍රියාකාරී දායකත්වය.
  - පාසැල්, විශ්වවිද්‍යාල, රාජ්‍ය ආයතන ත්‍රිවිධ හමුදා වැනි විවිධ ආයතන හා පුද්ගලයින් සඳහා පැළ 52,735 බෙදා දෙන ලදී.
- ලෝක පාරිසරික දිනය සැමරීම සඳහා වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී.
  - මාතර, මොණරාගල, බණ්ඩාරවෙල, රත්නපුර, නුවරඑළිය යන දිස්ත්‍රික්කවල තෝරාගත් පාසල් සඳහා "තුරුජන සිසු බැංකු" වැඩසටහන යටතේ කෘෂි උපකරණ කට්ටල බෙදා දෙන ලදී.
  - කළුතර දිස්ත්‍රික්කයේ ගංවතුර පීඩාවට පත් ප්‍රදේශව ජීවත් වන ජනතාව සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය බෙදා දෙන ලදී.
  - පැළ කොටු 50 ක් බෙදා දෙන ලදී.
  - ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය සඳහා ලී නාමපුවරු සැපයීම.
  - මොරගහකන්ද - කළුගඟ අශ්‍රිත කළුවර, කුඹුක් හා මී ශාක වගාකිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.
- දැව සහ දැව ආශ්‍රිත නිෂ්පාදන තිරසාර පරිභෝජනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
  - දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන තිරසාරව භාවිතා කිරීම පිළබඳ පාසැල් ගුරුවරුන් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් 14 ක් දියත් කළ අතර, දැව ආශ්‍රිත පත්‍රිකා 500 ක් පමණ බෙදාහරින ලදී.
  - ගුරුවරුන් දැනුවත් කිරීම සඳහා දේශන 42 ක් පවත්වන ලදී.
- දැව හා දැව ආශ්‍රිත මාතෘකා පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම සඳහාත් තිරසාර සංවර්ධනය කෙරෙහි සංස්ථාවේ කාර්ය භාරය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සඳහාත් ජාතික රූපවාහිනයේ "දහරා", දෙරණ නාලිකාවේ "අනාගතයට ඉඩක්" යනාදී රූපවාහිනි වැඩසටහන් 06 ක් සහ රජරට සේවයේ "කෙලින් පාර" යන ගුවන් විදුලි වැඩසටහනක් ද පවත්වන ලදී.
- හරිත ගොඩනැගිලි සහතිකය සඳහා හරිත ගොඩනැගිලි සංකල්පය ආශ්‍රිත මාර්ගෝපදේශයන්ට අනුගත වෙමින් අදාල ලියකියවිලි ද සහ පෝරමය ද සහිතව සම්පූර්ණ වාර්තාවක් සම්පූර්ණ කරන ලදී.
- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශය මගින් බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද "Sri Lanka Next" වැඩසටහනට දායකත්වය දරණ ලදී.
- සේවකයින් විසින් ලියන ලද දැව හා දැව කර්මාන්තයට අදාලව පර්යේෂණ ලිපි, පුවත්පත් සහ සඟරා ලිපි ප්‍රකාශයට පත්කරන ලදී. එහිදී පහත සඳහන් මාතෘකා යටතේ පර්යේෂණ ලිපි ඉදිරිපත් කරන ලදී.
  - Finger joint timber products for effective utilization of natural resources
  - Properties of finger jointed timber of softwood timber species in Sri Lanka.
  - Application of non class timber in construction industry
  - Utilization of waste timber in construction industry.
- දැව ආශ්‍රිත පරීක්ෂණ සඳහා සහතික නිකුත් කර ඇති අතර පාරිභෝගිකයින්ගේ ඉල්ලීම අනුව වර්ෂය තුළදී වාර්තා 180 ක් නිකුත් කර ඇත.
- දැව තාක්ෂණික පුහුණු ආයතනය හරහා ආයතනය තුළ සේවකයින් උනන්දු කරවීම සඳහා සේවකයන් 188 දෙනෙකු පුහුණු කර වූ අතර, 2017 වසර සඳහා වන වියදම රු.1,092,990/- කි.
- දිළිඳුකම පිටුදැකීම මගින් අඩු ආදායම්ලාභි පවුල්වලට ජීවන තත්වයන් උසස් කිරීම අරමුණු කරගනිමින් 2017 දී අඩු ආදායම්ලාභී තරුණ වඩුවන් සඳහා ගෘහභාණ්ඩ නිෂ්පාදනය කිරීමේ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. මෙය යටතේ පලමුවන අදියරදී වඩු කාර්මිකයන් 35 දෙනෙක් ප්‍රායෝගික පුහුණුව සමඟින් පුහුණුව අවසන් කර ඇත.



# අවදානම් කළමනාකරණය

රාජ්‍ය දැව සංස්ථාව විසින් නිසිලෙස අවදානම් කළමනාකරණය කරමින් එහි අරමුණු හා පරමාර්ථ සැබෑකරගැනීමේ ප්‍රයත්නයක නියැලෙමින් සිටී. සීග්‍රයෙන් වෙනස්වන වර්තමාන පරිසරය තුල ඇතිවන අවදානම් කළමනාකරණය කිරීම අනාගත පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය කටයුත්තකි. අවදානම් සම්පූර්ණයෙන් ඉවත් කළ නොහැක. නමුත් ඒවා අවමකර ගත හැක. එමනිසා අවදානම් අවම කිරීම පිළිබඳ වැඩි අවධානයක් යොමුකිරීම සඳහා සංස්ථාව විසින් නොයෙකුත් ක්‍රියාමාර්ග දියත් කොට ඇත.

## අවදානම් කළමණාකරන ක්‍රියාවලිය






| අවදානම් හඳුනාගැනීම | ආයතනයේ පරමාර්ථ | අවදානම් ප්‍රතිකාර |
|---|---|---|
| **මූල්‍ය අවදානම් කළමනාකරණය** | | |
| 01. ද්‍රවශීලතාවය හා මූල්‍ය කළමනාකරණය | යහපත් ද්‍රවශීලතා මට්ටමක් පවත්වා ගෙන යාම | ක්‍රමවත් ණය අයකරගැනීමේ ප්‍රතිපත්තියක් තුලින් බොල් ණය සහ ණයගැති ශේෂ ඉහළයාම වැලැක්වීම. |
| | | මුදල් ප්‍රවාහ පුරෝකථනය සහ ප්‍රමාණවත් මුදල් සහ මුදල් සමාන වත්කම් ශේෂ පවත්වාගැනීම. |
| | | සංස්ථාවේ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම මධ්‍යගත කොට ඇත. |
| | | වියදම් පාලනය කිරීම සඳහා උචිත බලතල ස්ථාපිත කිරීම. |
| 02. පොළී අනුපාතය මත අවදානම | පොළී අනුපාත වෙනස්වීමෙන් ඇතිවන බලපෑම් අවම කරගැනීම | බැංකු සමඟ සාකච්ඡා කොට එකඟතාවයකට පැමිණ සංස්ථාවේ ආයෝජනයන් මත ඉහල පොළී අනුපාත ලබාගැනීම සඳහා කටයුතු කිරීම |
| | | සැපයුම්කරුවන්ගෙන් පොළී රහිතව යම්කිසි කාල සීමාවකට යටත්ව ණයට භාණ්ඩ ලබාගැනීමටත්, එමගින් අධික පිරිවැය සහ පොළී අනුපාතවල උච්චාවචනයන් වලක්වා ගැනීමටත් ක්‍රියාකිරීම |
| 03. මුදල් අවදානම | විදේශ විනිමය අනුපාත වෙනස්වීමෙන් ආනයන හා අපනයන සඳහා වන බලපෑම් අවම කරගැනීම | විදේශීය විනිමය උච්ඡාවචනයන් පිළිබඳ නිරීක්ෂණය කර ආනයන හා අපනයන ක්‍රමවත්ව සැලසුම් කිරීම |
| **ව්‍යාපාර අවදානම කලමණාකරණය** | | |
| 01. ණය අවදානම | ණයගැතියන්ගෙන් ණය අයකර ගත නොහැකිව ඇති වන අවදානම් අවම කිරීම | අඩමාන ණය වෙන්කිරීම සහ විමර්ශනය සඳහා සංස්ථාව විසින් විධිමත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලබයි. |
| | | බොහෝවිට මුදල් මත පමණක් විකුණුම් සිදුකිරීමට වගබලා ගන්නා අතර, ණයට විකුණුම් සිදුකරනුයේ සංස්ථාවේ ණයට විකුණුම් ප්‍රතිපත්ති අනුගමනය කරමින් ය. |
| | | සියලු ලැබිය යුතු හා ගෙවිය යුතු ණයගැති හා ණයහිමි ගිණුම් පිළිබඳ නිරන්තර අවධානය යොමුකර ඇත. |
| | | තනි පුද්ගලයන් සඳහා බොහෝවිට ණයට විකුණුම් කරනු නොලබන අතර, නව අලෙවිකරණ උපක්‍රමයක් ලෙස රාජ්‍ය සේවකයන් සඳහා පමණක් සහනදායී පොළී අනුපාතයන්ට ප්‍රසාද අභිමාණී ණය ක්‍රමය යටතේ භාණ්ඩ ණයට විකුණුම් කරනු ලැබේ. |
| | | රාජ්‍ය ආයතන සඳහා පමණක් ණයට විකුණුම් සිදුකරයි. බොහෝවිට මහා භාණ්ඩාගාර හුවමාරුව යටතේ ගිණුම් පියවීම සිදුකරනු ලබයි. |
| | | නිරතුරුව අධීක්ෂණය කළ හැකි හා ණය අයකරගැනීමේ ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම |
| 02. වත්කම් අවදානම | වත්කම් වලින් සිදුවන අලාභ අවම කරගැනීම. එනම්, විශේෂයෙන් යන්ත්‍ර සූත්‍ර ක්‍රියාවිරහිතවීම්, ගින්නෙන්, හදිසි අනතුරු වලින් සේවකයන්ගෙන් හා සොර සතුරු උවදුරු වලින් වත්කම් වලට ඇතිවිය හැකි හානි අවම කිරීම. | සියලුම අවදානම් අංශයන් ආවරණය වන පරිදි රක්ෂණාවරණයන් වත්කම් සඳහා ලබාගැනීම. |
| | | සැලසුම්ගත නඩත්තු කිරීමේ වැඩසටහනක් යටතේ වත්කම් නඩත්තුව සිදුකිරීම. |

| | | |
|---|---|---|
| 03. අභ්‍යන්තර පාලනයන් | ක්‍රමවත් සහ විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වා ගැනීම තුලින් සංස්ථාවේ වත්කම් සුරක්ෂිත කිරීම සහ දැනට පවත්නා ක්‍රියාවලිය තුල පවත්නා දුර්වලතා සහ ඒවායේ අවදානම් අවම කිරීමට උචිත පියවර ගැනීම. | නිරන්තරව කාල සටහනකට අනුව නියමාකාරයෙන් අභ්‍යන්තර විගණනයන් සිදුකිරීම වෙනුවෙන් අභ්‍යන්තර විගණන අංශය කැපවීමෙන් කටයුතු කිරීම |
| | | රාජ්‍ය අංශයේ ව්‍යාපාරික ආයතනයක් ලෙස සුදුසු පාලන පද්ධතියක් පවත්වාගැනීම. විශේෂයෙන් මුදල් ගෙවීම්, සැපයුම්කරුවන් තෝරාගැනීම්, සේවකයින් බඳවාග ැනීමේ ක්‍රියාවලි පිළිබඳ වැඩි අවධානයක් යොමුකිරීම. |
| | | සියලුම මූල්‍ය ක්‍රියාකාරකම් මූල්‍ය පනත් විධිවිධානයන්ට සහ පවත්නා නීති හා රෙගුලාසි අනුව සිදුකරනු ලබයි. |
| 04. මානව සම්පත | සේවක පිරිවැටුම අවම මට්ටමක පවත්වා ගැනීම | යහපත් සහ මිත්‍රශීලි වැඩ පරිසරයක් හැම සේවක මට්ටමක් අතරම පවත්වාගැනීම |
| | බාධාවන්ගෙන් තොරව මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව ඉටුකර ගැනීම | විවිධ ආකාරයේ සේවක ප්‍රතිලාභ ලබාදීම<br>උදා: පාවහන් දීමනාව |
| | පුහුණුවීම් සහ යහපත් පිළිවෙත් තුලින් ඵලදායී සේවාවක් ලබාගැනීම. | අවශ්‍ය අවස්ථාවලදී සේවකයින් විශේෂ සහ පොදු පුහුණු පාඨමාලා සඳහා යොමු කරනු ලැබේ. |
| | | රාජ්‍ය ආයතනයක් ලෙස විශේෂ ප්‍රතිපත්ති මාලාවකට අනුව නව සේවකයින් බඳවා ගනු ලැබේ. |
| 05. තාක්ෂණය සහ නිෂ්පාදිතවල ගුණාත්මකභාවය සම්බන්ධ අවදානම | නවීන තාක්‍ෂණය සහ තත්ව ප්‍රමිති පිළිබඳ වැඩි අවදානයක් යොමුකිරීම තුලින් ආයතනය තුල යල්පැනගිය ක්‍රම භාවිතය තුලින් ඇතිවන ගැටළු මඟහරවා ගැනීම. | දිගුකාලීන සැලසුම් වලට අනුව යල්පැනගිය යන්ත්‍ර වෙනුවට නව යන්ත්‍ර නිෂ්පාදනයට භාවිතා කිරීම |
| | භාණ්ඩ හා සේවා නියමිත ගුණාත්මකභාවයෙන් නොපැවතීම අවම කිරීම | අපගේ නිෂ්පාදන ජාතික සහ අන්තර්ජාතික මට්ටම් හා ගැලපෙන බවට අදාල ආයතනයන්ගේ සහතික ලබාගැනීම. |
| | | පර්යේෂණ හා සංවර්ධන අංශය මගින් පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සංස්ථාවේ අභිවෘද්ධිය උදෙසා සිදුකිරීම. |
| | | නිෂ්පාදන ගුණත්වය ආරක්‍ෂා කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ කටයුතු වෙනුවෙන් විIගාර පහසුකම් සැපයීම |
| | | බාහිර හා අභ්‍යන්තර විගණනයන් මගින් නිරතුරුව සොයාබැලීම |
| 06. තොග කළමනාකරණ අවදානම | තොග නොමැතිවීමෙන් සිදුවන අලාභ වලක්වා ගැනීම | මාසික විකුණුම් පුරෝකථනයන් සහ වාර්ෂික අයවැයගත නිෂ්පාදන ඉලක්ක පිළිබඳ සැලකිල්ලට ගෙන නිෂ්පාදන සැලසුම් කමිටු රුස්වීමේදී මාසික නිෂ්පාදනය ඉලක්ක තීරණය කෙරේ. |
| | සෙමින් චලනය වන තොග එක්රුස්වීමෙන් සිදුවන අලාභ අවම කිරීම | සෙමින් චලනයවන නිෂ්පාදිත අලෙවි කරගැනීම සඳහා විවිධ අලෙවිකරණ උපක්‍රම යෙදීම. උදා:- ප්‍රසාද අභිමාණී ගෘහභාණ්ඩ ණය යෝජනා ක්‍රමය වැනි අලෙවිකරණ උපාය මාර්ග. |
| | තොග රඳවා ගැනීමේ පිරිවැය අවම කිරීම. | නිෂ්පාදන ක්‍රියාවලිය විවිධ මට්ටම්ව.දී තත්ව පරීක්‍ෂණයන්ට භාජනය කොට නිමිභාණ්ඩ පාරිභොග කයන් අතට පත්වීම දක්වා ගුණත්වය සහතික කිරීම. |
| | | නිරතුරුව තොග විශ්ලේෂණය කොට සෙමින් චලනය වන තොග හඳුනාගෙන ඒවා ආදායම් ඉපැයීම සඳහා යොදාගැනීම. |
| | | අපතේ යන/ඉවත් කෙරෙන දැව කොටස් යොදාගෙන වෙනත් ආදායම් ප්‍රභවයන් ඇති කර ගැනීම. |




| | | |
|---|---|---|
| 07. වෙළෙඳපොල තරඟකාරීත්වය | අඩු ගුණත්වයෙන් යුත් ආනයනික දැව හා දැවමය භාණ්ඩ හේතුවෙන් වෙළෙඳපොල තරඟකාරීත්වය ඉහලයාමෙන් ඇති විය හැකි වෙළෙඳපොල කොටස අඩුවීම වැලැක්වීම. | පවතින තත්ව පාලන ප්‍රමිති වලට අනුකූල වන බවට හැමවිටම තහවුරු කර ගැනීම. |
| | ප්‍රධාන නිෂ්පාදිතවල විකුණුම් ආදායම ඉහළ නංවා ගැනීම. (එනම්, දැව කඳන්, ඉරූදැව, සිල්පර, විදුලි කණු හා අලිවැට කණු වැනි ආදායම්) | විවිධ පුවත්පත් දැන්වීම් සහ ප්‍රවර්ධන වැඩසටහන් මගින් තවදුරටත් රාජ්‍ය දැව සංස්ථාවේ නාමය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම. |
| | | නවෝත්පාදන වෙනුවෙන් පර්යේෂණ පැවැත්වීම මෙන්ම නව සංකල්ප ආයතනය තුළට ගෙනඒම තුලින් පාරිභෝගික ආකර්ශණය වැඩිකර ගැනීම.<br>වෙළෙඳපොල පර්යේෂණයන් තුලින් පාරිභෝගිකයන්ගේ අපේක්ෂාවන් හඳුනාගැනීම හා ඊට ගැලපෙන අයුරින් නිෂ්පාදන ඉදිරිපත් කිරීම. |
| 08. නීති හා රෙගුලාසි | නීති හා රෙගුලාසි වලට අනුකූල නොවීමෙන් සිදුවන අලාභ වලක්වා ගැනීම. | නීති හා රෙගුලාසි වලට අනුකූල වෙමින් කටයුතු කිරීම. |
| | නීති හා රෙගුලාසි වෙනස්වීමෙන් ඇතිවිය හැකි අවදානම් අවම කරගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.නෛතික පරිසරය තුල ඇති වන වෙනස්කම් වලට සාර්ථකව මුහුණදීම සඳහා ශක්තිමත්, ඵලදායී සහ නම්‍යශීලී වැඩ පරිසරයක් ඇති කිරීම. | අධ්‍යක්ෂවරු සහ අදාල බලධාරීන්ගේ උපදෙස් මත කටයුතු කිරීම |
| | | නීති ප්‍රතිපත්ති නැඹුරුතාවය පිළිබඳ අධීක්‍ෂණය කිරීම. |
| 09. ප්‍රාග්ධන ආයෝජන | වත්මන් සහ අනාගතයේ සැලසුම් කොට ඇති ආයෝජන වලින් සිදුවන අලාභ අවම කිරීම. | වත්කම්වල ආයෝජන කිරීමේදී නියමිත පරිදි සැලසුම් කොට සංස්ථාවේ අයවැයට අනුකූලව කටයුතු කිරීම |
| | | පවත්නා සියලුම වත්කම් උපරිම ලෙස උපයෝජනය |
| | | ප්‍රාග්ධන ආයෝජන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය අංශයේ ව්‍යාපාරයක් ලෙස වගකීමෙන් කටයුතු කිරීම. |
| 10. පරිසරය | සංස්ථාවේ මෙහෙයුම් වලින් පරිසරයට සිදුවන අහිතකර ප්‍රතිවිපාක අවම කිරීම. | පාරිසරික ප්‍රතිපත්ති තීරණය කරන ආයතනවල ප්‍රතිපත්ති වලට අනුකූල බව තහවුරු කර ගැනීම. |
| | සංස්ථාවේ පාරිසරික ප්‍රතිපත්තිවලට අනුව කටයුතු කිරීම. | පරිසරය කෙරෙහි ඇල්මැති පාර්ශවයන් සමඟ ශක්තිමත් සම්බන්ධතාවයක් ඇති කර ගැනීම. |



# කුඹුක්

කුඹුක් ශාකය ශ්‍රී ලංකාවට දේශීය වූ ශාකයකි. Terminalia ඝණයට අයත් විශේෂ 100 ක් පමණ ඇති අතර, කුඹුක් ඉන්දියාවේ බොහෝ ප්‍රදේශවල සහ ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගංගා ආශ්‍රිතව දැකගත හැකි අලංකාර විශාල ප්‍රමාණයේ දැවමය ශාකයකි. සදාහරිත ශාකයක් වන මෙම ශාකයේ කඳෙහි ඇටුවම (Buttressed) සහිත වන අතර, අතු විශාල ප්‍රදේශයක පැතිරී පවතී. ශාකයේ සෑම කොටසක් ම ආයුර්වේදයේ සහ පුරාණ වෛද්‍ය විද්‍යාවේදී ප්‍රයෝජනයට ගන්නා අතර, විශේෂයෙන් ම හෘද රෝග, මුත්‍ර අමාරු ඇතුළු රෝග බොහෝ සංඛ්‍යාවකට ඖෂධයක් ලෙස ඉහළ වටිනාකමක් හිමිව ඇත. කඳේ පොත්තේ 25% පමණ ටැනින් අඩංගුවීම මෙහි තවත් විශේෂත්වයකි. පත්‍රවල ඇති කැල්සියම් හේතුවෙන් ගස් යට ඇති පසෙහි කැල්සියම් ඉහළ අගයක් ගනී.

*උපුටාගැනීම*
**ශ්‍රී ලංකාවේ දැව ශාක**
ආචාර්ය නිමල් රුවන්පතිරණ



# විගණකාධිපති වාර්තාව

රාජ්‍ය දැව සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව



විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. : අයිර්එන්/සී/එස්ටීසී/1/18/193

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2018 සැප්තැම්බර් 18 දින

සභාපති කාර්යාලය 19 SEP 2018 රාජ්‍ය දැව සංස්ථාව

සභාපති,
රාජ්‍ය දැව සංස්ථාව.

**රාජ්‍ය දැව සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

16 OCT 2018 (11)

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

පිටපත් :- 1. ලේකම්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
2. ලේකම්, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT


මගේ අංකය / எனது இல. / My No. } අයිර්එන්/සී/එස්ටීසී/ 1/18/193

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 සැප්තැම්බර් 18 දින

සභාපති,

රාජ්‍ය දැව සංස්ථාව.

**රාජ්‍ය දැව සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

රාජ්‍ය දැව සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තිරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනිකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ අංක 29 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla. Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk






**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකිම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබද සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.
මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයිම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වා ගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017දෙසැම්බර් 31 දිනට රාජ්‍ය දැව සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

----------------------------------

ප්‍රමිතයේ 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායි ජිව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරිම හේතුවෙන් පිරිවැය රු. 227,566,848 ක් වු වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්විමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු රු. 5,630,297 ක් වූ ආර්ථික සේවා ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේ මිලදි ගත් රු. 915,178 ක් වූ ඉරුම් තල වටිනාකම පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ යටතේ දක්වා තිබුණි.





(ඇ) කල්දෙමුල්ල අට්ටිමඩුවේ සවිකරන ලද යකඩ රාක්ක නැවත සකස් කිරීම වෙනුවෙන් දරන ලද රු. 834,124 ක වියදම ලාභාලාභ ප්‍රකාශයට ගැලපීම වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම් ගත කර තිබුණි.

#### 2.2.3 නොසැසඳූ පාලන ගිණුම්

------------------------

2016 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ විවිධ ණයහිමියෝ ලෙස රු.75,458,361 ක් වූ ශේෂයක් සමාලෝචිත වර්ෂයේදී ඉදිරියට ගෙනැවිත් තිබුණු අතර 2016 වර්ෂයේදී හෝ සමාලෝචිත වර්ෂයේදී ණයහිමියන් ලෙස ඇතුලත් නොවූ වියදම් සඳහාද විවිධ ණයහිමි ගිණුම මගින් ගෙවීම් සිදුකර තිබුණි. තවද 2016 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද ප්‍රධාන කාර්යාලයේ ණයහිමි උපලේඛනයේ ඇතුලත් ඇතැම් ණයහිමි ශේෂ සඳහා සමාලෝචිත වර්ෂය තුලදී ගෙවීම් සිදුකර නොතිබුණු අතර එම ශේෂයන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයහිමි උපලේඛනය තුල ඇතුලත්ව නොතිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.130,272,172 ක් වූ විවිධ ණයහිමි ශේෂයෙහි නිවැරදිතාවය ගැටළු සහගත විය.

#### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු හා එකතු කල අගය මත බදු ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු.50,386,639 ක් වු අතර අදාල බදු වාර්තා අනුව රු. 52,558,485 ක් වුයෙන් රු.2,171,846 ක වෙනසක් නිරික්ෂණය විය.

(ආ) සේවක භාරකාර අරමුදල්, සේවක අර්ථ සාධක අරමුදල්, ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල් සහ ගෙවිය යුතු සේවක අර්ථ සාධක අරමුදල් යන ගිණුම් විෂයයන් 04 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ හා උපලේඛන අනුව ශේෂවල එකතුව රු. 1,450,440 ක වෙනසක් නිරික්ෂණය විය.

### 2.2.5 විගණන සාක්ෂි

වර්ෂ ගණනාවක සිට විචලනය වෙමින් ඉදිරියට ගෙනඑමින් පවතින වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට කලයුතු ගෙවීම් සඳහා වූ වෙන්කිරීම් ලෙස රු.39,531,327 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ විවිධ ණයහිමි ගිණුමේ දක්වා තිබූ අතර එම ශේෂයට අදාල විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂය තුල 1983 වර්ෂයේ සිට පෞද්ගලික සමාගමකින් අයවිය යුතු රු. 11,873,954 ක් හා රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලින් අයවිය යුතු වර්ෂ 5 ඉක්මවූ රු. 11,003,176 ක ශේෂ පැවති අතර ඒවා අයකර ගැනිමට සමාලෝචිත වර්ෂය තුලදිද කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේ සිට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ගොඩනැගිලි කුලී රු.19,980,000 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ ප්‍රාදේශීය කාර්යාලයන්හි සේවකයන්ට ගෙවිය යුතු රු. 1,226,970 ක වැටුප් හා වේතන 2018 ජුනි වන විටද ගෙවා නිරවුල් කර නොතිබුණි.





NAOSL ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

### 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 371 හා 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වසර 04 ඉක්මවා තිබුණු සංස්ථාවේ වැඩබිම් සඳහා ලබා දුන් රු. 11,491,279 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම 2018 මැයි වන විටත් පියවා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571 | වර්ෂ 2 ක් ඉක්මවූ තැන්පතු රු. 133,800 ක්, වර්ෂ 02 ක සිට වර්ෂ 05 ක් අතර කාලයක් ඉක්මවූ ආරක්ෂිත තැන්පතු රු. 840,000 ක් හා වර්ෂයකට වඩා පැරණි ගැන්ග් නේල් තැන්පතු රු.1,258,635 ක් නිරවුල් කිරිමට හෝ මුදල් රෙගුලාසි 571 (2) ප්‍රකාරව ආදායමට ගැනිමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහය, XXXII පරිච්ඡේදයේ 1.2 උපවගන්තිය | කල්දෙමුල්ල යාන්ත්‍රික ඉංජිනේරු අංශයට අනුයුක්තව සිටින පාලන නිලධාරියකු විසින් රැකියාවේ යෙදි සිටියදි දේශපාලන කටයුතුවල පූර්ණ කාලිනව යෙදි තිබුණද ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර 2004 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වැටුප් වර්ධක ගැලපිම් සිදුකර රු.1,260,364 ක් ගෙවිමට කටයුතු කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2007 උපදේශන සේවා තෝරා ගැනීම් සහ සේවයේ යෙදවීම් පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | මාර්ගෝපදේශයේ විධිවිධාන අනුගමනය කිරීමෙන් තොරව 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුල කොන්ත්‍රාත් වටිනාකම රු.257,263,277 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 17 ක් සම්බන්ධයෙන් උපදේශන සේවා ලබා ගැනීම සඳහා රු.5,230,774 ක් උපදේශන සේවා ආයතනවලට ගෙවා තිබුණි. |

## 3 මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.565,741,554 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.86,678,961 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 479,062,593 ක වර්ධනයක් නිරීක්ෂණය විය. විකුණුම් ආදායම රු. 39,818,582 කින් වැඩිවීම, විකුණුම් හා බෙදාහැරීමේ වියදම් රු. 84,406,064 කින්, පරිපාලන වියදම් රු.122,145,217 කින් හා භාණ්ඩාගාරයට ගෙවූ බදු ප්‍රමාණය රු.75,000,000 කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලය වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනය වූ මූල්‍ය ප්‍රතිඵලය 2016 වර්ෂයේ දී පිරිහීමකට ලක්ව නැවත සමාලෝචිත වර්ෂයේදී වර්ධනයක් ලබා තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ක්ෂය වීම් හා වර්ෂයේ බදු ගැලපීමෙන් පසු 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා දායකත්වය අඛණ්ඩව වර්ධනය වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 5 කින් වැඩි වි තිබුණි.



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ දළ ලාභ අනුපාතය සියයට 49 ක ඉහල අගයක් ගනු ලැබුවද නිෂ්පාදන වියදමට අමතරව ආදායම් බදු,පරිපාලන වියදම්,විකුණුම් හා බෙදා හැරීමේ වියදම්,වැටුප් හා වේතන පෙර වර්ෂවලට සාපේක්ෂව අඛණ්ඩව ඉහල යාම නිසා ශුද්ධ ලාභ අනුපාතය දල ලාභ අනුපාතයට සාපේක්ෂව පහළ වැටීමට හේතුවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදි සංස්ථාවේ ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය පෙර වර්ෂයට සාපේක්ෂව අඩු අගයක් ගෙන තිබුණු අතර ජංගම අනුපාතයට වඩා ක්ෂණිත අනුපාතය අඩු අගයක් ගෙන තිබුණි. එමගින් සංස්ථාවේ තොගය තුල මුදල් විශාල ලෙස රැදී ඇති බව නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

---------------

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ අරමුණු අතරින් කෘෂි කාර්මික නිෂ්පාදන, වේවැල් ආනයනය හා දැව ආශ්‍රිත නිමි හා අර්ධ නිමි භාණ්ඩ අපනයනය කිරීම යන අරමුණු ඉටුකර ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණු අතර අපේක්ෂිත පරිදි දැව අතුරු භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවියද සිදු කර නොතිබුණි. සිල්පර දැව අපනයනය කිරීම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදි සියයට 70 කින් පහළ බැස තිබුණි.

(ආ) සංස්ථාව විසින් 2016-2020 කාලපරිච්ඡේදයට අදාලව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේදී ඉටු කල යුතු දැව අස්වනු නෙලීමේ කොන්ත්‍රාත් කළමනාකරණ පද්ධති හා ව්‍යාපෘති කළමනාකරණ පද්ධති හඳුන්වාදීම, දැව අපතය වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම, නිවැරදි ක්‍රමවේද මගින් ගස් පිළිබඳ සංඛ්‍යා ලේඛන ලබා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ස්ථාපිත කිරීමේ වැඩසටහන් සකස් කිරීම, කඳන් ලේඛනගත කරන්නන්ගේ(Logging Contractors) වෘත්තිය හැකියාව හා කුසලතා වර්ධනය සඳහා

රු.මිලියන 2 ක බැගින් වාර්ෂිකව වෙන් කිරිම හා ඊට අවශ්‍ය පහසුකම් සැලසිම සහ අස්වනු නෙලිමේ ක්‍රියාවලිය සඳහා නවින යන්ත්‍රෝපකරණ මිලට ගැනිම සඳහා රු.මිලියන 10 බැගින් වෙන්කිරිම යන වැඩසටහන් මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) සංස්ථාවේ සාමාලෝචිත වර්ෂයේ සමස්ත විකුණුම් ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 1 කින් වැඩි වි තිබුණු නමුත් පුද්ගලික දැව කඳන් අලෙවි ආදායම, පුද්ගලික හා රජයේ ඉඩම්වල සිල්පර හා ආනයනික සිල්පර අලෙවි ආදායම , විදුලි වැට කණු හා අලි වැට කණු ආදියෙහි අලෙවි ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 30 ත් සියයට 75 ත් අතර පරාසයකින් පහළ බැස තිබුණි. අපනයනික ඉරූ දැව අලෙවි ආදායම පමණක් සියයට 0.85 කින් වැඩිවී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මුළු ශුද්ධ ලාභය රු. 966,804,360 ක් වුවද සංස්ථාවේ ප්‍රාදේශිය කාර්යාල 12 න් අම්පාර හා පොළොන්නරුව ප්‍රාදේශිකයන් 02 හි එකතුව රු.16,990,112 ක අලාභයක්ද,සංස්ථාවේ දැව සංකිර්ණ (Complex)03 න්, දෙකක මුළු අලාභ එකතුව රු.52,044,023 ද,නිෂ්පාදනාගාර 03 න් නිෂ්පාදනාගාර 02 ක එකතුව රු.52,308,236 ක අලාභයක් හා කල්දෙමුල්ල කාර්මික ඒකකය රු.30,750,890 ක අලාභයක්ද වශයෙන් එකතුව රු.152,093,261 ක අලාභයක් ලබා තිබුණි.

(ඉ) සංස්ථාවේ අරමුණු අනුව ආදායම් ඉපැයිමේ මාර්ගයන් අතර ගෘහ භාණ්ඩ අලෙවි ආදායම ප්‍රධාන තැනක් ගත්තද සමාලෝචිත වර්ෂයේ ගෘහ භාණ්ඩ විකුණුම් ආදායම, සමස්ථ විකුනුම් ආදායමෙන් සියයට 9 ක් වැනි ප්‍රමාණවත් නොවූ පහළ මට්ටමක පැවතුණි. සමාලෝචිත වර්ෂයේ ගෘහ භාණ්ඩ ඒකකයේ මුළු ලාභය රු. 985,596 ක් වූ අතර මෙය සංස්ථාවේ මුළු ලාභයෙන් සියයට 0.1ක ප්‍රතිශතයකි. මේ අනුව සංස්ථාව රජයේ දැව ලබා ගැනිමේ ඒකාධිකාරියක් පවතින ආයතනයක් වුවද ගෘහ භාණ්ඩ අලෙවි ආදායම ඉහළ නංවා ගැනිමට අවශ්‍ය නව අලෙවි උපාය මාර්ග අනුගමනය කර නොතිබුණි.

(ඊ) රාජ්‍ය දැව සංස්ථාවේ 2017 වර්ෂයේ අයවැය ගත විකුණුම් අනුව ඉලක්කගත ගෘහ භාණ්ඩ අලෙවි ආදායම රු. 501,333,000 ක් වුවද සත්‍ය වශයෙන් ඉපැයූ ආදායමරු.389,044,488 ක් වුයෙන් රු. 112,288,512 ක වෙනසක් නිරික්ෂණය විය. මේ අනුව ඉලක්කගත ආදායම ලඟාකර ගැනිමට සමාලෝචිත වර්ෂයේදී නොහැකිවි තිබුණි.



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(උ) ගෘහ භාණ්ඩ නිෂ්පාදනයේදි සිදුවන දැව අපතය භාවිතයෙන් අතුරු නිෂ්පාදන සිදු කිරිමේ අරමුණින් පවත්වාගෙන යනු ලබන බුස්ස ෆින්ගර් ජොයින්ට් නිෂ්පාදනාගාරය 2015 වර්ෂයේදි රු. 3,240,127 ක දල ලාභයක් ලබා තිබුණද, 2016 වර්ෂයේ දල ලාභය රු.2,253,536 ක් වී රු. 986,591 කින් පහළ බැසීමකට ලක් වී සමාලෝචිත වර්ෂයේදි රු.2,712,225 ක දල අලාභයක් ලබා තිබුණි. එය ඉකුත් වර්ෂයේදි ෆින්ගර් ජොයින්ට් නිෂ්පාදන අලෙවියෙන් ලැබු දල ලාභයට සාපේක්ෂව සියයට 220 ක පහළ බැසිමකි. මේ අනුව සංස්ථාවේ අතුරු නිෂ්පාදනය සඳහා ප්‍රමාණවත් වෙළඳපල තත්ත්වයක් නොමැති බවට නිරික්ෂණය විය.

(ඌ) සංස්ථාව සතුව පවත්නා ප්‍රදර්ශනාගාර 07 න් ප්‍රදර්ශනාගාර 04 ක සමාලෝචිත වර්ෂයේ රු.33,521,024 ක දල ලාභයක් ලබා තිබුණද, තලල්ල, බුස්ස, අම්පාර යන ප්‍රදර්ශනාගාර 03 න් ලැබු දල අලාභයේ එකතුව රු. 4,879,985 ක් වු අතර ගෘහ භාණ්ඩ ඒකකයේ විස්තීරණ ආදායම් ප්‍රකාශනය අනුව තවදුරටත් මෙම දල ලාභ/අලාභ සඳහා විකුණුම් පිරිවැය හා පරිපාලන පිරිවැය ගැලපිම තුලින් ශුද්ධ ලාභය රු. 985,596 ක් දක්වා අඩුවී තිබුණි. මේ අනුව ප්‍රදර්ශනාගාර තුලින් ලැබු ලාභයන් මඟින් සංස්ථාවට ප්‍රමාණවත් දායකත්වයක් ලැබි නොතිබුණු බව නිරික්ෂණය විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

----------------------------------

පහත සඳහන් නිරික්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ කැප්පෙටිපොල ඒකකය විසින් පුද්ගලික පාර්ශවයන්ට අයත් ඉඩම්වලින් ලබා ගත් ගස්වලින් විදුලි කණු ලබාගෙන ඉතිරි වූ දැව වක්‍රලේඛවල සඳහන් මිල ගණන්වලට වඩා අඩු මිලකට අලෙවි කිරිම නිසා සංස්ථාවට රු. 1,051,364 ක අලාභයක් සිදුව තිබුණි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණක) ගේ 2016.03.10 දිනැති ලිපිය මගින් එම අලාභය ඉන්වොයිස්පත් නිකුත්කල නිලධාරියාගෙන් හෝ අදාල ගැනුම්කරුගෙන් අයකර ගැනීමට උපදෙස් ලබා දී තිබුණද, ඉන් රු.629,318 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටද අයකරගෙන නොතිබුණි.

(ආ) කල්දෙමුල්ල සංකිර්ණයයේ දැව 'අට්ටිමඩුවේ අලුතෙන් යකඩ රාක්ක සවි කිරිමේ කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරිමකින් තොරව හා කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුමකට එළඹීමකින් තොරව රු.2,052,500 කට පෞද්ගලික ආයතනයක් වෙත

ප්‍රදානය කර තිබුණු අතර සවිකරන ලද රාක්කවල සැලසුම් කර තිබූ පරිදි දැව ගබඩා කල නොහැකි වීම හේතුවෙන් එම යකඩ රාක්ක ඉවත් කිරීමට සිදු වී තිබුණි. මෙහිදී සිදු වී ඇති අලාභය වෙනුවෙන් රු. 834,124 ක් වගකිව යුතු නිලධාරින්ගෙන් අයකර ගැනිමට මූල්‍ය විමර්ශනයක් කරන ලද කමිටුව මගින් නිර්දේශ කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) බණ්ඩාරවෙල ප්‍රාදේශිය කාර්යාලය හා කැප්පෙටිපොල ගබඩා නිලධාරි නිල නිවාසය ඉදිකිරිම සඳහා ඇස්තමේන්තු සකස් කිරිම හා ලංසු ලේඛන පිළියෙල කිරීම වෙනුවෙන් 2013 වර්ෂයේදි පිළිවෙලින් රු. 566,098 ක් හා රු.94,906 ක් වැයකර තිබුණද එම ඉදිකිරිම් ආරම්භ නොකිරිම හේතුවෙන් එම වියදම් නිෂ්ඵල වියදම් වි තිබුණි.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

----------------------------

පහත සඳහන් නිරික්ෂණ කරනු ලැබේ.

(අ) වෙන්දේසි මඟින් කඳන් විකිණිමේදි හොඳ තත්ත්වයේ දැව කඳන් හා පලුදු දැව කඳන් එකට යොදා ලොට් කිරිම නිසා අඩු මිල රේටයන් මත අලෙවි කිරිමට සිදුවිම හේතුවෙන් හොඳ තත්ත්වයේ දැව කඳන්ද අඩු මිල යටතේ විකිණිමට සිදුවි තිබුණි.

(ආ) රත්මලාන ප්‍රදර්ශනාගාරයේ ඉදිකිරිම් සැලසුම් කිරිම සඳහා 2013 වර්ෂයේ වැයකරන ලද රු.1,477,650 ක් කල්දෙමුල්ල අර්ධ නිමි ගොඩනැගිලි යටතේ දක්වා තිබුණි. එසේ වුවද ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණු අතර නැවතත් අළුතින් සැලසුම් කර ඉදිකිරිම් ආරම්භ කිරිමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2014 නොවැම්බර් 14 දින ලබාගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන තුරුත් එහි වැඩ ආරම්භ කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදි සංස්ථාවේ සංචාරක බංගලාවල ආදායම රු. 1,046,548 ක් හා වියදම රු. 6,667,018 ක් වූ අතර ආදායම ඉක්මවූ වියදම රු. 5,620,473 ක් විය. එහෙත් සංචාරක බංගලා පිළිබඳව බාහිර පාර්ශවයන් දැනුවත් කර ආදායම වැඩිකර ගැනිමේ ක්‍රමවේදයන් හඳුන්වා දිමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.





**4.4 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

--------------------------------------

පහත සඳහන් නිරික්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ 25 කට පෙර මිලදි ගත් රු. 599,178 ක් වටිනා අමතර කොටස් අයිතම 116 ක් බොරලන්ද යාන්ත්‍රික අමතර කොටස් ගබඩාවේ නිෂ්කාර්යව පැවති බව 2017 සැප්තැම්බර් 14 දින සිදුකරන ලද නියැදි භෞතික පරික්ෂාවේදි නිරික්ෂණය විය.

(ආ) වර්ෂ 05 කට පෙර ඉදිකරන ලද බොරලන්ද කාර්මික ඒකකයේ වාහන සේදුම් අංගනය නිසි ප්‍රමිතියට සකස්කර නොමැතිවිම නිසා එය භාවිතයට ගත නොහැකිව තිබුණු අතර ඒ හේතුවෙන් රු.2,094,677 ක් වූ ගොඩනැගිලි, උපකරණ හා ජල ප්‍රේෂණ යන්ත්‍ර නිෂ්කාර්යව පැවතුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවේ අනුමත සේවක සංඛ්‍යාව 2308 ක් වූ අතර එදිනට තථ්‍ය සේවක සංඛ්‍යාව 1901 කි. ඒ අනුව තනතුරු 65 කට අදාලව නිලධාරින් 440ක ඌනතාවයක් හා තනතුරු 07 කට අදාලව නිලධාරින් 33 ක අතිරික්තයක් පවතින බව නිරික්ෂණය විය. එම ඌනතාවය තුල ඉහළ කළමනාකරණයේ තනතුරු 06 ක්ද, මධ්‍යම කළමනාකරණයේ තනතුරු 45 ක් ද, පහළ කළමනාකරණයේ තනතුරු 54 ක්ද, කළමනාකරණ සහකාර සේවයේ තනතුරු 69 ක් හා ප්‍රාථමික සේවයේ තනතුරු 266 ක් ද අන්තර්ගත වී තිබුණි.

**4.6 වෙළඳපොළ කොටස**

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව රජයේ දැව ලබා ගැනිම, ගෘහ භාණ්ඩ නිෂ්පාදනය, අලෙවිය හා දැව අලෙවිය යන සියළුම අංශයන්හි රජයේ ඒකාධිකාරිය පවතින එකම රජයේ ආයතනය වුවද වෙළඳපල තුල සංස්ථාවට පවත්නා ස්ථාවරත්වය කෙසේද, වෙළඳපල තුල පවතින වෙළඳපල කොටස කෙසේද යන්න තිරණය කිරිමට කාලින වෙළඳපල සමික්ෂණයක් කිරිමට කටයුතු කර නොතිබුණි.

(ආ) රජයේ දැව ලබා ගෙන උසස් ප්‍රමිතියෙන් යුතු ගෘහ භාණ්ඩ නිෂ්පාදනය සඳහා හැකියාව ඇති රජයේ ඒකාධිකාරියක් මෙන්ම දැව ගබඩා 52 ක්, අලෙවි ප්‍රදර්ශනාගාර 6 ක් ඇතුළු සම්පත් හිමිව පවතින සංස්ථාවෙහි ගෘහ භාණ්ඩ අලෙවිය සඳහා හිමිවන්නේ සියයට 0.45 ක් වැනි සියයට එකකටත් වඩා අඩු වෙළඳපල කොටසකි.

## 5. තිරසාර සංවර්ධනය

----------------------

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

-----------------------------------------------

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව රාජ්‍ය දැව සංස්ථාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

(අ) ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව දැනුවත්වීම මත රාජ්‍ය දැව සංස්ථාව විසින් සිය විෂය පථය අනුව ළඟා කර ගත යුතු අරමුණු වන දිළිඳුකම පිටුදැකීම ආර්ථික මට්ටම නඟා සිටුවීමට හා නව තිරසාර පරිභෝජනය හා නිෂ්පාදනය යන අරමුණු හඳුනා ගැනීමට කටයුතු කර තිබූ නමුත් තිරසාර පරිභෝජන හා නිෂ්පාදන සහ ආර්ථික මට්ටම නඟා සිටුවීමට හා නව නිෂ්පාදන ඉදිකිරීම සඳහා වන පාදක දත්ත ඉලක්ක ලඟා විය යුතු සංධිස්ථානයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් ලෙස පාසල් ගුරුභවතුන්, අඩු ආදායම්ලාභී වඩු කාර්මිකයින්, ඉරුම්හල් සේවකයින් සහ කොන්ත්‍රත්කරුවන් හඳුනාගෙන තිබුණද ආයතනයට අදාල ඉලක්ක පිළියෙල කිරීමේදී සහභාගිත්ව ප්‍රවේශයක් නිරූපනය නොවන බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ඇ) කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යවශ්‍ය වුවත්, ආයතනය විසින් තිරසාර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ සඳහා මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, භෞතික පහසුකම් ප්‍රමාණවත් නොවීම, පුහුණු සේවකයන් නොවීම යන කරුණු හේතු වී ඇති බව වැඩි දුරටත් නිරීක්ෂණය විය.





(ඈ) තිරසාර ඉලක්ක කරා ළඟා වීම සඳහා ආයතනය විසින් හඳුනාගත් කාර්යයන් වාර්ෂික සැලැස්මට ඇතුළත් කර නොතිබූ අතර එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැයට ඇතුළත් කර නොතිබුණි.

(ඉ) තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට සූදානම් වීමේදී අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් නොකිරීම හේතුවෙන් ඉලක්ක ගත අරමුණු කරා ළඟාවීමට සැළසුම් සකස් කිරීමේදී හා පෙර සූදානම් වීමේදී ක්‍රියාවලිය ඉතා මන්දගාමී හෝ දුර්වල තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

### 6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

------------------------------------------

#### 6.1.1 ප්‍රසම්පාදනයන්

---------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන සැලැස්ම තුල ඇතුලත්ව නොතිබුණු ප්‍රාග්ධන ස්වරූපයේ අයිතමයන් 6 ක් රු. 9,415,858 ක් වැයකර මිල දී ගෙන තිබුණි.

(ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අවම වශයෙන් වර්ෂ 3 ක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් **(MPP)** පිළියෙල කර නොතිබුණි.

### 6.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 නොවැම්බර් 21 දින ආරම්භ කරන ලද බණ්ඩාරවෙල ප්‍රාදේශීය කාර්යාලයේ ඉදිකිරීම් 2017 මැයි 26 වන දින නිම කල යුතු වුවත් 2018 මැයි වන විටත් වැඩ නිමකර නොතිබුණු අතර කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 18 ක් ඉක්මවා අතිරේක වැඩ සඳහා රු.4,132,005 ක් වැය කර තිබුණද ඒ සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය අනුමැතිය හා ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව ඉදිකිරීම් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.238,400,000 ක් වූ අතර ඉන් රු. 138,700,000 ක් උපයෝජනය කර නොතිබුණි. එය සමස්ත ප්‍රතිපාදනවලින් සියයට 58 ක් විය. යහපාලන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය අනුව විශ්වාසයෙන් යුක්තව ඉලක්ක හා අරමුණු ලඟාකර ගැනිම නිශ්චය කර ගැනිම පිණිස වාර්ෂික සැළසුම් හා අයවැය ලේඛන සමාලෝචනය කළ යුතු අතර එසේ යහපාලන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් මත කටයුතු කලේ නම් එම ප්‍රතිපාදන වෙනත් ආර්ථික වූ ගනුදෙනුවක් සඳහා මාරු කිරිමට කටයුතු කළ හැකිව තිබුණු බව විගණනයට නිරික්ෂණය විය.

## 6.3 අයවැය පාලනය

--------------------

අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සියයට 85 සිට 1252 දක්වා වූ පරාසයක විචලනයන් දක්නට වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

## 7. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම්වල අයිතිය තහවුරු කර නොගැනීම සහ වත්කම් ඌන උපයෝජනය. |
| (ආ) | ණයගැති හා ණය හිමි පාලනය | අයවිය යුතු ණය ශේෂයන් නියමිත කාල සීමාව තුලදී අයකර ගැනීමට කටයුතු නොකිරීම, බාහිර පාර්ශවයන් වෙත ගෙවිය යුතු ස්කන්ධභාග ගෙවීමට කටයුතු නොකිරීම. |





ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | | |
|---|---|---|
| (ඇ) | කාර්ය මණ්ඩල පරිපාලනය | ආයතන නීතිරීති හා රෙගුලාසි ප්‍රකාරව බඳවා ගැනීම් සහ උසස් කිරීම් සිදු නොකිරීම. |
| (ඇ) | ප්‍රසම්පාදනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකිරිම. |
| (ඉ) | ආදායම් පාලනය | විකුණුම් ඉන්වොයිස්පත් සඳහා වූ බදු ගණනය කිරීම් නිවැරදිව සටහන් නොකිරිම. |

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)



# වාර්ෂික ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා



## ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2017 රු. | 2016 රු. |
|---|---|---|---|
| පිරිවැටුම | 2 | 4,253,774,266 | 4,213,955,684 |
| විකුණුම් පිරිවැය | 3 | (2,177,824,205) | (2,168,865,411) |
| **මෙහෙයුම් මත දළ ලාභය** | | **2,075,950,061** | **2,045,090,273** |
| වෙනත් ආදායම් | 6 | | |
| මෙහෙයුම් | 6.2 | 103,163,513 | 91,843,464 |
| මෙහෙයුම් නොවන | 6.1 | 273,779,849 | 216,438,841 |
| **මුළු ශුද්ධ ආදායම** | | **2,452,893,423** | **2,353,372,578** |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | 4 | (680,617,770) | (766,023,834) |
| පරිපාලන වියදම් | 5 | (805,471,293) | (927,616,510) |
| **භාණ්ඩාගාර බදුවලට පෙර ශුද්ධ ලාභය** | | **966,804,360** | **659,732,234** |
| භාණ්ඩාගාරයට ගෙවූ බදු | | (100,000,000) | (175,000,000) |
| **භාණ්ඩාගාර බදුවලට පසු ලාභය** | | **866,804,360** | **484,732,234** |
| වර්ෂය සඳහා ආදායම් බදු | 7 | (301,062,806) | (398,053,273) |
| **ආදායම් බදුවලට පසු ලාභය** | | **565,741,554** | **86,678,961** |

## විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2017 Rs. | 2016 Rs. |
|---|---|---|---|
| **ආදායම් බදු පසු ලාභය** | | **565,741,554** | **86,678,961** |
| **වෙනත් විස්තීරණ ආදායම්** | | | |
| විශ්‍රාමික පාරිතෝෂික අතිරික්ත/ඌණතා | | (323,413,595) | (51,403,312) |
| **වෙනත් විස්තීරණ ආදායම්** | | **(323,413,595)** | **(51,403,312)** |
| **මුළු විස්තීරණ ආදායම්** | | **242,327,959** | **35,275,649** |

## මූල්‍ය තත්ව ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2017 රු. | 2016 රු. |
|---|---|---|---|
| වත්කම් | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 8 | 980,517,535 | 1,008,318,543 |
| අස්පෘශ්‍ය වත්කම් | 9 | 1,443,873 | 1,357,674 |
| ජීව විද්‍යාත්මක වත්කම් | 10 | 6,577,016 | 6,042,270 |
| භාණ්ඩාගාර තැන්පත් | | 2,966,000 | 2,966,000 |
| සේවක ඇප තැන්පත් | | 63,941,048 | 60,798,982 |
| ආයෝජන | 11.1 | 605,190,777 | 565,993,603 |
| පෙර ගෙවුම් සේවක ප්‍රතිලාභ | | 67,459,232 | 53,906,375 |
| විලම්භිත බදු වත්කම් | 7.2 | 96,644,503 | 7,494,820 |
| කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | | 69,856,596 | 25,761,631 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **1,894,596,581** | **1,732,639,898** |
| **ජංගම වත්කම්** | | | |
| වෙළඳ තොග | 12 | 1,513,147,565 | 1,353,002,944 |
| වෙළඳ සහ වෙනත් ණයගැතියෝ | 13 | 868,402,923 | 979,885,750 |
| ස්ථිර තැන්පතුවල ආයෝජන | 11.2 | 1,694,380,646 | 1,060,353,181 |
| මුදල් හා බැංකු ශේෂය | 14 | 347,174,014 | 258,943,959 |
| **මුළු ජංගම වත්කම්** | | **4,423,105,148** | **3,652,185,834** |
| **මුළු වත්කම්** | | **6,317,701,729** | **5,384,825,732** |
| | | | |
| ස්කන්ධය හා බැරකම් | | | |
| **ස්කන්ධය හා සංචිත** | | | |
| අනුමත ප්‍රාග්ධනය | | **75,000,000** | **75,000,000** |
| | | | |
| දායක ප්‍රාග්ධනය | 15 | 41,503,668 | 41,503,668 |
| අයභාර සංචිත | | 3,857,127,941 | 3,703,809,584 |
| | | **3,898,631,609** | **3,745,313,252** |
| සේවක ණය චක්‍රීය අරමුදල | 16 | 332,062,529 | 243,052,926 |
| **මුළු ස්කන්ධය** | | **4,230,694,138** | **3,988,366,178** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| විශ්‍රාම පාරිතෝෂික අරමුදල | 17 | 788,350,624 | 438,573,892 |
| සේවක ඇප තැන්පත් | | 63,941,048 | 60,798,982 |
| විලම්භිත බදු වගකීම | 7.2 | - | - |
| **මුළු ජංගම නොවන බැරකම්** | | **852,291,672** | **499,372,874** |
| **ජංගම බැරකම්** | | | |
| ආදායම් බදු | 18 | 268,225,025 | 132,894,534 |
| ණයහිමියෝ සහ උපචිත වියදම් | 19 | 966,490,894 | 764,192,145 |
| **මුළු ජංගම බැරකම්** | | **1,234,715,919** | **897,086,679** |
| **මුළු බැරකම්** | | **2,087,007,591** | **1,396,459,553** |
| **මුළු ස්කන්ධය හා බැරකම්** | | **6,317,701,729** | **5,384,825,732** |



රාජ්‍ය දැව සංස්ථාවේ ක්‍රියාකාරකම් සම්බන්ධ මෙම ප්‍රකාශනය 1971 අංක 38 දරණ මුදල් පනතේ විධි විධාන වලට අනුකූලව ඉදිරිපත් කරනු ලැබේ.

**සාමාන්‍යාධිකාරී**
රාජ්‍ය දැව සංස්ථාව

පිටු අංක 80 සිට 86 දක්වා වන ගිණුම් ප්‍රතිපත්ති සහ පිටු අංක 87 සිට 97 දක්වා වන ගිණුම් සටහන් මෙම ගිණුම් ප්‍රකාශන වල කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලදී.

**සභාපති**
රාජ්‍ය දැව සංස්ථාව
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්

**අධ්‍යක්ෂ**

දිනය: 2018.02.28

## ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය

| | දායක ප්‍රාග්ධනය රු. | සේවක ණය වගකීම අරමුදල රු. | රඳවාගත් ලාභ රු. | එකතුව රු. |
|---|---|---|---|---|
| **2016 ජනවාරි 01 වන දිනට ශේෂය** | **41,503,668** | **236,650,441** | **3,674,936,420** | **3,953,090,529** |
| වර්ෂය සඳහා ලාභය | - | - | 86,678,961 | 86,678,961 |
| වර්ෂය සඳහා සේවක ණය පොලිය ගැලපුම | - | 6,402,485 | (6,402,485) | - |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | - | (51,403,312) | (51,403,312) |
| **2017 ජනවාරි 01 දිනට ශේෂය** | **41,503,668** | **243,052,926** | **3,703,809,584** | **3,988,366,178** |
| වර්ෂය තුළ ගැලපීම් | - | 81,000,000 | (81,000,000) | - |
| වර්ෂය සඳහා ලාභය | - | - | 565,741,554 | 565,741,554 |
| වර්ෂය සඳහා සේවක ණය පොලිය ගැලපුම | - | 8,009,603 | (8,009,603) | - |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | - | (323,413,595) | (323,413,595) |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **41,503,668** | **332,062,529** | **3,857,127,941** | **4,230,694,138** |



## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2017 රු. | 2016 රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | |
| ගනුදෙනුකරුවන්ගෙන් ලැබුණු මුදල් | 4,600,374,990 | 4,054,595,067 |
| සැපයුම්කරුවන්ට හා සේවකයින්ට ගෙවූ මුදල් | (3,600,892,262) | (4,488,502,221) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල්** | 999,482,728 | (433,907,154) |
| ආදායම් බදු | (254,881,998) | (566,831,903) |
| භාණ්ඩාගාරයට ගෙවූ විශේෂ බදු | (100,000,000) | (175,000,000) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **644,600,730** | **(1,175,739,057)** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | |
| ස්ථාවර වත්කම් මිලදීගැනීම් | (94,637,473) | (113,675,466) |
| ජීව විද්‍යාත්මක වත්කම් සංවර්ධනය | (534,746) | (724,891) |
| ආයෝජන | (673,224,639) | 874,018,802 |
| ආයෝජන වලින් ලද ආදායම | 214,393,281 | 216,114,314 |
| වත්කම් විකිණීමෙන් ලද මුදල් | 3,718,263 | 19,256,332 |
| ආයෝජන විකිණීමෙන් ලද මුදල් | 30,000,000 | - |
| කෙරීගෙන යනවැඩ | (44,094,965) | 72,073,158 |
| සේවක ණය වගකීම අරමුදල | 8,009,603 | 6,397,122 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(556,370,675)** | **1,073,459,371** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | - | - |
| | | |
| **මුදල් හා මුදල් සමාන වත්කම් වල ශුද්ධ අගය වැඩිවීම** | **88,230,055** | **(102,279,686)** |
| | | |
| වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන වත්කම් - සටහන 14 | 258,943,959 | 361,223,645 |
| | | |
| **වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන වත්කම් - සටහන 14** | **347,174,014** | **258,943,959** |

# රාජ්‍ය දැව සංස්ථාව

**1.1 වාර්තාකරණ ආයතනය**

**1.1.1 සංස්ථාපනය**

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ, 1968, අප්‍රේල් මාසයේ දී රාජ්‍ය දැව සංස්ථාව සංස්ථාවක් ලෙස ස්ථාපනය කරන ලදි.

**1.1.2 මූල්‍ය ප්‍රකාශන සඳහා අනුමැතිය ලද දිනය**

2018, පෙබරවාරි මස 27 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ දී සම්මත කරගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට අනුකූලව 2017 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අනුමැතිය ලබා දී ඇත.

**1.1.3 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම.**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා නිකුත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය.

**1.1.4 සේවක සංඛ්‍යාව.**

2017 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ සේවක සංඛ්‍යාව 2,083 කි. (2016 වර්ෂයේ 2,125 කි)

**1.2 ඉදිරිපත්කිරීමේ පදනම**

**1.2.1. අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් ප්‍රකාශ කරන ලද නිර්දේශිත රීතීන් වලට හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත) වලට අනුකූලව සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනට හා එම කාලපරිච්ඡේදයෙන් අවසන් වසර සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමග ගිණුම් සඳහා සටහන් පිළියෙල කර ඇත.

**1.2.2 අගය කිරීමේ පදනම**

ලැබිය යුතු සේවක ණය සහ වෙළඳ ණයගැතියන් සාධාරණ අගයට ගිණුම්වල පෙන්වා ඇති අතර, ඒ හැර අනෙකුත් අගයන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම් කරගෙනය.

**1.2.3 භාවිතා වන හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන මුදල් ඒකකය**

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර, එය සංස්ථාවේ ගනුදෙනු කරන මුදල් ඒකකය වේ. විශේෂයෙන් සඳහන් කොට නොමැති නම්, සියලුම මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියල දක්වා වටයා ඉදිරිපත් කර ඇත.

**1.2.4 ඇස්තමේන්තු හා නිගමන**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකාරිත්වයට නොයෙකුත් ඇස්තමේන්තු, නිගමන හා උපකල්පන පදනම් කරගැනීමට සිදුවන අතර, ඒවා ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී හා වාර්තා කරන වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම්වල අගයන් කෙරෙහි බලපෑම් ඇති කරවයි. ඇස්තමේන්තු සහ මූලික උපකල්පන අතීත අත්දැකීම් සහ යම් අවස්ථාවන් යටතේ සාධාරණයැයි විශ්වාස කරන විවිධ වෙනත් කරුණු මත පදනම් වී ඇත. සත්‍ය ප්‍රතිඵලය, ඇස්තමේන්තු නිගමනයන් හා තීරණවලට වඩා වෙනස් විය හැකිය. ඇස්තමේන්තු හා උපකල්පන නිරතුරුවම සමාලෝචනය කරනු ලැබේ. සංශෝධනය කරනු ලබන ගණකාධිකරණ ඇස්තමේන්තු එම ඇස්තමේන්තු සංශෝධනය කරන ලද කාලපරිච්ඡේදයට හා ඒවා බලපානු ලබන ඉදිරි කාලපරිච්ඡේද සඳහා ගලපනු ලැබේ.



**1.2.5 විදේශ විනිමය ගනුදෙනු**

විදේශ විනිමය ගනුදෙනු ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනුයේ ගනුදෙනු සිදුවූ දිනට පැවති විනිමය වටිනාකම අනුව වේ.

**1.2.6 බදුකරණය**

ගිණුම් ප්‍රකාශවල වාර්තා වන ආදායම් සහ වියදම් පදනම් කරගෙන 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන සහ පසුකාලීන සංශෝධන වලට අනුකූලව ගණනය කිරීමෙන් පසුව ආදායම් බදු සඳහා වෙන්කිරීම් කර ඇත.

**1.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

පහත සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාල ගිණුම් කාලපරිච්ඡේදය තුලදී අඛණ්ඩව භාවිතා කොට ඇත.

**1.3.1 වත්කම් සහ වටිනාකම ගණනය කිරීම**

**1.3.1.1 දේපල පිරියත හා උපකරණ**

**1.3.1.1.1 හඳුනාගැනීමේ පදනම**

දේපල, පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිවූ වටිනාකම අඩුකර අගය කර ඇත. (ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් සාධාරණ අගය මත) වත්කම මිලදී ගැනීමේදී එය සෘජුව ආරෝපිත වියදම් දේපල, පිරියත හා උපකරණ පිරිවැයට ඇතුළත්වේ. දේපල, පිරියත හා උපකරණවල වෙනස් කොටස්වල විවිධ ඵලදායී ජීවකාල ඇත්නම් ඒවා දේපල, පිරියත හා උපකරණවල වෙනම අයිතම ලෙස ගිණුම්ගත කරයි. සියලු දේපල, පිරියත හා උපකරණ පළමුව පිරිවැයට හඳුනාගනී.

**1.3.1.1.2 වත්කම් විකිණීමෙන් ඇති වූ ලාභ/අලාභ**

වත්කම් විකිණීමෙන් ඇති වන ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ විකිණීමේදී ලැබීම් හා වත්කමේ ධාරණ වටිනාකමේ වෙනස ලෙස ගණනය කරන ලද) වත්කම විකුණනු ලබන වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ වෙනත් මෙහෙයුම් ආදායම්/වියදම් යටතේ දක්වනු ලබයි.

**1.3.1.1.3 පසු පිරිවැය**

ස්ථාවර ස්වභාවයෙන් ව්‍යාපාරය පවත්ගෙන යාමට හෝ ව්‍යාපාරයේ ඉපැයුම් ධාරිතාව වර්ධනය කිරීම සඳහා වත්කම් පවරාගැනීම, දීර්ඝ කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා වැයවන පසු වියදම්, ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලබන අතර, එවැනි වියදම් වත්කමේ ඉදිරියට ගෙනයනු ලබන වටිනාකමෙන් හඳුනාගැනේ. එමෙන්ම දේපල හා උපකරණවල එදිනෙදා නඩත්තු පිරිවැය ආදායම් ප්‍රකාශනයෙන් යෙදවූ වටිනාකම් ලෙස හඳුනාගැනේ.

**1.3.1.1.4 ඉවත් කිරීම්**

දේපල, පිරියත හා උපකරණ ඉවත් කිරීමේදී හෝ ඒවා පාවිච්චි කිරීම තුළින් ඉදිරි ප්‍රතිලාභයක් අත්නොවන විට ඒවායේ ඉදිරියට ගෙනඑන ලද වටිනාකම ගිණුම් වලින් ඉවත් කරනු ලැබේ. මෙසේ වත්කම් ඉවත් කිරීමේදී උද්ගත වන ලාභ හෝ පාඩු විස්තීරණ ආදායම් ප්‍රකාශනයට ගලපනු ලබන අතර, ලාභ ආදායමක් ලෙස සලකනු නොලැබේ.

**1.3.1.1.5 ක්ෂයවීම**

දේපළ, පිරියත හා උපකරණවල සියලුම අංගයන් එහි ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය පුරා සරල රේඛීය පදනම මත විස්තීරණ ආදායම්

ප්‍රකාශනයට කපාහරිනු ලබයි. ඉඩම් ක්ෂය නොකරනු ලබන අතර, අදාල ක්ෂය කිරීම් අනුපාත පහත පරිදි වේ.

| | |
|---|---|
| ස්ථිර ගොඩනැගිලි | 2.5% |
| අර්ධ ස්ථිර ගොඩනැගිලි | 30% |
| යන්ත්‍රෝපකරණ | 10% |
| වාහන | 20% |
| මාර්ග හා දුම්රිය මාර්ග | 5% |
| බදු ඉඩම් | 5% |
| මාර්ග ඉදිකිරීම් | 10% |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 15% |
| කාර්යාල උපකරණ | 15% |
| විවිධ වත්කම් | 20% |
| පරිගණක | 20% |
| විදුලි උපකරණ | 10% |
| මෙවලම් හා උපකරණ | 20% |
| ඉඩම් සංවර්ධන | 10% |

### 1.3.1.2 නොනිමි වැඩ

ගිණුම් වර්ෂය තුලදී සම්පූර්ණ කරගත නොහැකි වූ ප්‍රාග්ධන ආයෝජනවලට අදාල ප්‍රාග්ධන වියදම් අදාල වර්ෂයේ නොනිමි වැඩ යටතේ දක්වා ඇති අතර, වැඩ සම්පූර්ණ වී පරිහරණයට සුදුසු තත්වයට පැමිණි පසු ඒවා දේපල පිරියත හා උපකරණ යටතේ දක්වනු ලැබේ.

### 1.3.1.3 අස්පෘෂ්‍ය වත්කම්

අස්පෘෂ්‍ය වත්කම්වලට පරිඝනක මෘදුකාංග මිලදිගැනීම සඳහා වැය වූ පිරිවැය ඇතුලත් වේ. එමෙන්ම මෙවැනි අස්පෘෂ්‍ය වත්කම් හඳුනාගනු ලබන්නේ එහි පිරිවැය විශ්වාසදායි ලෙස මැනිය හැකිනම් සහ එහි අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ලැබීමේ ප්‍රවණතාවයක් පවතී නම් පමණි. අස්පෘෂ්‍ය වත්කම් පිරිවැයෙන්, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානි වූ වටිනාකම් අඩුකර වටිනාකම අගය කර ඇත. විශේෂිත වත්කමකට අදාලව පසුව දරනු ලබන වියදම් ප්‍රාග්ධනිත කරනු ලබන්නේ එම වියදම් දැරීම හේතුවෙන් අදාල වත්කමෙහි අනාගත ආර්ථික ප්‍රතිලාභ වර්ධනයට එය පිටුවහලක් වන්නේ නම් පමණි. ක්‍රමක්ෂය සරල රේඛීය පදනම මත ඇස්තමේන්තු ගත පස් අවුරුදු ජීව කාලය පුරා කපාහරිනු ලබයි.

### 1.3.1.4 ජීව විද්‍යාත්මක වත්කම්

"ජීව විද්‍යාත්මක වත්කම්" පරිණත ජීව විද්‍යාත්මක වත්කම් සහ අපරිණත ජීව විද්‍යාත්මක වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. පරිණත ජීව විද්‍යාත්මක වත්කම් ගණයට අයත් වන්නේ එලදාව නෙලාගන්නා මට්ටමට පත්ව ඇති හෝ නිරන්තර එලදාව ලැබෙන තත්වයට පත්ව ඇති අයිතමයන් ය. අපරිණත ජීව විද්‍යාත්මක වත්කම් ලෙස සැලකෙන්නේ එලදාව නෙලාගන්නා තත්වයට පත් නොවූ අයිතමයන්ය.

ජීව විද්‍යාත්මක වත්කම් එලදරන ජීව විද්‍යාත්මක වත්කම් සහ පරිභෝජනමය ජීව විද්‍යාත්මක වත්කම් ලෙස වර්ගීකරණය කෙරෙන අතර එලදරන ජීව විද්‍යාත්මක වත්කම් විකිණීම සඳහා හෝ නෙලාගැනීම සඳහා තබා නොගන්නා ඒවා වන අතර, එම අයිතමයන් කෘෂිකාර්මික නිෂ්පාදනයන් ලබාගැනීමේ පරමාර්ථයෙන් සංවර්ධනය කරනු ලැබේ. පරිභෝජනයම ජීව විද්‍යාත්මක වත්කම් ගණයට දැව ලබාගැනීමට පාලනය කරනු ලබන ගස් මෙන්ම ජීව විද්‍යාත්මක වත්කම් වලින් එලදාව නෙලාගන්නා ලද කෘෂිකාර්මික නිෂ්පාදන මෙන්ම ජීව විද්‍යාත්මක වත්කම් වශයෙන් විකුණනු ලබන අයිතමයන් අයත්වේ. අතීත සිද්ධියක ප්‍රතිඵලයක් සේ ආයතනය ඒවා වර්තමානයේ දී පාලනය කරනු ලබන විට හා එම අයිතමයන් සමඟ බැඳුනු අනාගත ආර්ථික ප්‍රතිලාභයන් ව්‍යාපාරය තුළට



ජනනයවීම භව්‍ය වන්නේ නම් හා ඒවායේ පිරිවැය හෝ සාධාරණ අගය විශ්වසනීය පරිදි මැනිය හැකිවන විට පිව විද්‍යාත්මක වත්කම් ආයතනය විසින් හඳුනාගනී. දැව ලබාග ැනීමට පාලනය කරන ගස් මුල්වරට හඳුනාගන්නා අතර, සෑම වාර්තාකරණ කාලච්ඡේදයක් අවසානයේදීම ශ්‍රී.ල.ගි.ප්‍ර 41 ප්‍රකාරව ඒවා සාධාරණ අගයෙන් විකිණීම සඳහා යන පිරිවැය අඩු කළ පසු ලැබෙන අගයට නිරූපණය කෙරේ.

අපගේ ගණනය කිරීම්වලට අනුව තේක්ක ගසක් පරිණත වීමට රෝපණය කළ දින සිට අවුරුදු 35ක කාලයක් ගත වන බවත්, එම ගසේ විද්‍යාත්මක පරිනාමය සිදුවීමට අවුරුදු 10ක කාලයක් ගත වන බව සඳහන් කළ හැක. ජීව විද්‍යාත්මක පරිනාමය සිදුවන කාලය අතර තුර දැරීමට සිදුවන පිරිවැයත්, එහි සාධාරණ අගයත් එම කාල පරිච්ඡේදය තුල සමාන වන බව උපකල්පනය කර ඇත.

### 1.3.1.5 මූල්‍ය උපකරණ

#### 1.3.1.5.1 ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්

සංස්ථාව විසින් පළමුව ණය මුදල, ලැබිය යුතු මුදල් හා තැන්පතු එළඹි දිනය මත පදනම් ව හඳුනාගැනීම සිදුකරනු ලබයි. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් (ලාභ හා අලාභ හරහා සාධරණ අගය මත නම් කරන ලද වත්කම් අතුළුව) සංස්ථාව කොන්ත්‍රාත් විධිවිධාන වලට අදාල පාර්ශවයක් බවට පත් වූ ගණුදෙනු සිදුවූ දිනය මත පදනම් ව හඳුනාගැනීම් සිදුකරනු ලබයි. වත්කම් කල්පිරීමේ දී මූල්‍ය ප්‍රවාහ සදහා ඇති ගිවිසුම්ගත හිමිකම් මත සංස්ථාව වත්කම් නැවත හඳුනාගැනීම හෝ මූල්‍ය වත්කම් ගනුදෙනු වලදී වත්කමට අදාල ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය සමග සැලකිය යුතු සියලුම අවදානම් මාරු කරනු ලබයි.

##### 1.3.1.5.1.1. ණයට දුන් සහ අයවිය යුතු වත්කම්

ස්ථිර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත ක්‍රියාකාරි වෙළඳපොළෙන් උපුටාගත නොහැකි මූල්‍ය වත්කම් ණය හා ලැබීම් වේ. මෙම වත්කම් සාධාරණ අගයට එයට අදාල සෘජු වියදම් එකතු කිරීමෙන් පසු ලැබෙන අගය මත මූලික හඳුනාගැනීම සිදුකරනු ලබයි. මූලික හඳුනාගැනීමෙන් පසුව ණය හානිකරන අලාභ ඉවත් කිරීමෙන් පසුව එලදායී පොළී ක්‍රමය යොදාගනිමින් එම වත්කම් නැවත හඳුනාග ැනීම සිදුකරනු ලබයි. ණය හා ලැබීම් වෙළඳ හා වෙළඳ නොවන ලැබීම් වලින් සමන්විත වන අතර, සේවක ණය ද ඇතුළත් වේ. මුදල් හා මුදල් සමාන වත්කම් මුදල් ශේෂයන්ගෙන් හා ඒක්ෂණ තැන්පතු වලින් සමන්විත වන අතර, ඒක්ෂණ තැන්පතු ඇතුළත් කරනු ලබන්නේ මුදල් ප්‍රවාහ ප්‍රකාශ අරමුණ සදහාය.

### 1.3.1.6 ආයෝජන

#### 1.3.1.6.1 ස්ථිර තැන්පතු ආයෝජන පිරිවැය මත සඳහන් කර ඇත.

#### 1.3.1.6.2 දිගුකාලින ආයෝජන පිරිවැය මත සඳහන් කර ඇත.

#### 1.3.1.6.3 රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි ආයෝජන

මෙම ආයෝජනයන් සිදුකර ඇත්තේ රාජ්‍ය දැව සංස්ථාවේ සේවකයින්ට නිවාස ණය පහසුකම් සැලසීම සඳහාය.

#### 1.3.1.6.4 අපහායනය

මූල්‍ය වත්කමක අගය අඩුවන බවට විෂය මූලික සාක්ෂි ඇතිදැයි එක් එක්

වාර්තාකරණ දිනක දී ඇගයීමකට ලක්කිරීම සිදුකොට එසේ අගය අඩුවීමෙන් දැරීමට සිදුවන අලාභය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

### 1.3.1.7 වෙළෙඳ තොග

වෙළෙඳ තොග අගයකරනු ලැබ ඇත්තේ පිරිවැය හෝ ඇස්තමේන්තුගත ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ය. පරිත්‍යාග දැව තොග ද, අගය කොට ඇත්තේ පිරිවැය (තොග වර්තමාන ස්ථානයට සහ වර්තමාන තත්වයට ගෙනඒම සඳහා දරන ලද පිරිවැය) හෝ ඇස්තමේන්තුගත ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ය. පිරිවැය නිගමනය කරනු ලබන්නේ ප්‍රථමයෙන් ලැබීම්, ප්‍රථමයෙන් නිකුත් කරන පදනමට වන අතර පිරිවැයට, බඩුතොග ප්‍රවර්තන තත්වයට හා ස්ථානයට ගෙනඒමට දරන ලද සියලු වියදම් ඇතුලත්ය. නිෂ්පාදන සම්බන්ධයෙන් මේ වනවිටදී පිරිවැයට සියලු සෘජු වියදම් ද සාමාන්‍ය ක්‍රියාකාරී මට්ටම මත පදනම් වන නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය ද ඇතුළත් ය. අවශ්‍ය අවස්ථාවන් හිදී යල්පැනගිය, සෙමින් අලෙවි වන හා දෝෂ සහිත බඩුතොග සඳහා ප්‍රතිපාදන සලසා ඇත. තොග හානිවීම් සඳහා 15% ක සාමාන්‍ය ප්‍රතිපාදනයක් සලසා ඇත.

## 1.3.2 වගකීම් හා ප්‍රතිපාදන

මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ ගැනෙනුයේ ඉල්ලූ වහා ගෙවිය යුතු ගෙවීම් හෝ මූල්‍ය තත්ව ප්‍රකාශන දින සිට වසරක් තුළ ගෙවිය යුතු ගෙවීම්ය. ජංගම නොවන වගකීම් ලෙස ගැනෙනුයේ මූල්‍ය තත්ව ප්‍රකාශන දින සිට වසරකට වැඩිකාලයක් තුළ ගෙවිය යුතු ගෙවීම්ය. මූල්‍ය ප්‍රකාශනවල සියලුම හඳුනාගෙන ඇති වගකීම් ගිණුම්ගත කර ඇත.

### 1.3.2.1 වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු වගකීම්

වෙළඳ හා අනෙකුත් කටයුතු සදහා ගෙවීම් අදාල පිරිවැය අනුව සදහන් කර ඇත.

### 1.3.2.2 විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 දරන විශ්‍රාම පාරිතෝෂික පනත අනුව අඛණ්ඩව වර්ෂ 05කට වඩා වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් විශ්‍රාම පාරිතෝෂික සඳහා හිමිකම් ලබයි. කෙසේ වෙතත් සියලුම සංස්ථා සේවකයින් වෙනුවෙන් වර්ෂ 2017 දෙසැම්බර් 31 දිනට අවසන්කර ඇති සේවා කාලය හා අවසන්වරට ලැබූ වැටුප පදනම් කරගෙන සේවක විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇත.

### 1.3.2.3 අසම්භාව්‍ය වත්කම් හා වගකීම් සදහා වෙන්කිරීම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස, වර්තමානයේ විශ්වාසනීයව මැනිය හැකි නීතිමය හෝ සාධාරණීයකරණය කළ හැකි වගකීමක් පවතී නම් හා එම වගකීම පියවීම සදහා ආර්ථික ප්‍රතිලාභ ගලායෑමක් නියත වශයෙන්ම සිදුවේ නම් පමණක් සංස්ථාව මගින් ප්‍රතිපාදන වෙන්කරනු ලබයි.

මුදලින් මැනිය හැකි සියලුම වගකීම් සඳහා ප්‍රතිපාදන සලසා ඇති අතර, අනෙකුත් වගකීම් හෙළිදරවු කර ඇත.

බගවන්තලාව චැපල්ටන් වාණිජ තුනී කිරීම් බිම් කට්ටියේ අනවසර හෙළීම් නිසා රජයට පාඩු සිදුවූ බවට දන්වන ලද අතර, පරීක්ෂණවලදී හෙළිදරව් වූ සමහර කරුණු හේතුවෙන් තවමත් නිශ්චිත නිගමනයකට එලඹිය නොහැකි බැවින් සංස්ථාවේ නිලධාරීන් සමග එක්ව එම කරුණ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතු බවට වනසංරක්ෂණ ජෙනරාල්තුමා තීරණය කොට ඇත.

වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය දැව සංස්ථාවට එරෙහිව දෙහිඅත්තකණ්ඩිය මහේස්ත්‍රාත් උසාවියට රඹකැන්ඔය ජලාශයට යටවන භූමියේ දැව ඉවත් කිරීමේ දී සිදුවූ අක්‍රමිකතා හේතු කොට ගෙන ණීබී□ වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. මේ වනතෙක් නීතිපති දෙපාර්තමේන්තුව විසින් නඩුවක් ගොනුකර නොමැත. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව



හා රාජ්‍ය දැව සංස්ථාව එකම අමාත්‍යංශයක් යටතේ පරිපාලනය වන බැවින් ආයතන දෙක අතර එකඟතාවයකට පැමිණ මෙම තත්වය පිළිබඳ ස්ථිර තීරණයකට එළඹීම සඳහා නීතිපතිගේ උපදෙස් ඉල්ලන ලදී.

2006 සිට 2012 කාල සීමාව තුළ රාජ්‍ය දැව සංස්ථාව විසින් සේවක අර්ථසාධක අරමුදලෙහි හා සේවක භාරකාර අරමුදලෙහි දායකත්වය ගණනය කිරීමේදී ජීවන වියදම් නොසලකා ඇති බව දක්වමින් කම්කරු දෙපාර්තමේන්තුව විසින් සංස්ථාවට එරෙහිව චෝදනා ගොනුකර ඇත. මෙම තත්වය තුල සංස්ථාව විසින් 15% ක සේව්‍යාගේ දායකත්වය හා ඊට අදාල දඩ මුදල් ද, කම්කරු දෙපාර්තමේන්තුව වෙත යවා ඇති අතර, 10% සේවකයාගේ දායකත්වය සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුව හා රාජ්‍ය දැව සංස්ථාව සාකච්ඡා කරමින් සිටින අතර, තවමත් අවසාන තිරණයකට එළඹ නැත.

ලංකා බැංකු ස්ථාවර තැන්පතු ගිණුම් අංක :77777554, 77902580, 79747063 එරෙහිව බැංකු ඇපකරයන් නිකුත් කර ඇත.

වැඩ තහනම් කළ නිලධාරියෙකු සම්බන්ධයෙන් ගොනු කළ පැමිණිල්ලකට අදාලව කම්කරු කොමසාරිස්ගේ ඉල්ලීම පරිදි රු.1,957,174/- ක මුදලක් හිඟ වැටුප් ලෙස ගෙවන ලෙස කරන ලද ඉල්ලීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කොට රාජ්‍ය දැව සංස්ථාව විසින් කම්කරු උසාවියේ නැවත නඩුවක් ගොනුකර ඇත.

## 1.3.3 ආදායම් හඳුනාගැනීම

අයභාරය හඳුනාගනු ලබන්නේ එමඟින් වෙත ආර්ථික ප්‍රතිලාභ ලැබිය හැකි හා එය විශ්වාසදායී ලෙස මැනිය හැකිවිටදීයි. දැව විකිණීමෙන් ලද ආදායම ගණනය කර ඇත්තේ දැව විකිණීමෙන් ලැබුණු හෝ ලැබිය යුතු මුදල, වෙළඳ වට්ටම් සහ ප්‍රමාණ සඳහා දෙනුලබන සහන ආදිය සැලකිල්ලට යොමුකිරීමෙන් සාධාරණ වටිනාකම් පදනමටය. රාජ්‍ය දැව සංස්ථාවේ සහ වනසංරක්ෂ දෙපාර්තමේන්තුවේ සේවකයින් හට 25% ක සහනදායී මිලක් යටතේ දැව නිකුත් කරන අතර, එම වියදම් සුභසාධක පහසුකම් වැය ශීර්ෂය යටතේ ගිණුම්ගත කර ඇත.

### 1.3.3.1 විකුණුම් ආදායම

භාණ්ඩ විකුණුම් ආදායම ලෙස පිළිගනු ලබන්නේ එම භාණ්ඩවල හිමිකාරිත්වය, අවදානම් සහ ප්‍රතිලාභ භාණ්ඩ මිලදීගත් තැනැත්තා වෙත පැවරුණු අවස්ථාවේදීය. එනම්, භාණ්ඩ බෙදාහැරීමෙන් පසුව විකුණුම් ආදායමක් ලෙස සලකනු ලැබේ.

### 1.3.3.2 බදු ආදායම

උපචිත පදනම යටතේ බදු ආදායම ගණනය කෙරේ.

## 1.3.4 වියදම් හඳුනාගැනීම

වර්ෂය තුළ ලබා ඇති ලාභය ගණන් බැලීමේදී වසර තුළ ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා දරන ලද සියලුම වියදම් ආදායමෙන් අඩුකර ඇත. අළුත්වැඩියා සහ නවීකරණයට අදාල වියදම් එය දැරූ වර්ෂයේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයට හරකර ඇත.

### 1.3.4.1 ආදායම් බදු

ප්‍රවර්තන හා විලම්භිත බදු වලින් ආදායම් බදු සමන්විත වේ. ස්කන්ධයෙන් හෝ වෙනත් විස්තීරණ ආදායම් තුලින් සෘජුව හඳුනාගන්නා අයිතම වලට අදාල ප්‍රමාණය හැර ප්‍රවර්තන හා විලම්භිත බදු වියදම් විස්තීරණ ආදායම් ප්‍රකාශනය මගින් හඳුනාගනී.

වාර්තා කරන දිනට බලපවත්වන බදු අනුපාත හා පූර්ව වාර්ෂය වෙනුවෙන් කරන ලද වෙන්කිරීම් උපයෝගී කරගෙන, වර්ෂයේ බදු ආදායම හෝ අලාභය මත ගෙවිය යුතු හෝ ලැබිය යුතු අපේක්ෂිත බදු මුදල ප්‍රවර්තන බදු ලෙස හඳුනා ගනී.

ආදායම් බද්ද අනුපාතය 28% වන අතර, කල්පිත ලාභාංශ බදු අනුපාතය 25% කි.

මූල්‍ය වාර්තාකරණය සඳහා වත්කම් හා වගකීම්වල ඉදිරියට ගෙන ආ ශේෂය සහ බදු මුදල අතර තාවකාලික වෙනස ලබාගැනීම සඳහා වගකීම් ක්‍රමය භාවිතය මගින් විලම්භිත බදු මුදල ගණනය කෙරේ. මූල්‍ය තත්වය ප්‍රකාශන දිනට බලපවත්වන බදු අනුපාත භාවිතයෙන් වත්කම් හා වගකීම්වල ඉදිරියට ගෙන ආ නිරවුල් කළ යුතු ශේෂය හෝ අපේක්ෂිත උපලබ්ධි මදුල මත පදනම්ව විලම්භිත බදු මුදල ගණනය කෙරේ.

අනාගත වත්කම්වල පරිභෝජනයට ගතහැකි අගයට එරෙහිව අනාගතයේ දී බදු ලාභයක් ලැබීමේ සම්භාවිතාවයක් පවතී නම් එම ප්‍රමාණයට පමණක් විලම්භිත බදු වත්කම හඳුනාග ෑනේ. වත්කමට අදාල බදු ප්‍රතිලාභය තවදුරටත් ලබාගත නොහැක්කේ නම් එම ප්‍රමාණයට විලම්භිත බදු වත්කම පහත හෙලනු ලැබේ.

**1.3.4.2 ස්කන්ධභාග ගෙවීම**

2017 වසර සඳහා ස්කන්ධභාගය ගණනය කර ඇත්තේ හෙලා ඇති දැව පරිමාව අනුවය.

**1.3.4.3 පිරිවැය වෙන් කිරීම**

දැව හුවමාරු අගය මත දැව පිරිවැය හා දැව ඉරුම්හල්වල පරිවර්තන පිරිවැය බෙදාවෙන් කරනු ලබන අතර, අදාල ඒකකය වෙත ප්‍රවාහනය කිරීමේ කුලී අගය මත යාන්ත්‍රික වැඩපොලේ පිරිවැය වෙන්කරනු ලබයි.

**1.3.5 මූල්‍ය තත්ව ප්‍රකාශන දිනට පසුව සිදුවීම්**

මූල්‍ය තත්ව ප්‍රකාශනය සකස් කළ දිනයට පසුව පැනනැගී සියලු සැලකිය යුතු සිද්ධීන් සැලකිල්ලට ගෙන, මූල්‍ය ප්‍රකාශවල අදාල සටහන් යටතේ නිසි ගැලපීම් හෝ අනාවරණය කිරීම් සිදුකර ඇත.

**1.3.6 සේවක ණය චක්‍රීය අරමුදල**

මෙම අරමුදල නිර්මාණය කොට ඇත්තේ සංස්ථාවේ සේවකයන්ට ණය ලබාදීමේ අරමුණිනි. සේවක ණයපොලී ආදායම වෙනත් ආදායම් යටතේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයෙහි දක්වා, ආදායම් බදු අඩුකිරීමෙන් පසු ශුද්ධ පොලී ආදායම සේවක ණය චක්‍රීය අරමුදලට මාරු කරනු ලැබේ. මෙමගින් සේවක ණය චක්‍රීය අරමුදල ගොඩනැංවෙන අතර, එමගින් ණය ලබාදීම අරමුදලේ ඇති මුදල් ප්‍රමාණයට සීමාවේ.

**1.3.7 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඍජු ක්‍රමයට අනුව පිළියෙල කර ඇත. මුදල් සහ මුදල් වලට සමාන වත්කම්වලට වටිනාකම වෙනස්වීමේ අවධානමට යටත්ව ඉක්මණින් මුදල් වලට මාරුකර ගතහැකි ඉහළ ද්‍රවශීලීතාවයක් ඇති කෙටිකාලීන ආයෝජන ඇතුලත් වේ. මුදල් සහ මුදල් සමාන වත්කම් වලට අතැති මුදල්, බැංකු ශේෂ සහ බැංකුවල ඇති කෙටිකාලීන තැන්පතු ඇතුළත් වේ.

**ගිණුම් සඳහා සටහන්**

| 02. පිරිවැටුම | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|
| කඳන් - රජයේ ඉඩම් වලින් ලද | 2,775,603,532 | 2,560,718,285 |
| කඳන් - පුද්ගලික ඉඩම් වලින් ලද | 33,237,974 | 85,657,810 |
| ඉරුදැව | 207,698,281 | 196,750,255 |
| ඉරුදැව - ආනයනය කරන ලද | 48,620,691 | 26,226,922 |
| සිල්පර - පුද්ගලික ඉඩම් වලින් ලද | 91,685,336 | 136,725,089 |
| සිල්පර - රජයේ ඉඩම් වලින් ලද | 41,654,406 | 150,758,501 |
| සිල්පර - අපනයන | 1,138,372 | 3,871,012 |
| විදුලිකණු - රජයේ ඉඩම් වලින් ලද | 136,382,640 | 258,375,810 |
| විදුලිකණු - පුද්ගලික ඉඩම් වලින් ලද | 36,313,002 | 67,386,081 |
| අලි වැට කණු | 75,465,961 | 124,695,886 |
| වෙනත් | 19,181,410 | 27,611,426 |
| වන අපරාධ දැව | 78,284,437 | 60,472,984 |
| රජයේ ඉඩම්වල පරිත්‍යාග දැව | 405,112,249 | 294,699,866 |
| ගෘහභාණ්ඩ | 389,044,488 | 304,814,376 |
| **දළ පිරිවැටුම** | **4,339,422,777** | **4,298,764,303** |
| ජාතිය ගොඩනැගීමේ බදු | (85,648,511) | (84,808,619) |
| **ශුද්ධ පිරිවැටුම** | **4,253,774,266** | **4,213,955,684** |

| 03. විකුණුම් පිරිවැය | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|
| දැව ගබඩා හා මංසල ගබඩා | 1,205,030,916 | 971,728,339 |
| දැව පරිරක්ෂණාගාර | 347,215,178 | 593,694,002 |
| ගෘහභාණ්ඩ යන්ත්‍රාගාර | 268,939,817 | 235,284,197 |
| මංසල විකුණුම් | 356,638,294 | 368,158,873 |
| **එකතුව** | **2,177,824,205** | **2,168,865,411** |

| 04. විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|
| දැව ගබඩා | 616,166,666 | 675,189,054 |
| දැව පරිරක්ෂණාගාර | 13,434,188 | 35,492,820 |
| ගෘහභාණ්ඩ යන්ත්‍රාගාර | 40,567,396 | 42,387,655 |
| ප්‍රාදේශීය කාර්යාල හා ප්‍රධාන කාර්යාලය | 10,449,520 | 12,954,305 |
| **එකතුව** | **680,617,770** | **766,023,834** |

| 05. පරිපාලන වියදම් | 2017 රු. | 2016 රු. |
|---|---|---|
| දැව පරිරක්ෂණාගාර | 20,425,440 | 20,188,525 |
| ගෘහභාණ්ඩ යන්ත්‍රාගාරය | 71,971,576 | 71,496,095 |
| ප්‍රාදේශීය කාර්යාල හා ප්‍රධාන කාර්යාලය | 706,407,258 | 828,343,591 |
| සංචාරක බංගලා | 6,667,018 | 7,588,299 |
| **එකතුව** | **805,471,293** | **927,616,510** |

| 06. වෙනත් ආදායම් | 2017 රු. | 2016 රු. |
|---|---|---|
| **6.1 මෙහෙයුම් නොවන ආදායම් 6.1** | | |
| පොළී ආදායම - ආයෝජන | 246,148,133 | 187,857,600 |
| විදේශ විනිමය හුවමාරු ලාභ/(අලාභ) | 4,091 | 7,356 |
| ගොඩනැගිලි කුලිය | 13,060,102 | 15,493,131 |
| සේවක ණය පොළිය | 14,567,524 | 13,080,754 |
| | **273,779,849** | **216,438,841** |
| **6.2 මෙහෙයුම් ආදායම් 6.2** | | |
| විවිධ ආදායම් | 62,725,858 | 49,507,982 |
| දඩ - කොන්ත්‍රාත්කරුවන්ගේ සහ සැපයුම්කරුවන්ගේ | 800,692 | 759,032 |
| වත්කම් විකිණීමෙන් ලද ආදායම | 3,015,776 | 19,195,783 |
| තොග හානි සඳහා අධි වෙන්කිරීම් | 14,410,259 | 17,258,585 |
| අඩමාන ණය අධි වෙන්කිරීම් | 18,442,082 | 1,636,568 |
| ඌණතා සහ පාඩු සඳහා අයකිරීම් | 1,159,228 | 2,086,333 |
| ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පත් | 2,609,617 | 1,399,181 |
| | **103,163,513** | **91,843,464** |
| **එකතුව** | **376,943,362** | **308,282,305** |



### 6.3 වෙනත් ආදායම් විශ්ලේෂණය 2017

| ආදායම් මූලාශ්‍ර | ඒකක | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|
| | අලෙවි ශාඛා | දැව පදම් කිරීමේ ඒකක | ගෘහභාණ්ඩ නිෂ්පාදන ඒකක | ප්‍රාදේශීය කාර්යාල හා ප්‍රධාන කාර්යාලය | සංචාරක බංගලා | |
| **මෙහෙයුම් නොවන ආදායම් 6.1** | | | | | | |
| පොළී ආදායම - ආයෝජන | - | - | - | 246,148,133 | - | 246,148,133 |
| විදේශ විනිමය හුවමාරු ලාභ/(අලාභ) | - | - | - | 4,091 | - | 4,091 |
| ගොඩනැගිලි කුලිය | - | - | 44,000 | 13,016,102 | - | 13,060,102 |
| පාරිතෝෂික අධි වෙන්කිරීම් | - | - | - | - | - | - |
| සේවක ණය පොළිය | - | - | - | 14,567,524 | - | 14,567,524 |
| | - | - | **44,000** | **273,735,849** | - | **273,779,849** |
| **මෙහෙයුම් ආදායම් 6.2** | | | | | | |
| විවිධ ආදායම් | 5,138,851 | - | 963 | 56,539,498 | 1,046,545 | 62,725,858 |
| දඩ - කොන්ත්‍රාත්කරුවන්ගේ සහ සැපයුම්කරුවන්ගේ | - | - | - | 800,692 | - | 800,692 |
| වත්කම් විකිණීමෙන් ලද ආදායම | - | - | - | 3,015,776 | - | 3,015,776 |
| තොග හානි සඳහා අධි වෙන්කිරීම් | 14,328,635 | - | 81,624 | - | - | 14,410,259 |
| අඩමාන ණය අධි වෙන්කිරීම් | 3,496,589 | 14,945,494 | - | - | - | 18,442,082 |
| ඌණතා සහ පාඩු සඳහා අයකිරීම් | - | - | - | 1,159,228 | - | 1,159,228 |
| ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පත් | - | - | - | 2,609,617 | - | 2,609,617 |
| | **22,964,075** | **14,945,494** | **82,587** | **64,124,812** | **1,046,545** | **103,163,513** |
| **එකතුව** | **22,964,075** | **14,945,494** | **126,587** | **337,860,661** | **1,046,545** | **376,943,362** |

## 07 ආදායම් බදු

| | 2017 රු. | 2016 රු. |
|---|---:|---:|
| **ප්‍රවර්තන බදු වියදම්** | | |
| ප්‍රවර්තන වර්ෂය සඳහා ආදායම් බදු සටහන 7.1 | 390,212,803 | 247,475,962 |
| පෙර වර්ෂය සඳහා අධි/ඌණ වෙන්කිරීම් | (314) | 160,763,556 |
| | **390,212,489** | **408,239,518** |
| **විලම්භිත බදු වියදම්** | | |
| තාවකාලික වෙනස්වීම්වල ප්‍රවර්ථනය හා මූලාරම්භය සටහන 7.2 | (89,149,683) | (10,186,245) |
| | **(89,149,683)** | **(10,186,245)** |
| **වර්ෂය සඳහා බදු අයකිරීම්** | **301,062,806** | **398,053,273** |

### 7.1 ප්‍රවර්තන වර්ෂයේ ලාභය සඳහා ආදායම් බදු

| | 2017 රු. | 2016 රු. |
|---|---:|---:|
| බදු පෙර ලාභය | 866,804,360 | 484,732,234 |
| සමාහාර ඉඩනොදෙන වියදම් | 208,624,269 | 334,625,242 |
| සමාහාර ඉඩදෙන වියදම් | (522,958,134) | (434,394,181) |
| ව්‍යාපාරික ලාභය | 552,470,495 | 384,963,295 |
| ව්‍යාපාරික නොවන ආදායම් | 273,775,759 | 216,431,485 |
| බදු අයකල හැකි ආදායම් | 826,246,253 | 601,394,780 |
| ආදායම් බද්දෙන් 28% | 231,348,951 | 168,390,538 |
| බෙදාහැරිය හැකි ලාභය මත ලාභාංශ බදු | 158,863,852 | 79,085,424 |
| **එකතුව** | **390,212,803** | **247,475,962** |

### 7.2 විලම්භිත බදු

| | තාවකාලික වෙනස | බදු බලපෑම (වත්කම්/වගකීම්) |
|---|---:|---:|
| | රු. | රු. |
| 2017 ජනවාරි 01 වන දිනට ශේෂය | (26,767,212) | (7,494,819) |
| වසර තුල උත්පාදනය වූ මුදල | (318,391,726) | (89,149,683) |
| 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය | **(345,158,938)** | **(96,644,503)** |
| දේපළ, පිරියත හා උපකරණවල තාවකාලික වෙනස | 443,191,688 | 124,093,673 |
| විශ්‍රාම පාරිතෝෂික අරමුදලේ තාවකාලික වෙනස | 788,350,626 | 220,738,175 |
| ඉදිරියට ගෙන ආ බදු අලාභය | - | - |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **345,158,938** | **96,644,503** |



## 08. දේපළ, පිරියත හා උපකරණ

| විස්තරය | පිරිවැය | | | | ක්ෂය | | | | 2017.12.31 දිනට ඉදිරියට ගෙන එන ලද වටිනාකම | 2016.12.31 දිනට ඉදිරියට ගෙන එන ලද වටිනාකම |
|---|---:|---:|---:|---:|---:|---:|---:|---:|---:|---:|
| | 2017.01.01 දිනට ශේෂය | එකතු කිරීම් | ඉවත් කිරීම් | 2017.12.31 දිනට ශේෂය | 2017.01.01 දිනට ශේෂය | ඉවත් කිරීම් | වසර සඳහා අයකිරීම් | 2017.12.31 දිනට ශේෂය | | |
| ඉඩම් | 59,057,146 | - | - | 59,057,146 | - | - | - | - | 59,057,146 | 59,057,146 |
| ඉඩම් සංවර්ධනය | 26,324,125 | 12,672,823 | - | 38,996,948 | 14,833,136 | - | 2,516,993 | 17,350,129 | 21,646,819 | 11,490,989 |
| ගොඩනැගිලි | 783,651,009 | 15,939,525 | 789,592 | 798,800,942 | 183,333,754 | 789,527 | 17,617,097 | 200,161,324 | 598,639,618 | 600,317,255 |
| දැව අට්ටිමඩු හා වෙනත් ගොඩනැගිලි | 32,943,518 | 48,690 | - | 32,992,208 | 18,948,258 | - | 4,530,468 | 23,478,726 | 9,513,482 | 13,995,260 |
| මාර්ග හා දුම්රිය මාර්ග | 18,421,732 | - | - | 18,421,732 | 7,358,581 | - | 781,959 | 8,140,540 | 10,281,191 | 11,063,150 |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 678,400,318 | 23,212,257 | 4,974,359 | 696,638,216 | 520,295,149 | 3,583,549 | 31,730,680 | 548,442,280 | 148,195,935 | 158,105,168 |
| බදු අයිති ඉඩම් හා ගොඩනැගිලි | 148,311 | - | - | 148,311 | 148,311 | - | - | 148,311 | - | - |
| මාර්ග ඉදිකිරීම් යන්ත්‍ර හා උපකරණ | 60,450 | - | - | 60,450 | 60,450 | - | - | 60,450 | - | - |
| මෙවලම් හා උපකරණ | 6,014,975 | 54,450 | - | 6,069,425 | 5,381,744 | - | 261,123 | 5,642,867 | 426,557 | 633,230 |
| විදුලි උපකරණ | 19,040,584 | 1,873,864 | 596,109 | 20,318,339 | 10,632,012 | 587,441 | 1,373,833 | 11,418,404 | 8,899,936 | 8,408,573 |
| වාහන | 589,013,019 | 28,909,740 | 3,577,176 | 614,345,583 | 488,698,215 | 3,577,051 | 45,343,181 | 530,464,345 | 83,881,238 | 100,314,804 |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 46,223,563 | 3,917,666 | 17,903 | 50,123,326 | 30,305,941 | 17,355 | 4,821,508 | 35,110,094 | 15,013,232 | 15,917,622 |
| කාර්යාලීය උපකරණ | 34,665,396 | 1,299,838 | 772,176 | 35,193,058 | 28,807,692 | 772,131 | 1,857,256 | 29,892,817 | 5,300,241 | 5,857,704 |
| පරිගණක හා උපාංග | 68,488,923 | 4,021,114 | 4,740,706 | 67,769,331 | 52,113,648 | 4,740,321 | 6,322,806 | 53,696,133 | 14,073,198 | 16,375,275 |
| විවිධ වත්කම් | 28,113,590 | 1,707,094 | 34,800 | 29,785,884 | 21,331,225 | 34,800 | 2,900,519 | 24,196,944 | 5,588,940 | 6,782,365 |
| පෙර නිමවුම් ව්‍යුහ | 4,938,333 | - | - | 4,938,333 | 4,938,333 | - | - | 4,938,333 | - | - |
| බදු අයිති ඉඩම් - රත්නපුර | 680,300 | - | - | 680,300 | 680,300 | - | - | 680,300 | - | - |
| **එකතුව** | **2,396,185,292** | **93,657,061** | **15,502,821** | **2,474,339,532** | **1,387,866,749** | **14,102,175** | **120,057,423** | **1,493,821,997** | **980,517,535** | **1,008,318,543** |

*වාර්තා කරන දිනය වන විට පිරිවැය රු.1,067,455,747/-ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල, පිරියත හා උපකරණ ප්‍රමාණයක් සංස්ථාව සතුවේ.

## 09. අස්පෘශ්‍ය වත්කම්

| විස්තරය | පිරිවැය | | | | ක්ෂය | | | | 2017.12.31 දිනට ඉදිරියට ගෙන එන ලද වටිනාකම | 2016.12.31 දිනට ඉදිරියට ගෙන එන ලද වටිනාකම |
|---|---:|---:|---:|---:|---:|---:|---:|---:|---:|---:|
| | 2017.01.01 දිනට ශේෂය | එකතු කිරීම් | ඉවත් කිරීම් | 2017.12.31 දිනට ශේෂය | 2017.01.01 දිනට ශේෂය | ඉවත් කිරීම් | වසර සඳහා අයකිරීම් | 2017.12.31 දිනට ශේෂය | | |
| පරිගණක මෘදුකාංග | 4,209,432 | 980,411 | - | 5,189,843 | 2,851,757 | - | 894,213 | 3,745,970 | 1,443,873 | 1,357,674 |
| **එකතුව** | **4,209,432** | **980,411** | **-** | **5,189,843** | **2,851,757** | **-** | **894,213** | **3,745,970** | **1,443,873** | **1,357,674** |

| 10. ජීව විද්‍යාත්මක වත්කම් | 2017 රු. | 2016 රු. |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | | |
| වර්ෂය ආරම්භක ශේෂය | 6,042,270 | 5,317,379 |
| නැවත වගා කිරීම් හෝ සංවර්ධනය සඳහා දරන ලද වියදම් | 534,746 | 724,891 |
| **වර්ෂය අවසානයේ ශේෂය** | **6,577,016** | **6,042,270** |

අපගේ ගණනය කිරීම් වලට අනුව තේක්ක ගසක් පරිනතවීමට රෝපණය කළ දින සිට අවුරුදු 35ක කාලයක් ගතවන බවත්, එම ගසේ විද්‍යාත්මක පරිණාමය සිදුවීමට අවුරුදු 10ක කාලයක් ගතවන බව සඳහන් කළ හැකිය. ජීව විද්‍යාත්මක පරිණාමය සිදුවන කාලය අතරතුර දැරීමට සිදුවන පිරිවැයත්, එහි සාධාරණ අගයත්, එම කාල පරිච්ඡේදය තුල සමාන බව උපකල්පනය කර ඇත. රාජ්‍ය දැව සංස්ථාවට අයත් තේක්ක වගාවන් තවම අවුරුදු 4ක අපරිණත වගාවන් කාණ්ඩයට අයත්වේ. එම වගාවන් පරිණත බවට පත්වන විට ඒ සඳහා දැරිය යුතු ආයෝජන පිරිවැයක් වෙතොත් එම අගය ද ඇතුළුව මුළු අගය අපරිණත ගිණුම් වලින් පරිණත ගිණුම් තුලට මාරුකරනු ලැබේ.

පුලියන්කුලම, මැදවච්චිය, සෙවනපිටිය, හා විනීතගම යන ස්ථානවල සංස්ථාව සතු තේක්ක වගාවක් පවත්වාගෙන යනු ලබයි.

| 11. ආයෝජන | 2017 රු. | 2016 රු. |
|---|---|---|
| **11.1 ආයෝජන - දිගු කාලීන** | | |
| දෙසැම්බර් 31 දිනට | | |
| **ස්ථාවර තැන්පතුවල ආයෝජන** | | |
| රාජ්‍ය ආයතනවල තාවකාලික අරමුදල් ගිණුම | 431,403,535 | 405,727,407 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 173,287,242 | 159,766,196 |
| | **604,690,777** | **565,493,603** |
| **කොටස්වල ආයෝජන** | | |
| ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩලය | 500,000 | 500,000 |
| සී/ස. ලංකා ටිම්බර් ප්ලාන්ටේෂන් සමාගම | - | 30,000,000 |
| (-) ආයෝජන අපහායනය | - | (30,000,000) |
| | **500,000** | **500,000** |
| **එකතුව** | **605,190,777** | **565,993,603** |

| 11.2 ආයෝජන - කෙටි කාලීන | 2017 රු. | 2016 රු. |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | | |
| **ස්ථාවර තැන්පතුවල ආයෝජන** | | |
| මහජන බැංකුව | 367,323,062 | 449,551,554 |
| ලංකා බැංකුව | 1,327,057,585 | 610,801,627 |
| **එකතුව** | **1,694,380,646** | **1,060,353,181** |



| 12. තොග | 2017 රු. | 2016 රු. |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | | |
| වෙළඳ බඩු තොගය | 1,527,107,769 | 1,293,964,826 |
| තොග හානිවීම් සඳහා වෙන්කිරීම් | (198,077,293) | (168,503,904) |
| | **1,329,030,475** | **1,125,460,922** |
| මාර්ගස්ථ තොග | - | 3,985,398 |
| කෙරීගෙන යනවැඩ | 32,421,998 | 40,692,396 |
| ගබඩා ද්‍රව්‍ය සහ අමතර කොටස් | 83,836,328 | 96,933,841 |
| පරිරක්ෂණය කිරීමේ ද්‍රව්‍ය | 52,575,012 | 68,263,473 |
| ඉන්ධන හා තෙල් | 2,985,371 | 3,413,001 |
| ලිපිද්‍රව්‍ය | 12,298,381 | 14,253,913 |
| **එකතුව** | **1,513,147,565** | **1,353,002,944** |

| 12.1 තොග විශ්ලේෂණය | 2017 රු. | 2016 රු. |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | | |
| රජයේ ඉඩම් වලින් ලද කඳන් | 937,127,446 | 789,182,275 |
| රජයේ ඉඩම් වලින් ලද ඉරුදැව | 243,774,881 | 214,442,149 |
| ආනයනික ඉරූ දැව | 44,138,449 | 50,597,751 |
| පුද්ගලික ඉඩම් වලින් ලද කඳන් | 389,594 | 3,819,453 |
| රජයේ ඉඩම් වලින් ලද සිල්පර | 5,076,610 | 1,023,882 |
| පුද්ගලික ඉඩම් වලින් ලද සිල්පර | 8,701,121 | 6,596,657 |
| රජයේ ඉඩම් වලින් ලද විදුලිකණු | 27,271,525 | 33,662,444 |
| පුද්ගලික ඉඩම් වලින් ලද විදුලිකණු | 25,498,931 | 6,878,655 |
| වෙනත් | 28,536,736 | 17,156,101 |
| ගෘහභාණ්ඩ | 206,592,475 | 170,605,459 |
| **එකතුව** | **1,527,107,769** | **1,293,964,826** |

| 13. වෙළඳ හා වෙනත් ණයගැතියෝ | | 2017 රු. | 2016 රු. |
|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | | | |
| වෙළඳ ණයගැතියෝ | | 514,979,365 | 755,058,341 |
| අඩමාන ණය වෙන්කිරීම් | | (80,400,519) | (88,143,065) |
| | | **434,578,846** | **666,915,276** |
| කාර්යාල මණ්ඩල ණයගැතියෝ | 13.2 | 217,112,609 | 175,566,909 |
| වෙනත් ණයගැතියෝ | 13.1 | 46,917,602 | 25,711,445 |
| **තැන්පත් සහ පූර්ව ගෙවීම්** | | | |
| දේශීය මිලදීගැනීම් අත්තිකාරම් | | 19,331,296 | 13,980,491 |
| පූර්ව ගෙවීම් අත්තිකාරම් | | 4,268,634 | 6,351,577 |
| දැව සැපයීම් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවූ අත්තිකාරම් | | 13,628,480 | 7,392,962 |
| තැන්පත් සඳහා ලැබිය යුතු පොළී | | 95,438,716 | 50,623,762 |

| | | |
|---|---|---|
| ආපසු හරවා යැවූ චෙක්පත් | 1,385 | 47,824 |
| කතරගම අෂ්ඨපල අරමුදල | 900,000 | 935,000 |
| උසාවි තැන්පත් | 8,778,248 | 8,778,248 |
| මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශය | 1,661,488 | 2,816,411 |
| වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව | 25,785,621 | 20,202,147 |
| වරාය අධිකාරිය | - | 563,698 |
| **එකතුව** | **868,402,923** | **979,885,750** |

| 13.1 වෙනත් ණයගැතියෝ | 2017 රු. | 2016 රු. |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | | |
| | | |
| පොදු තැන්පත් | 28,627,258 | 10,338,537 |
| පොදු තැන්පත් සඳහා වෙන්කිරීම් | 18,656,963 | 15,739,528 |
| ටෙන්ඩර් තැන්පතු | (366,620) | (366,620) |
| **එකතුව** | **46,917,602** | **25,711,445** |

| 13.2 කාර්ය මණ්ඩල ණයගැතියෝ | 2017 රු. | 2016 රු. |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට ශේෂය | | |
| | | |
| **කාර්ය මණ්ඩල ණය** | | |
| වාහන ණය | 6,761,200 | 2,757,477 |
| ආපදා ණය | 164,575,656 | 139,641,490 |
| විදුලි උපකරණ ණය | 32,765 | 33,078 |
| යතුරුපැදි ණය | 1,121,884 | 577,680 |
| ලැප්ටොප් පරිගණක ණය | 21,922,972 | 26,474,658 |
| ගෘහභාණ්ඩ ණය | 947,924 | 1,223,870 |
| | **195,362,402** | **170,708,253** |
| **අත්තිකාරම් හා වෙනත් ණය** | | |
| වැටුප් හා වේතන අත්තිකාරම් | 2000 | 12,000 |
| විශේෂ වැටුප් අත්තිකාරම් | 13,594,971 | - |
| ගමන් වියදම් අත්තිකාරම් | 15,827 | 17,950 |
| උත්සව අත්තිකාරම් | 3,876,495 | 3,891,100 |
| අභ්‍යන්තර හරපත් | 73,285 | 405,506 |
| සේවක අයකිරීම් | 452,226 | 478,942 |
| රෙදිපිළි ණය | 3,735,403 | 53,158 |
| | **21,750,207** | **4,858,656** |
| **එකතුව** | **217,112,609** | **175,566,909** |

| 14. මුදල් හා බැංකු ශේෂය | 2017 රු. | 2016 රු. |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | | |
| | | |
| අතැති මුදල් | 1,055,500 | 999,500 |
| මාර්ගස්ථ මුදල් | 24,791,076 | 21,803,106 |
| ලංකා බැංකුව - ජංගම ගිණුම | 47,421,508 | 161,613,910 |
| ලංකා බැංකුව - කාලීන තැන්පත් | 273,905,930 | 74,527,443 |
| **එකතුව** | **347,174,014** | **258,943,959** |

| 15. දායක ප්‍රාග්ධනය | 2017 රු. | 2016 රු. |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | | |
| | | |
| ශ්‍රී ලංකා රජයේ අරමුදල | 25,584,808 | 25,584,808 |
| වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පවරා ගත් වත්කම් | 10,714,815 | 10,714,815 |
| ලෝක බැංකු ආධාර | 708,202 | 708,202 |
| කැනේඩියානු හා බ්‍රිතාන්‍ය ආධාර | 4,495,843 | 4,495,843 |
| **එකතුව** | **41,503,668** | **41,503,668** |

| 16. සේවක ණය චක්‍රීය අරමුදල | 2017 රු. | 2016 රු. |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | | |
| | | |
| වසර ආරම්භක ශේෂය | 243,052,926 | 236,650,441 |
| සේවක ණය පොළී ලැබීම් | 8,009,603 | 6,402,485 |
| මුදල් තැන්පත් කිරීම | 81,000,000 | |
| **වසර අවසාන මුළු ශේෂය** | **332,062,529** | **243,052,926** |
| | | |
| දෙසැම්බර් 31 දිනට ප්‍රයෝජනයට ගත් අරමුදලේ නාමික අගය | 261,517,246 | 223,163,229 |
| **දෙසැම්බර් 31 දිනට ප්‍රයෝජනයට නොගත් අරමුදල** | **70,545,283** | **19,889,697** |

| 17. විශ්‍රාම පාරිතෝෂිකය | 2017 රු. | 2016 රු. |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට ශේෂය | | |
| මුදල් තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති අගයන් පහතින් දැක්වේ. | | |
| | | |
| වසර ආරම්භක ශේෂය | 438,573,892 | 366,887,129 |
| වර්ෂය සඳහා ප්‍රතිපාදන | 41,973,758 | 20,134,412 |
| වසර සඳහා පොළිය | 39,364,743 | 35,979,362 |
| වර්ෂය තුල ඌණතාවය හෝ (අතිරික්තය) | 323,413,595 | 51,403,312 |
| වර්ෂය තුල ගෙවීම් | (54,975,364) | (35,830,323) |
| **වසර අවසාන ශේෂය** | **788,350,624** | **438,573,892** |

| | | |
|---|---|---|
| ආදායම් ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති අගයන් පහතින් දැක්වේ. | | |
| මෙම වසර සඳහා ප්‍රතිපාදන | 41,973,758 | 20,134,412 |
| වසර සඳහා පොළිය | 39,364,743 | 35,979,362 |
| **ආදායම් ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති අගය** | **81,338,501** | **56,113,773** |

විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගත් ප්‍රමාණයන් පහත පරිදි වේ

| | | |
|---|---|---|
| වර්ෂය සඳහා (අතිරික්තය) හෝ ඌණතාවය | 323,413,595 | 51,403,312 |
| **විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගත් ප්‍රමාණය** | **323,413,595** | **51,403,312** |

විශ්‍රාමික පාර්තෝෂික සදහා වන වගකීම් ගණනයේදී 1983 අංක 12 දරන විශ්‍රාමික පාර්තෝෂික පනතට අනුකූලව අඛණ්ඩව අවුරුදු 5කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයන් පාර්තෝෂික සදහා හිමිකම් ලබයි. 2017 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ විශ්‍රාමික පාර්තෝෂික සදහා වන වගකීම් ආයු ගණනය කිරීම යටතේ ඇගයීමට ලක්කරන ලදී. වාර්තා කරනු ලබන දිනට ප්‍රධාන උපකල්පන,

| | **31.12.2017** | **31.12.2016** |
|---|---|---|
| වට්ටම් අනුපාතය | 10.28% | 10.88% |
| අනාගත වැටුප් වැඩිවීමේ අනුපාතය | 13.12% | 6% |
| සේවක පිරිවැටුම් අනුපාතය | 5.72% | 4.03% |
| විශ්‍රාම ගැන්වීමේ වයස | 60 | 60 |

| **18. බදුකරණය** | **2017 රු.** | **2016 රු.** |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට ශේෂය | | |
| ගෙවිය යුතු ආදායම් බදු වසර ආරම්භක ශේෂය | 132,894,534 | 291,486,919 |
| තැන්පතු මත රඳවාගැනීමේ බදු | (15,948,065) | (10,976,262) |
| ආර්ථික සේවා ගාස්තු | (21,844,701) | (17,087,861) |
| වර්ෂය තුල ගෙවීම් | (217,089,232) | (538,767,780) |
| බදු සඳහා ඌණ වෙන්කිරීම් | (314) | 160,763,556 |
| වර්ෂය සඳහා වෙන්කිරීම් | 390,212,803 | 247,475,962 |
| **වසර අවසාන ශේෂය** | **268,225,025** | **132,894,534** |

| **19. ණයහිමියෝ සහ උපචිත වියදම්** | **2017 රු.** | **2016 රු.** |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | | |
| සේවක අර්ථසාධක අරමුදල | 18,067,553 | 15,277,705 |
| සේවක භාරකාර අරමුදල | 2,141,317 | 1,833,515 |
| උපචිත වියදම් | 130,272,172 | 167,949,943 |
| ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු | 11,590,240 | 5,005,368 |
| ඇප තැන්පත් - කාර්ය මණ්ඩලය හැර | 67,971,065 | 61,610,495 |
| ගෙවිය යුතු විගණන ගාස්තු | 1,823,228 | 3,107,828 |
| රඳවාගත් මුදල් | 29,738,097 | 20,884,478 |
| වෙනත් ණයහිමියෝ | 63,191,276 | 64,978,563 |
| වනසංරක්‍ෂණ දෙපාර්තමේන්තුව | 587,972,172 | 368,248,331 |
| ස්කන්ධභාගය - වනජීවී දෙපාර්තමේන්තුව | 2,614,486 | 810,697 |
| ස්කන්ධභාගය - කෘෂිකර්මාන්ත දෙපාර්තමේන්තුව | 722,648 | - |
| ජාතිය ගොඩනැගීමේ බදු | 7,184,941 | 7,959,651 |
| එකතුකල අගය මත බදු | 43,201,698 | 46,525,571 |
| **එකතුව** | **966,490,894** | **764,192,145** |

**20. ආශ්‍රිත පාර්ශවයන් සමග ගනුදෙනු**

* රාජ්‍ය දැව සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙකු හා වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වනසංරක්ෂණ අධ්‍යක්ෂ ජෙනරාල් විසින් සංස්ථාවට දැව හෙලීම සදහා වනවගා නිදහස් කිරීමේදී ජාතික ව කළමනාකරණ සැලැස්මට අනුව සිදුකරන අතර, වන සංරක්ෂණ දෙපාර්තමේන්තු විසින් රු.1,224,025,093/- ක් වටිනා ගස් වර්ෂය තුලදී සංස්ථාවට ලබාදී ඇත. මූල්‍ය ප්‍රකාශන දිනයට ආශ්‍රිත පාර්ශවයන් සමග ගනුදෙනු වල ශේෂයන් පහත පරිදි වේ.

* රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයට අයත් බිම් කොටසක් පරිසර හා මහවැලි සංවර්ධන අමාත්‍යංශයට සහ වනජීවී දෙපාර්තමේන්තුවට බදු දී ඇත. රාජ්‍ය දැව සංස්ථාව එම ආයතනයන් පාවිච්චි කරන ලද භූමි ප්‍රමාණයන් අනුව කුලී ආදායම් ගණනය කර ඇත.

| | **වර්ග අඩි ගණන** | **කුලී මුදල (රු)** |
|---|---|---|
| වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව | 22,040 | 550,000.00 |
| මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශය | 23,058 | 676,232.50 |

මූල්‍ය ප්‍රකාශන දිනයට ආශ්‍රිත පාර්ශවයන් සමග ගනුදෙනු වල ශේෂයන් පහත පරිදි වේ.

| | **2017 රු.** | **2016 රු.** |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | | |
| **ආශ්‍රිත පාර්ශවයන්ට ගෙවිය යුතු** | | |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 587,972,172 | 368,248,331 |
| | **587,972,172** | **368,248,331** |
| **ආශ්‍රිත පාර්ශවයන්ට ලැබිය යුතු** | | |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 25,785,621 | 20,202,147 |
| පරිසර හා මහවැලි සංවර්ධන අමාත්‍යංශය | 1,661,488 | 2,816,411 |
| | **27,447,108** | **23,018,558** |

# මූල්‍ය පාරිභාෂික ශබ්ද මාලාව

1. **ගිණුම් ප්‍රතිපත්ති**
මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී භාවිතා කරනු ලබන විශේෂ මූලධර්ම, පදනම්, සම්මත, නීතීන් සහ ක්‍රියාමාර්ග.

2. **ක්‍රමක්ෂය**
අස්පෘශ්‍ය වත්කම් එහි ඵලදායී ජීව කාලය තුල ක්‍රමවත් ලෙස බෙදා හැරීම.

3. **උපචිත වියදම්**
ආදායම් හා වියදම් ලැබීම් හෝ ගෙවීම් කාලපරිච්ඡේදයන් ගැන නොසලකා, එකිනෙක ගැලපීමේ මූලධර්මය.

4. **මුදල් හා මුදල් වලට සමාන වත්කම්**
මාස 3 ක් හෝ ඊට අඩු කාලයකින් කල්පිරෙන ද්‍රවශීලි ආයෝජන.

5. **ආදායම් සංචිත**
ආයෝජන සඳහා තබා ඇති සංචිත.

6. **අගය එකතු කිරීම්**
සංස්ථාව විසින් එහි ක්‍රියාකාරකම් මත උත්පාදනය කරන ලද ධන ප්‍රමාණය.

7. **ක්‍රියාකාරී දර්ශකය**
ජංගම වගකීම් වලින් ජංගම වත්කම් බෙදූ විට ලැබේ.


8. **ක්ෂය වීම්**
වත්කමක ක්ෂය කළ හැකි අගය එහි ඵලදායී ජීවකාලය තුල ක්‍රමවත්ව බෙදාහැරීම.

9. **තෝලනය**
යෙදවූ ප්‍රාග්ධනයට ණය ලබාගත් ප්‍රමාණය.

10. **සාධාරණ අගය**
දැනුමැති මනාප පාර්ශවයන් අතර අතේ දුරින් කරනු ලබන ගණුදෙනුවකදී වත්කමක් හුවමාරු කලහැකි අගය වේ.

11. **වත්කම් මත ඉපැයීම්**
ශුද්ධ ආදායම මුළු වත්කමෙහි ප්‍රතිශතයක් ලෙස දැක්වීමයි. මෙය ලාභය මැනීමේ හා සමාන වෙනත් ආයතනවල කාර්යසාධනය සැසඳීමේ මිනුමක් ලෙස භාවිතාවේ.

12. **විලම්භිත බදු**
වර්තමාන ගිණුම්කරණ ප්‍රතිපත්ති, බදු ප්‍රතිපත්ති වලින් වෙනස් වීම නිසා අනාගතයේදී ඇති විය හැකි වත්කම් හෝ වගකීම් වේ.



"අපේ වෘතාන්තය අදට වඩා හෙට දිගු ගමනක ආරම්භයයි."


**රාජ්‍ය දැව සංස්ථාව**

අංක. 82, සම්පත්පාය, රජමල්වත්ත පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

**දුරකථන** : +94 11 2866601 - 5 | **ෆැක්ස්** : +94 11 2866623 | **විද්‍යුත් තැපෑල** : stcfur@gmail.com | **වෙබ්** : www.timco.lk